පවුල් ප්‍රකාශ අංක 12

"මගේ ගම මාතර වේරහැර. නම ශ්‍රියානි ගුණවර්ධන. මගේ අම්මා මම පාසල් යන කාලෙදිම මිය ගියා. අම්මා මියදුනාට පස්සේ නංගියි මල්ලියි බලාගන්න ඕන නිසා මම පාසල් ගමන අත්හැරියා. ගෙදර නතර වෙලා නංගියි මල්ලියි බලා ගත්තා. මගේ තාත්තා මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවෙක්. මට සහ නංගිට මල්ලිට තාත්තා හරි ආදරයෙන් සැලකුවා. කිසිම අඩුපාඩුවක් දැනෙන්න තිබ්බෙ නැහැ. මම ඉඩකඩ ලැබුණ විදියට මාතර මහ රෝහලේ හෙදි පාඨමාලාවක් හැදෑරුවා. නමුත් ඒක දිගට කරන්න බැරිවුණා. ගෙදර කව්රුවත් නැති නිසා. තාත්ත හැම දෙයක්ම කරන නිසා ගෙදර අඩුපාඩුවක් මුදල් හිගයක් අපිට තිබුණේ නැහැ.

මගේ ඉගෙනීමත් හරියට කරන්න බැරිවුණ නිසා තාත්තට ඕනකම තිබුණා මගේ කසාදෙ හොඳට කරන්න. හොඳ තැනකින් දෙයක් කළොත් නංගිගෙයි මල්ලිගෙයි ආරක්‍ෂාවත් සැලසෙන බව තාත්තා විශ්වාස කළා. මේ හැම එතකක්ම තාත්ගේ ඔලුවෙ තිබුණා. ගාල්ලේ හබරාදුව මිපෙන් යෝජනාවක් ගෙන ආවා මගුල් කපුවෙක්. තාත්තා සිරිත් විරිත්වලට අනුව පොරොන්දම් බැලෙව්වා. හඳහන් හොඳට ගැලපුනා. වෙළඳම් කරන මුදලාලි කෙනෙක් කියල කපුවා කිව්වා. රජයේ රස්සාවකට වඩා වෙළඳම හොඳයි. උත්සාහය ඇත්නම් දියුණු වෙන්න පුළුවන් මාර්ගයක් වෙළඳම. ඒ තාත්තගේ අදහස. ඉන්න තැනක් තියෙනවා නම්, හඳහනත් ගැලපෙනවා නම්, රස්සාවත් හොඳ නම්, තවත් මොනවද බලන්නේ කියලා තාත්ත වැඩි විස්තර සොයා බැලීමක් නොකර විවාහය තීන්දු කරා. මිපෙ ප්‍රේමදාස තමයි ඒ මම විවාහ කරගත්තෙ. කසාද බැඳල මාව එක්කරගෙන ආවේ නෑ කෙනෙක්ගෙ ගෙදරට. තාත්තට පුළුවන් විදියට මට දෑවැද්දක් දුන්නා. නමුත් කසාද බැඳලා ආ දවසෙම මට මේ ගෙදර එපා වුනා. ප්‍රේමදාසට ගෙයක් දොරක් ඇත්තෙත් නැහැ. වෙළඳම් කළේ කොස් කඩාගෙන ගිහින් විකිණීම. මේ විදියට රගපාල තමයි මාව එක්කරගෙන ආවේ. අපේ තාත්ත මාව බලන්න ඇවිත් හරියට දුක් වුණා. මේ තත්ත්වය දැකල දුප්පත් වුනත් කමක් නැහැ මනුෂ්‍යයෙක් නම්. රා බොන්නයි රේස් දමන්නයි තියෙනවා නම් වෙන මොනවත් ඕන නැහැ. පුදුම දුකක් වින්ද මේ මිනිහත් එක්ක ඇවිත්. ප්‍රේමදාස උදේට කොස් කඩන් ඇවිත් මදුලු ගලවනවා පහළ ඉඳගෙන. මමත් ඇවිදින් ඒකට උදව් කරනවා. පස්සේ ඒවා බයිසිකලේ තියාගෙන විකුණන්න ගෙනියනවා. හවස 2 - වන විට ඒ ටික විකුණගෙන ගෙදරට උවමනා බඩු මුට්ටු අරන් එනවා. ඒ විතරක් නෙවි රු. 50/- ක විතර බිගෙනත් එනවා. සල්ලි තියෙන දවසට මටත් රු. 100/- ක් විතර හවසට දෙනවා. ඒත් ඒවා පස්සෙ ඉල්ලනවා. නැතිවුනොත් මට බනිනවා. මේ වන කොට අපිට දරුවො දෙන්නෙක් හිටියා.

දුවයි පුතයි. දරුවො හිටිය කියල ප්‍රේමදසට නම් ගනනක් නැහැ. ගෙදර රංඩු එන්න එන්නම වැඩි වුණා. ප්‍රේමදස බීලා ගෙදර එනකොට දරුවො දෙන්න ඉන්නේ බයේ හැංගිලා. එහෙම නැත්නම් කිට්ටුව පන්සලක් තියෙනවා. දරුවො දෙන්නත් එක්ක මමත් පන්සලේ ගිහින් හැංගිලා ඉන්නවා. ගෙදර තියෙන බඩු මුට්ටු පවා පොළොවෙ ගහනවා. මගේ තත්ත්වය අහල තාත්ත හොඳටම කනගාටු වුණා. තාත්තට කියාලා පර්චස් 10 ක් සල්ලිවලට ගත්තා. දැන් ඒකෙ මැටි ගහල ගෙයක් හදගෙන තමයි ඉන්නේ. දවස පුරාම මහන්සි වෙලා හැන්දෑවට ටිකක් බොන්නේ ඇගේ මහන්සියට කියල ප්‍රේමදස කියනවා. බොනවා විතරක් නොවෙයි රේස් තුන්ඩු දමන්නත් රුසියා. රු. 500/-, 100/- ක් වගේ ඇදිල තියෙනවා. ඒකෙ ඒ හැටි වෙනසක් නැහැ. එතකොට වැඩියෙන් රේස් දමනවා බොනවා. මේ ගේ හදන්න මම පුදුම දුකක් වින්ද. දරුවත් එක්ක ඇවිත් පුංචි දරුවා ගහක් යටින් තියලා ගෙයි මැටි ගැහුවේ. එහෙමයි මේ ගේ හැදුවේ. මගේ ගෙදර අපේ දෙමව්පියන්ගේ සෙවනේ අපි සිටිය හැටි මතක් වෙන කොට හරි දුකක් දැනෙනවා. තාත්තා මං ගැන හරියට දුක් වෙනවා. තාත්තා දැන් විශ්‍රාමිකයෙක්. විශ්‍රාම වැටුපෙනුත් මට උදව් කරනවා. ළමයින්ට උගන්වන්නේ ඒවයින් තමයි.

මේ කාලෙදී අපේ ගමේ සමිතියක් තිබුණා විපර්යකාරක සමිතියක් කියලා. ඒකේ කාර්යාලය තිබුණෙ හබරාදුවෙ. මිනිස්සු ජිවත් වෙන හැටි දුප්පත් වෙන හැටි දුප්පත් කම නිසා මුහුණ පාන තවත් ප්‍රශ්ණ මේවාට විසඳුම් නිතර කථා බහ කළා. මේ වගේ ප්‍රශ්ණ තියෙන අය තවත් අපේ ගමේ ඉන්න බව මම දැනගත්තෙත් එයින් පස්සෙ. ප්‍රශ්ණ තියෙන අපි ඔක්කොම එකතු වෙලා සමිතියක් පිහිටුවා ගත්ත. දැන් අපේ ප්‍රශ්ණ ගැන විසඳන්නේ කොහොමද කියලත් අපි කථා බහ කරනවා. ඒක අපිට ලොකු සහනයක්. අපේ පවුලේ ප්‍රශ්ණ ගැන කථා කරපු එකම ප්‍රේමදස වෙනසකට පත් කරලා. ගෙයක් දෙරක් හදගෙන හොඳින් ඉන්න ඕන කියන හැඟිම ප්‍රේමදසටත් ඇති වෙලා. මට හිතෙනවා මේ සමිතියේ රැඳිල හිටියොත් අපේ පවුලේ සෑහෙන වෙනසක් ඇති වේවි. හොඳ කලක් උද වේවි කියලා. මම දුක් විඳපු හැටියට වෙන ගැහැණියෙක් නම් මේ මිනිහ දමල ගිහින් හුගක් කල්. මම එහෙම කරා නම් මේ මිනුස්සය කවදවත් හැදෙන්නෙ නැහැ. ඒ නිසා මම වින්ද දුක්වලට අපි හැමෝටම සැප දවසක් ලගදීම උදවන බව මට විශ්වාසයි.

පවුල් ප්‍රකාශ අංක 13

මම සෝමාවතී. මගේ මහත්තයා පද්මසිරි. ගම කබලාන මගේ ගම කොග්ගල. මගුල් කපුවෙක්ගේ මාර්ගයෙන් අපි පද්මසිරි හඳුනගත්තෙ. මේ මංගල යෝජනාව ආවාම අපේ ගෙදර කට්ටියම ආවා. ඊට පස්සේ අපේ ගෙදරිනුත් එහේ ගියා. අයියයි අක්කයි ගිහින් ආවට පස්සෙ අකමැති වුණා කපුවා බොරු කියල තියෙන්නෙ කියලා. ඒ අයට පෙන්නලා තියෙන්නෙ වෙන කාගෙද ලොකු ගෙයක්. මේ බොරු නිසා අපේ ගෙදරින් අකමැති වුණා. මුහුදු රස්සාව මාස 6 යි තියෙන්නේ ඉතිරි මාස 6 බඩගින්නෙ තමයි ඉන්න වෙන්නෙ කියල අයියා කොහොමවත් අකමැති වුණා. ඒත් පද්මසිරි අපේ ගෙදර එනවා. අයියලා නම් ඒ ගමනට කොහෙත්ම කැමති වුණෙ නැහැ. ඒත් එයා ආවා ගියා. මම දර කඩන්න හිරිගල් දේවාලෙ ලගට යනවා. පද්මසිරි එතැනට ඇවිත් මාත් එක්ක කථා කරනවා. ගෙදරින් අකමැති වුනත් මගේ හිත මටත් හොරාට පද්මසිරිට කැමැත්ත දුන්නා. පද්මසිරිගේ අඩුපාඩු ගැන මට ගණනක් නැහැ. ඒව ගැන හිතුවෙත් නැහැ. හිතන්න ඕනකමක් තිබුණෙත් නැහැ. පද්මසිරි කියන ඕනම දෙයක් කරන මට්ටමට මගේ හිත ඔහු කෙරේ විශ්වාස කළා. කොග්ගල සංදර්ශනයක් තිබුණ වෙලාවට ඒක බලන්න මමත් ගියා. පද්මසිරිත් ඇවිත් හිටියා. එද පද්මසිරි මට කාටත් හෙරෙන් යන්න කථා කළා. මම ගියා. එද එහෙම ගියාට කසාද බදින්න ඕන කියලවත් මම හිතුවෙ නැහැ. පද්මසිරිට ඒ ගැන කිව්වෙත් නැහැ. මෙහෙම මාස 6 ක් විතර හිටියා. නැන්දම්මයි නැනයි පස්සේ අපි කසාද බැන්දුවා. නැන්දම්මා හරිම සැරයි. මෙහෙ ඉන්න බැරි තරමට කරදර. නැන්දම්මා පද්මසිරිටත් කේලම් කියනවා. ඒ වෙලාවට පද්මසිරිත් මට බනිනවා. ගහනවා. දවසින් දවසම මේ තත්තවය උග්‍ර වුණා. ඉවසන්න බැරි වෙලාවට මම මැරෙන්න හිතා ගෙන භූමිතෙලුත් බීල තියෙනවා. තුන් වතාවක් භූමිතෙල් බීල තියෙනවා. ඒත් කරුමෙට මැරුණෙ නැහැ. එතකොට මට දරුවො හිටියෙත් නැහැ. දවසක් නැන්දම්මා රංඩු වෙලා මට ගැහුවා. මම ගෙදරින් පිටවුණා. කොග්ගල ගෙදරක බද්දට අවු. 2 ක් හිටියා. අපේ ඉඩමෙ පොල් අතු අහුරගෙනත් ටික කාලයක් හිටියා. ඉඩමක ගෙයක අයිතියක් අපට කවදවත් ලැබෙන්නේ නැති බව සහතිකයි. මේ විදියට තමයි ජීවිත කාලයම ඉන්න වෙන්නේ. පස්සෙ ආයිත් කබලානට ආවා. ඇවිත් පොල් අතු අහුරලා ගෙයක් හද ගත්තා. දැන් අපිට දරුවෙකුත් ඉන්නවා. මේ ගෙයි ඉන්න හරි අමාරුයි දරුවෙකුත් එක්ක. ඒත් මේක අපේ එකක් නිසා එයින් සෑහීමට පත්වෙලා හිටියා. මේ අතරෙදි තමයි ජනසවියෙන් රු. 12000/- ක් අපිට ලැබුණා. ඒ සල්ලිවලින් ලැලි ගහල ගේ පොඩ්ඩක් හද ගත්තා. ඊට පස්සෙ අපි ඒකෙ පදිංචියට ගියා. මට කිසිම දෙයක්, රස්සාවක් කරන්න බැහැ හතිය හැදෙනවා. මහත්තයාගේ පඩියෙන් තමයි ජිවත් වෙන්නේ. ඒ රස්සාව තියෙන්නෙ හය මාසයයි. අනෙක් හයමාසෙ ණයට පොළියට කනවා. හම්බ කරන හය මාසෙ

ණය ගෙවනවා. මේක තමයි හැමදාම කරන්නෙ. මේ ආදායමෙන් ජීවත් වෙන්න බැහැ. ළමයින්ට උගන්වන්නත් ඕන. අපි කනවට වඩා වැඩිය නොකා ඉන්නවා වැඩිය. අද දවසෙත් බඩ ගින්නේ. රෑ බඩගින්නෙ ඉඳලා උදේ මහත්තය වැඩට ගියෙ. උදේට විතරයි මොනව හරි කන්නෙ. එයින් ටිකක් දරුවන්ට රෑටත් තියල දෙනවා. අපි දෙන්නා බඩ ගින්නේ ඉන්නවා. අපි බඩගින්නෙ ඉන්න වේල් අනන්තයි. කවද අපිට තුන් වේල කන්න ලැබේවිද කියල දෙයියො තමයි දන්නෙ.

පවුල් ප්‍රකාශ අංක 14

"මම දීපානි. උපන්ගම අහංගම පියදිගම. අපිට එච්චර අගහිඟකම් තිබුණේ නැහැ. මම පාසල් යන කාලේ මටත් අහල පහල ළමයි කිප දෙනෙකුටත් පන්තියක් පැවැත්වුවා අපේ ගෙදර. ඒකෙ උගන්වන්න ආවේ කුරුඳුවත්තේ අපේ ලොකු අයියගෙ නෝනගෙ මල්ලි. එයා ආරියරත්න. පංතිය නිසාම ආරියරත්න අපේ ගෙදර නිතර නිතර එන්න යන්න පටන් ගත්තා. මේ නිසා අපි දෙන්නා අතර සම්බන්ධයක් ඇති වුණා නොදැනිම. පාසල් ගමනෙන් පස්සෙ මාව බන්දල දෙන්න අම්මලට ඕන වුණා. අම්මලට යමක් කමක් තිබුණ නිසා ලොකු තැනකට මාව බන්දල දෙන්න සූදනම් වුණා. බදුල්ලේ ලොකු මුදලාලි කෙනෙකුට විවාහ කරල දෙන්න 1984.04.10 දිනට නියම කර ගෙන තිබුණා. මට කරන්න කිසිම දෙයක් තැබුණේ නැහැ. අම්මලාට මේ ගැන කියන්නත් බැහැ. කරන්න තිබුනු එකම දෙයයි. අප්‍රේල් 7 ද රෑ ගෙදරින් පැනල ගියා. ආරිත් එක්ක. පැනල ගිහින් විවාහ වුණා. විවාහ වෙලා අපි රත්මලානෙ ගෙයක් කුලියට අරගෙන ජීවත් වුණා. ආරි වැඩ කළේ රත්මලානෙ ලෝහ කර්මාන්තායතනයක. මමත් නිකම් ගෙදරට වෙලා හිටියේ. රත්මලානේ මැහුම් කාර්මාතායතනයක වැඩ කළා අවුරුදු 7 ක්ම රස්සාව කළා. පුතා ලැබුණට පස්සෙ රස්සාවට යන්න බැරුව ගියා. අම්මා මාත් එක්ක තරහවෙලා හිටියෙ කරපු හිතුවක්කාර වැඩේ හින්ද. ඒ වුණත් දරුව ලැබුණ කියල දැනගන්න ලැබුණම අම්මා ආවා දරුව බලන්න. දවස්කිපයක් ගෙදරත් නැවතිලා හිටියා. මට රස්සාවට යන්න විදියක් නැහැ. දරුව බලා ගන්න කව්රුවත් නැති නිසා. නමුත් අම්ම නතර වෙන්න කැමති වුණේ නැහැ. අම්මා කිව්වා ගෙදර ගිහින් වැඩකට යන්න දරුවා බලා ගන්නම් කියලා. ඊට පස්සෙ රත්මලානෙ ගාමන්ට් එකෙන් අස් වුණා. අස්වෙලා ගෙදර ආවා. දරුවා අම්මට බලා ගන්න දීලා මම කොග්ගල නිදහස් වෙළඳ කලාපයේ රැකියාවට ගියා. අවු. 4 ක්. පස්සෙ දරුව පාසල් යවන්න ඕන නිසා ගෙදර නවතින්න කියලා මහත්තයා කිව්වා. රස්සාවෙන් අයින්වීම පාඩුවක්. ඒත් ඉතින් දරුවට උගන්නත් ඕනනේ. රස්සාවෙන් අයින් වෙලා ගෙදර නතර වුණා. ආරි පැක්ටරියෙන් ඇළුමිනියම් බඩු ගෙනත් දුන්නා. මම ගෙදර ඉඳගෙන ඒවා විකුණ්නා. සිට්ටු දමලා ඇළුමිනියම් තාච්චි, වලං, කල ආදී භාණ්ඩවලින් ඒවා බේරුවා. ආරිට ලාහෙට බඩු ලැබෙන නිසා මෙයින් ලාභයක් තිබුණා.

අපි දෙන්නම හම්බ කරත් අපිට ජීවත් වෙන්න මුදල් මදි. අම්මත් හිටියෙ අපි ලඟ. කම්පැනියෙන් භාණ්ඩ ගන්න මුදල් නැතිව 40% පොළියට රු. 1000/- ක් ගත්තා. ඒකෙන් ව්‍යාපාරය කරා මිසක ණය ගෙව්වෙ නැහැ. කාලයක් ඉකුත්වුණා. පස්සෙ ණය මුදල පොළියත් එක්ක රු. 10000/- ක් වෙලා. ආරි මේ බව දැනගෙන මට හොඳටම බැන්නා. රංඩු වුණා. මහත්තයට මේව පේන්න බැහැ. පොලිකාරයට ගෙදරට එන්න කියලා ආරි දමල තිබුණ සිට්ටුවකින් මේ ණය ගෙව්වා. පොලි කාරයටත් තර්ජනය කළා "මීට පස්සේ දීපානිට පොලියට දීල තිබුණොත් පොලිසියට අල්ලල දෙනවා සල්ලි දෙන්නෙත් නැහැ කියලා" මටත් බැන්නා. තවත් පොලියට ගත්තොත් කසාදෙත් ඉවරෙයි කියලා. මම ඊට පස්සෙ නම් නොකා නොබී හිටියත් පොලියට නම් ගත්තෙ නැහැ. මම සල්ලි අඩු පාඩු නැති පවුලක උපන් නිසාද දන්නෙ නැහැ මට සල්ලි වියදම් කරන්න මිසක් ඉතුරු කරන්න හිතක් නැහැ. අරපිරිමැස්මක් නැහැ කියල ආරි තිස්සෙම දෙස් කියනවා. අපේ ගෙදර වියදම් කරන්නෙත් ආරි. මට වියදමට මුදල් ලැබෙන්නේ නැහැ. ආරි නිතියට වැඩ. ගෙදරට උවමනා බඩු ගේන්නේ ආරි. මගේ උවමනාවකට සල්ලි ඉල්ල ගත්තොත් මිසක නැත්නම් මා ලග සල්ලි නැහැ. ඇළුමිනියම් බඩුවල ගණුදෙනු හරියට බේරන්න ඕන. ලාභයට වුනේ මොකක්ද කියලා කියන්නත් ඕන.

අපේ ඉඩම තවම නිරවුල් කරගත්තේ නැහැ. අයිති කාරයෝ කිව්වා ඉඩම අපිටම දෙනවා කියලා. ඒ නිසා අපි ගැටුම් නැතිව හොඳින් ඉන්නවා. ගේ දෙන බව කිව්ව නිසා සමිතියෙන් ණය අරගෙන විදුලියත් ගත්තා. ගෙට විදුලිය ගන්න කීප පලකටම ගියා වැඩක් වුණේ නැහැ. බැංකුවටත් ගියා. ඔප්පුව තියන්න කිව්වා. ඇපකාරයෝ ඕනෑ කිව්වා. මේ වන විටත් මම හබරාදුවෙ සහභාගිත්ව සංවර්ධන පදනමේ පියදිගම නැගෙනහිර සමිතියට බැඳිල හිටියෙ. මම එක ණයක් අරගෙන තිබුණෙ ව්‍යාපාරයට. දෙවැනි ණය දෙන්නේ රු. 10000/- යි. ඒත් මගේ අවශ්‍යතාවයට වෙන යන්න තැනක් නැති නිසා මම පදනමට ගියා. මිස්ල මුණ ගැහිල මගේ උවමනාව කිව්වා. මම විදුලිබල මණ්ඩලයට බැඳිය යුතු මුදල චෙක්පතකින් මණ්ඩලයට ගෙව්වා. ඒ නිසා මට ලයිට් ලැබුණා. වෙන කිසිම ආයතනයකින් මේ විදියට අපේ අවශ්‍යතාවයන් සොයා බලන්නේ නැහැ. අපි දැන් වෙන කිසිම සමිතියකට කථා කරන්නවත් දෙන්නේ නැහැ. ඒ අයට ඕන සමිති අටවන්න විතරයි. අපෙන් ගන්න මිසක් අපේ ඕනෑ එපාකම් බලන්න ඒ අයට ඕන නැහැ. බැංකුවෙන් ගමට ආපු වෙලාවෙත් මම ඒ අයට මේක කිව්වා. අපි ගැන බැලුවෙ පදනම විතරය අපිට ඕන නම් ණය ඒකෙන් ගන්න පුළුවන් අපට බැංකු ඕන නැහැ කියලා.

"මම මල්කාන්ති. මගේ ගම මාරවිල ගල් ඇටවත්ත. මගේ පාසැල් ගමන නතර වුනාට පසු නිදහස් වෙළඳ කලාපයේ රස්සාවට ගියා. මේ අතරතුරේදී මීපෙන් විවාහ යෝජනාවක් ආවා. අපි දුප්පත් නිසා ඒ යෝජනාවට ගෙදර කව්රුත් කැමති වුණා. ඉන්න ගෙයක් තියෙනවා. මහත්තයට රස්සාවක් තියෙනව කියලා. ගෙදරට බරක් වෙන්න තිබුණ අකමැත්ත නිසා මමත් කැමති වුණා. මාව බලන්න ආපු දවසෙම නැන්දම්ම කැමති වුණා. ඒ විතරක් නොවෙයි එයාට ඉක්මණින් මාව බන්දල දෙන්නත් ඕන වුණා. ඒ නිසා 1990 ජනවාරි මාසෙ අපි කසාද බැන්ද. කසාද බැඳල එක්ක ගියේ අශෝකලයි මහ ගෙදරට. අශෝක කියන්නේ ගෙදරට. එයාගේ නම පුෂ්පකුමාර. අශෝක රස්සාව කළේ වයින් ස්ටෝර්ස් එකක. ඒ නිසාද මන්ද අශෝක සුරාවට ඇබ්බැහි වෙලා උන්නේ. රස්සාව කරල ගන්න පඩිය ඔක්කොම ගෙනැල්ල දෙන්නෙ අම්මට. අම්ම තමයි ගෙදර වියදම් කරන්නේ. මමත් රස්සාවක් කරපු නිසා මට ඒක එතරම් ප්‍රශ්ණයක් වුණේ නැහැ. ඒත් මං රස්සාවට යනවට අශෝක කැමති නැහැ. එයාට මං ගැන හරිම සැකයි. ඒ නිසා මට රස්සාවෙන් අස්වෙන්න කියා නිතරම බල කළා. අන්තිමේදී බැරිම තැන මම රස්සාවෙන් අස්වෙලා ගෙදර නතර වුණා. ගෙදර ඉඳීම දවසෙන් දවස එපා වුණා. නැන්දම්මා මට වෙනස්කම් කරන්න ගත්තා. කැවත් වැරදියි. බිව්වත් වැරදියි. නිද ගත්තත් වැරදියි. මොන දේ කළත් නැන්දම්මාට වැරදියි. අශෝක ගෙදර ආගමන් නැන්දම්මා මගේ වැරදි අශෝකට කියනවා. අශෝක මට බනිනවා. ගහනවා. මේ අතරෙදි මට දරුවෙකුත් ලැබෙන්න හිටියා. ඒත් ගෙදර අයගේ සැලකිලි වෙනස් වුණේ නැහැ. හැමදම රංඩු. අශෝක හැමදම බීගෙන ඇවිත් මට ගහනවා. දරුවා ලැබෙන්න මම අම්මලයි ගෙදර යන්න සූදනම් වුනේ ආයිමත් මේ ගෙදර පස් පාගන්නේ නැහැ කියලා හිතාගෙන. මම දික්කසාද වෙනවා. ඊට පස්සෙ ආයිත් ගාමන්ට් එකක රස්සාව කරල දරුව හදගන්නාවා කියල හිත දැඩි කරගෙන ගෙදර ගියා. අවුරුදු 3 ක් විතර ගෙදර හිටියා. මේ කාලෙදී අශෝකගේ බිමත්කම නිසා රස්සාවත් නැති කරගෙන කියලා දැන ගන්න ලැබුණා. ඒ විතරක් නොවයි අම්මත් එක්ක රංඩු වෙනවා කියලත් දැන ගන්න ලැබුණා. ඒ හැම දෙයක්ම විඳ දරාගෙන මම හිත හද ගත්තා මගේ අදහස් වෙනස් නොකර එහෙමම හිටියා. මම නැවත රස්සාවටත් යන්න පටන් ගත්තා.

මේ අතරතුරේදී දවසක් අශෝකලයි අම්මයි තව නැන කෙනෙකුයි මාව බලන්න අපේ ගෙදර ආවා. ඇවිත් අශෝක ගැන නොයෙක් දේවල් කිව්වා. මටත් හරියට දුක හිතුනා. ඒත් මේ නැන්දම්මගේ සට කපටිනම් දන්න නිසා මම නිහඬව සිටියා. ඒ අය ඇවිත් තිබුණෙ දරුවත් එක්ක මම ගෙදර එක්ක යන්න. මම ඒ ගෙදරට ආයිත් යන්න බැහැ මට ගෙයක් වෙනම හදල දුන්නොත් එන්නම් කිව්වා. ඊට පස්සේ නැන්දම්මා සතුටු වුණා. ඒ ඉඩමෙම කොනක මැටි ගහල

පොඩි ගෙයක් හදල දුන්නා. ඒත් ලියල නම් දුන්නේ නැහැ. මම දරුවත් එක්ක ඒ ගෙදර පදිංචියට ආවා. වෙනද තරම්ම කරදර දැන් නැහැ. අශෝක දැන් හැමදම බොන්නේ නැහැ. එයාට රස්සාවක් නැහැනේ. දැන් අපිට ළමයි 3 දෙනෙක් ඉන්නවා. දෙන්නෙක් පාසල් යනවා. බාල දරුවා තාම පොඩියි. මම රස්සාවට යනාවා අශෝක තමයි ගෙදරට වෙලා ළමයි බලා ගන්නෙ. ඒත් අශෝකට මාව සැකයි. වැඩට ගිහින් එනකොට බස්එකවත් නැතිව පරක්කු වුණොත් මට බනිනවා. කැත කථා කියනවා. සමහර වෙලාවට ගහනවා. හරිම පවුකාර ජීවිතයක් තමයි මම ගෙවන්නේ. වෙනද මිනිහා හම්බ කරල කන්නවත් දෙනවා. දැන් මට හම්බකරන්නත් ඕන. දරුවො හදන්නත් ඕන. ගෙදර දෙරේ වැඩ කරන්නත් ඕන. ඒ මදිවට ගුටි කන්නත් ඕන. ඒත් මොනවා කරන්නද? ළමයි තුන් දෙනා ලොකු කර ගත්තොත් ඒ අය හොඳට හදගත්තොත් එච්චරයි මට තියෙන එකම බලාපොරොත්තුව. එකම සැනසීම මේ ඔක්කොටම මුල දුප්පත්කම. මේ වගේ අපා දුකක් කිසිවකුට අත් නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

පවුල් ප්‍රකාශ අංක 16

"වැල්හේන්ගොඩ අපේ ගම. මගේ නම ධනසිලි. ඒ උප්පැන්නයේ නම ගෙදරට කියන්නේ චමිලා කියලා. ගමේ අය හඳුනන්නෙත් චමිලා කියන නම මම පවුලේ වැඩිමලා. මට බාල නංගි කොනකුයි මල්ලි කෙනෙකුයි ඉන්නවා. මම පාසල් ගියේ වැල්හේන්ගොඩ ගුණරතනෙට. අපේ තාත්තා රස්සාවට කළේ හුනු ගලක් කඩන වලවල්වල වතුර හිස් කරන එක. අම්මා ලුණු ඇඹරුවා. මමත් අම්මත් එක්ක ලුණු ඇඹරුවා. අ.පො.ස. (සා.පෙ.) දක්වා විතරයි මම පාසැල් ගියේ. ගෙදර අඩු පාඩු මැද්දේ තවත් පැසැල් යන්න මට ඉඩක් ලැබුණේ නැහැ. පාසැල් ගමන නතර කරල අම්මත් එක්ක ලුණු ඇඹරුවා. ගෙදර ඇහැට කනට ජේන ගෑණු ළමයෙක් ඉන්න කොට අම්මලාට හිතට හරි නැහැනේ. මගුල් කපුවො අපේ ගෙදරටත් ආවා ගියා. ප්‍රදිප් ගැනත් කපුවෙක් ඇවිත් අම්මලාට කියලා. අම්මලත් සොයල බලල ඒකට කැමති වුණා. ඒ නිසා අපි 1993 7 මාසෙ 22 විවාහ වුණා. අපේ අම්මලා පුළුවන් තරමින් චාම් පුංචි උත්සවයක් පැවැත්වූවා. සිංහල චාරිත්‍රානුකුලව එම කටයුතු හමාර කර මම ප්‍රදිප්ලාගේ ගෙදර එක්කකරගෙන ගියා.

ප්‍රදිප්ගේ අම්ම තාත්ත නැහැ. අම්ම තාත්ත පුංචි කාලෙම එයා දමල ගිහින්. ආච්චි තමයි හද ගෙන තියෙන්නේ. ප්‍රදිප් ඉපදුනාට පස්සෙ ඒ අයට අපලය කියලයි එහෙම කරල තියෙන්නෙ. ඒත් ආච්චියි අම්මගේ පවුලේ අනෙක් අයයි ප්‍රදිප් ආදරෙයන් රැක බලා ගත්තා. ප්‍රදිප්ගෙ ගම ගාල්ලේ. කසාද බඳිනකොට එයා ත්‍රී රෝද රථයක කුලියට වැඩ කරමින් සිටියේ.

ප්‍රදීප්ලයි ගෙදර තිබුණේ! ගාල්ලේ ටවුමේ. මේ ගොල්ලො හැම දෙයක්ම එවෙලෙම කඩෙන් ගේන්නේ. දවල් රෑ කෑම පවා කඩෙන් ගෙනත් කන්නේ. ප්‍රදීප් හම්බ කරන සල්ලි වියදමටත් මදි. එතැන ප්‍රදීප්ට අයිතියක් ඇත්තෙත් නැහැ. ඒ නිසා අපෙ අම්මා අපි ගෙන්නා ගත්තා ගෙදරට. වැල්හේන්ගොඩ පදිංචියට ආවෙ එහෙමයි. ටික කලකට පස්සෙ අපිට දුවක් ලැබුණා. අනුන්ගේ ත්‍රිරෝද රථයක වැඩකරලා පලක් නැහැ හම්බ කරන එක දුවටයි මටයි ජීවත්වෙන්නත් මදි. අපේ තාත්තා හොඳ ගොවියෙක්. ඉඩම හොඳට වවනවා. ඒකෙන් ලැබෙන ආදයම ගෙදරට වියදම් කරනවා. ඒකෙන් කමයි අපිත් ජීවත් වෙන්නේ. ප්‍රදීප් වෙන රස්සාවක් හොයාගන්නා අදහසින් ත්‍රී රෝද රස්සාව නතර කළා. රේස් තුන්ඩු ලියන තැනක ඊට පසු රස්සාව කළා. කලකට පස්සෙ බුකියේ මුදලාලි බංකොලොත් වුණා. ඒ නිසා රේස් වැඩපළ වසා දැම්මා. ප්‍රදීප්ට රස්සාව නැතිවුණා. ආයිමත් වෙන කරන්න දෙයක් නැතිකමට පුරුදු රස්සාවට ගියා. ඒත් ඒ ආදයම මදි. අපේ ගෙදර නඩත්තුවවත් අපිට දරන්න වුණා. අම්මලාට උදව් කරන්න අපිට සිද්ධ වුණා. ඒ නිසා වැඩිය හම්බ කරන්න ඕන ප්‍රදීප් නිතරම කිව්වා. ඒත් ඉතින් මොනවා කරන්නද? පස්සේ තීරණය කළා විදේශ රටක රැකියාවක් කරන්න. අදහස නම් හොඳයි. ඒත් කෝ අපට සල්ලි. අපිටය කියලා කිසිම දෙයක් නැහැ. කොහොමද සල්ලි හොයන්නේ. ආරංචියක් ලැබුණා පොලියට ඕනතරම් සල්ලි දෙන කෙනෙක් ගැන. අපි ගිහින් එයා මුණ ගැහුණා. කථාව ඇත්ත. මේ වෙලාවෙ අපිට වෙන කාගේ පිහිටද රු. 20000 ක් 20% පොලියට ගත්තා. ඒක අරගෙන ඒජන්සියට බැන්ද. රට යන නිසා සල්ලි ලැබෙන එක ගැන ප්‍රශ්ණයක් නැහැ. තවත් රු. 65000/- ක් අරගෙන ප්‍රදීප් රට යැව්වා. දහසකුත් එකක් බලාපොරොත්තු ඇතිව. අපි හිතු ඉක්මණින් ප්‍රදීප්ට රට යන්න බැරිවුණා. ඒත් පොලියට ගත් මුදල්වල පොලී ගෙවන්න ඕනනේ. මහත්තය රට නොගියත් පොලී ගෙවන්න ඕන නිසා තාත්තට අයිති අපි ඉන්න ඉඩම උගස් තිබ්බා. උගස් තියලා රු. 35000/- පොලී ගෙව්වා. ඊට පසු මහත්තයා රට ගියා. රට ගිහින් මාස කිහිපයක් යන තුරු මහත්තයා මුදල් එව්වේ නැහැ. මාස කිපයකට පසු මුදල් එව්වා. ඒත් රු. 35000/- ර. 1,20,000/-ක්ම ගෙවන්න වුණා. මහත්තයා රට ඉඳල ආවත් කිසිම දෙයක් නැහැ. ගෙනාපු බඩු මුට්ටු කිපයක් තිබුණා. ඒවත් විකුණලා ඉඩම බේර ගත්තා. නැත්නම් අපි නිසා අම්මලාටත් පාරට බහින්නයි වෙන්නේ. රට යන්න කලින් හිටියටත් වඩා පහළට ඇද වැටුනා. රු. 55000/- ක් දීලා පාවිච්චි කරපු ත්‍රීවීලර් එකක් ගත්තා. ඒක හැමදම ලෙඩ. නිතර නිතර හදන්න වුණා. ඒ නිසා රු. 20000/- විතර පාඩු අරගෙන එය විකුණා දැම්මා. ඊට පස්සෙ සුපුරුදු පරිදිම අනුන්ගේ ත්‍රී වීල් රථයක වැඩට ගියා. අපි ගෙයක් දෙරක් හද ගත්තෙත් නැහැ. තාත්තගේ ඉඩමේ ලැලි ගෙය පමණයි තවමත්.

ළිඳේ වැටුණ මිනිහා ලිං කටෙන්ම ගොඩ වෙන්න ඕන කියන ප්‍රස්ථා පිරුළ සනාථ කරමින් ප්‍රදීප් ආයෙත් රට යන්න සූදනම් වුණා. මේ සැරේ කළේ පොලියට ගත්තේ නැහැ. ඉඩමේ ඔප්පුව බැංකුවට තියලා අඩු පොළියට රු. 25000/- ක් අරගත්තා. ඒකත් දැන් ගෙවා ගෙන

යනවා. අපි වැල්හේන්ගොඩ ගමේ සමිතියකත් ඉන්නවා. හබරාදුව සහභාගීත්ව සංවර්ධන පදනම කියලා. ඒකෙනුත් ණයක් ගත්තා. කලින් ගත් ණය පියවන්න. වැඩි පොළියට නොගෙන අඩු පොළියට සමිතියෙන් ගත්තම ගෙවන්න අපහසුවක් නැහැ. මෙතෙක් කල් කිසිම උනන්දුවක් නැතිව තිබූ මගේ ගෙවත්ත සමිතියේ උදව්වෙන් වගා කරනවා. ණය මුදලකුත් ගත්තා. පුහුණුවකුත් ලැබුණා. මම ඒ අනුව දැන් ගෙවත්ත කරගෙන යනවා. මේ සැරේ ණය බරකින් නොවී නිදහස් වෙන්න මට පුළුවන් වටපිටාව මම හදාගෙන යනවා. ප්‍රදීප්ටත් ගිය වරට වඩා මෙවර විශ්වාසයක් ඇතිවය ගියේ.

පවුල් ප්‍රකාශ අංක 17

"මගේ නම අනුලාවතී. මගේ මහත්තයා අමරපාල. එයා උපන්ගම වැල්ලද්දරගොඩ. මගේ ගම වැලිගම. විවාහ යෝජනාවකින් 1987 දී අපි විවාහ වුනා. අපි විවාහ වෙලා ආවෙත් මේ ගෙදරටමයි. මගේ මහත්තයාගේ අම්මලා තාත්තලා පදිංචි වෙලා ඉඳලා තියෙන්නෙත් මේ ගෙයිමයි. මම මෙහෙට පදිංචියට එනකොට මේ ගෙදර හිටියේ මහත්තයා විතරයි. අවුරුදු 2 කට පස්සේ අපිට පුතෙක් ලැබුණා. මගේ මහත්ත්තයා රස්සාව කලේ හුණු පෝරණුවක. ටික කලකට පස්සේ කුරුඳු බොයිලේරුවකත් වැඩ කරා. ඒ අතරෙදිම තමයි අමතර ආදායමක් ලෙස ගෙවතු වගාව කලේ. මහත්තයා දියුණු වෙන්න කැමතියි. මහන්සි වෙලා වැඩකරන්නත් කැමතියි. කුරුඳු බොයිලේරුවෙ වැඩ කරන කාලෙ අපි බර කරත්තයක් අරගත්තා. කුරුඳු බොයිලේරුවෙන් අස්වෙන්න හිතාගෙනයි කරත්තේ ගත්තේ. කොග්ගල ගාමන්ට් එකෙන් ඉවත දමන රෙදි අහල පහළ අය අරන් යනවා. මගේ මහත්තයා කරත්තයෙන් ඒ රෙදි අදිනවා. ඒකෙනුත් අමතර ආදායමක් ලැබෙනවා. මම ගෙදර දෙරේ වැඩ කරනවා. මහත්තයා තමයි කොරටුවෙ වැඩ කරන්නේ. මම කොරටුවෙ වැඩ කරනවට මහත්තයා කැමති නැහැ. කොරටුව නෙලන්නවත් යනවට කැමති නැහැ. මම වැඩ කරන්නේ බාගෙටලු. පිළිවෙලකට වැඩක් කරන්න දන්නේ නැතිලු. වැඩත් කරල බැනුම් අහන්නත් වෙන නිසා මම දැන් මහත්තයාගේ වැඩ කිසිවක් කරන්නේ නැහැ.

මහත්තයා උදේ 5.00 ට නැගිටලා කොරටුවෙ වැඩ කරනවා. උදේ 6.00 ට ගාමන්ට් එකට යනවා. ඒ රෙදි ටික පටවගෙන බෙදගෙන දවල් 1.00 , 2.00 වන විට ගෙදර එනවා. එයා දවල්ට කෑම කන්නේ නැහැ කවදාවත්. ටිකක් නිදාගෙන හවස් වරුව කොරටුවෙ වැඩ කරනවා. කරත්තේ බඳින ගොනාට කන්න බොන්න දීල තමයි මහත්තයා ගෙට එන්නේ.

කොග්ගලට යන්න එන්න වෙලාවක් යන නිසාත් ගේන්න පුළුවන් රෙදි ප්‍රමාණය අඩු නිසාත් අපිට ලැබෙන ආදායම වැඩිකරගන්න විදියක් නැහැ. ඒ නිසා මහත්තයාගේ අදහසක් තිබුනා කරත්තය විකුණලා අත් ට්‍රැක්ටරයක් ගන්න. අළුතින්ම ට්‍රැක්ටරයක් ගන්න ලොකු මුදලක් යට කරන්න නැති නිසා පාවිච්චි කරපු ට්‍රැක්ටරයක් ගන්න සෙව්වා. ටික ටික මුදල් ගෙවන්න යාලුවෙකුගෙන් ට්‍රැක්ටරයක් ගත්තා. සමෘද්ධියෙන් රු. 10000/- ක් අරගෙන ට්‍රැක්ටරවට ගෙව්වා. මගේ රත්රන් බඩු ටික උගස් තියලා තව රු. 5000/- ක් ගත්තා. ඒකත් ට්‍රැක්ටරයට දුන්නා. තව රු. 20000/- ක් දෙන්න ඕන.

වෙනද කරත්තෙන් කොග්ගලට යන්න පැය 02 ක් ගත වෙනවා. නමුත් දැන් ට්‍රැක්ටරයට ගතවෙන්නේ පැය භාගයක්. කාලෙ ඉතුරු නිසා වැඩිපුර රෙදි තොගයක් ගේන්නත් පුළුවන්. වැඩිපුර ආදායමක් ලැබෙනවා වගේම ඉතුරුවන කාලය කොරටුවේ වැඩට යොදවන්නත් පුළුවන්. එයින් ගෙවත්ත සරුසාර වෙනවා. දරුවා දැන් පාසැල් යනවා. එයට අමතරව වගා වැඩ කටයුතු කරන්න හරි ආසයි.

අපේ ගේ මහත්තයාගේ අම්මයි තාත්තයි දෙන්නත් හිටපු ගේ සහ ඉඩම, කාටවත් ලියලා නැහැ. සියලුම සහෝදරයින්ගෙන් අපි සමහරක් කොටස් මිලදී ගත්තා. අනෙක් කොටස් තියෙන අය සහෝදරයන්ගේ අයිතිය සල්ලි වලටවත් දෙන්නේ නැහැ. මේ ගෙයි නඩුව ඉවරවෙන කොට අපේ අතේ කියක්වත් නැතිවෙයි. මේ නඩුව නැත්නම් අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ. මහත්තය දුක් මහන්සි වෙලා හම්බ කරනවා. ගෙදර අඩුපාඩු සම්පූර්ණ කරගන්න ඒ ඇති. මහත්තයා සිගරට් අරක්කු බොන්නේ නැහැ. කොරටුවෙන් අළුත් එළවළු පලා පළතුරු ලැබෙනවා. ගෙදරට ගන්න එළවළු, පළතුරු හැර ඉතිරිවා විකුණා ගන්නවා. හොඳ ආදායමකුත් ලැබෙනවා. ඉන්නේ එක දරුවයි. දරුවා පාසැල් යනවා. එයාට අඩුපාඩුවක් ඇත්තේ නැහැ. හොඳින් ඉගෙන ගන්නවා. තාත්තට කොච්චර වැඩ තිබුනත් දරුවගේ ඉගෙනීම ගැන සොයනවා. මමත් දරුවගේ ඉගෙනීම ගැන සොයනවා. පාසැල් ඇරී ආ ගමන්ම සමහර වෙලාවට මහත්තයා මට බනිනවා. එහෙම කරන්න එපා. ඒක දරුවට හිරිහැරයක් කියලා. කෙසේ වුනත් දරුවත් මහත්තයත් මමත් හරි සතුටින් ජීවත් වෙනවා.

ට්‍රැක්ටරයට තව රු. 20000/- ක් ගෙවන්න තියෙනවා. සමිතියෙනුත් රු. 15000/- ක් ණයට ගත්තා. ට්‍රැක්ටරයට ගෙවන්න. ඉතිරි ටිකත් කොහාම හරි ගෙවා ගන්න පුළුවන්.

නඩුව ඉවර වුනු ගමන් ගේ හද ගැනීම තමයි අපේ බලාපොරොත්තුව.

පවුල් ප්‍රකාශ අංක 18

"කළුත් - මමත් අවුරුදු 05 ක ප්‍රේම සම්බන්ධයකින් දෙපැත්තේම ආශිර්වාද මැද්දේ විවාහ වුනේ. කලු බෝගහගොඩ. මම මිපේ. දෙසතියක් කළුගේ නිවසේ ගතකොට අපේ ගෙදර පදිංචියට ආවා. මේ මගේ මහ ගෙදර. කළු රැකියාව කලේ අම්බලන්ගොඩ සාප්පුවක. උදේ 7.00 ට නිවසින් පිට වෙනවා. මා ජීවත් වුනේ අසල්වාසීන් සමග සුහදතාවයෙනුයි. මා ඒ අතරතුර මරණාධාර සමිතියේ, ස.ණ.ස. සමිතියේ ක්‍රියාකාරි සාමාජිකයෙක් හැටියට සිටියා.

කාලය මෙහෙම ගෙවී යන අතරතුරේ 1992.06.24 දින අප දෙදෙනාට සම්පතක් ලැබුනා. දියණියක්. මා එය මුළු හදවතින්ම වැළඳගත්තා. දුව ඉපදී මේ දක්වාම හැම උපන් දිනයක්ම ගත්තා. දියණියත් ටිකෙන් ටික දැඩිවන විට මගේ හිතට දැනුනා කළුත් ස්තිර රැකියාවක් කරන්නේ නැහැ අපේ අනාගතය ගැන. කළුට සතියෙන් සතියට වැටුප ලැබෙන්නේ. එයින් දරුවටත් මාසිකව රු. 100, 50 ඉතිරි කලා. මමත් දිරිමත් ගැහැණියක් වශයෙන් ගෙවත්තේ කැත්ත උදැල්ලේ වැඩකලා. තේ වගා කලා. එයින් ලැබෙන මුදලින් දුවටත් මහත්තයත් රක්ෂණය කලා. 1994 අගෝස්තු මාසයේ පටන් ගත්තේ. එය නොකඩවා අවුරුදු 08 දැම්මා. මා නිතිය අකුරටම පිලිපැද්දා.

මා විවාහවී දැනට වසර 10-12 ක් වෙනවා. කිසිම දවසක අඬදබර වෙලා නැහැ. ඉඩම් මිලදී ගත්තේ නැහැ. නිවාස තැනුවේ නැහැ. දැනට ජීවත් වෙන්නේ හවුල් නිවසක. නමුත් දුවටත් මහත්තයටත් ඉතුරුම් මගින් අනාගතය යහපත උදකලා. ගමේ හිතවත් අයගේ දුකේදී සොයා බලා උදව් කලා. නෑදෑයින්ගේ සහෝදරයින්ගේ අවශ්‍යතාවයකදී උනන්දුවෙන් කටයුතු කලා.

ඇතැම් අවස්ථාවලදී කළුගේ වැරදි දැක්කම ඔහුට හොඳ මග කියා දුන්නා. ස්වාමියාගේ අනවශ්‍ය වියදම් බොහෝ දුරට කථාබහ කරලා අඩු කලා. ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කලා. ගොයම් කපන විට වෙලට බැස ගොයම් කපනවා. ගමේ පොදු වැඩවලට අවංකව කැපවීමෙන් වැඩ කලා. දුවගේ මොන්ටිසෝරියේ පාසැලේ හැම වැඩකම මම ඉදිරියෙන් සිටියේ. මගේ ගෙදර වැඩ කටයුතු අතපසු කරගෙන සමාජ සේවය කලා. මගේ ඇතැම් හිතවත්තු මට විහිලු කලා "ජංගම සේවය" කියලා.

ගෙදරට අවශ්‍ය ගෘහ උපකරණ විවාහ වීමෙන් පසුව මිලදී ගත්තා. දුවට අවශ්‍යවූ පාසල් උපකරණ අරගෙන දෙනවා.

අවාසනාවකට වගේ 2000 ඔක්තෝබර් මාසයේදී මාගේ බෙල්ලේ රිදුමක් ඇතිවුනා. මා කිහිප පොලකින් ප්‍රතිකාර කලා. එය එන්න එන්නම වැඩි වුනා. පසුව එය පිලිකා රෝගය බව හැඳින ගත්තා. මාගේ සමාජ සේවය ගොඩාක් දුරට අඩාල වුනා. මාගේ යහළුවන් නෑදෑයින්

සහෝදරයින් හාරහාරව් මුදලින් සහ ද්‍රව්‍ය වලින් උදව් උපකාර කලා. ඒ අවස්ථාවේදී ලැබුනු ප්‍රතිකාර මගින් මා දැනට පිවත් වෙනවා. ඒ අයට ගොඩක් මාගේ ජීවිතය මේ තත්ත්වයට ගත්තාට පින්සිදු වන්නට ඕන. නිරෝගී වෙන්න කියලා මා හැමදම බුදුන් වදිනවා. අද මට මාගේ දැතින් කෑම ටිකක් උයලා දීමට තරම් ශක්තියක් ලැබුනා.

මා ගෙදර අරපිරිමැස්මට ගොඩාක් දුරට පවත්වාගෙන යනවා. ගෙදර විදුලි බලය පාලනය කිරීමෙන්, මුළුතැන්ගෙයි වැඩ අරපිරිමැස්මෙන් කරනවා. දවසකට ගොවත්තේ එලවළුවක් ආහාරයට ගන්නවා. මගේ ජීවිතය කොයි මොහෙතේදී කියා කීමට අපහසු වුනත් මා ඒ ගැන සැලෙන්නේ නැත. මාගේ ආදර ස්වාමියාටත් දියණියටත් අනාගතය වෙනුවෙන් ඉතිරි කර ඇත.

පවුල් ප්‍රකාශ අංක 19

"මගේ නම මාලනී. මගේ ගම මිජේ. මහත්තයාගේ ගම කතලුගොඩ. නම රෙජී. විවාහ යෝජනාවක් අනුව තමයි අපි විවාහ වුනේ. කපුවා අපේ ගෙදරට කියලා තිබුනේ රෙජී ජේල්ර් ගාර්ඩ් කෙනෙක් කියලා. අපේ අම්මලා ඒකයි කැමති වුනේ. මොනවා නැතත් ආණ්ඩුවෙ රස්සාවක් තියෙනවා නේද කියලා. අපේ පැත්තේ අය කිව්වා අපි දුප්පත් මිනිස්සු. අපේ අම්මලා බැලුවේ තමන්ගේ දරුවට දුකක් නැතිව ජීවත් වෙන්න පුළුවන් දෙයක් කරන්න.

රෙජීට ඉන්න තැනක්වත් නැහැ. අපි විවාහ වෙලා ආවේ රෙජීලයි මහ ගෙදරට. ඒ ගේ තිබුනේ වැල්හේන්ගොඩ ඉස්කෝලෙට අයිති ඉඩමක ඒකෙ ඉන්න අයිතියක් නැහැ. අපි මේ ඉඩමෙ හිටපු නිසා ආණ්ඩුවෙන් ඇවිත් අපි ගෙයින් එළියට ඇදල දැම්මා. එතකොට මට දරුවො තුන් දෙනෙක් හිටියා. අපට යන්න එන්න තැනක් තිබුනේ නැහැ. මම දරුවො තුන්දෙනත් එක්ක අපේ මහ ගෙදර ගියා. ඒත් රෙජී එහෙ යන්නේ නැහැ. අපේ අම්මලාට බොරු කියලා මම බැන්ද නිසා අපේ අම්මලා රෙජීට දෙස් කිව්වා. අම්මලා රෙජීත් එක්ක තරහයි. ඒ නිසා රෙජී අපේ ගෙදර යන්නේ නැහැ. යන්නත් බැහැ. ඒත් මමත් දරුවොත් විතරයි අම්මලයි ගෙදර හිටියේ. රෙජී නැතිව මට එහේ ඉන්න පාලුයි. අමාරුයි. එයා මොනවා කරනවද, කොහේ ඉන්නවද? කියලා මට නිතරම හිතෙනවා. මාත් එක්ක අමනාප තිබුනත්, මට කොච්චර වැරදි කලත් දරුවන්ගේ තාත්තා නේ. මගේ මහත්තයානේ කියලා මට හරි දුකක් කනගාටුවක් ඇති වුනා. මට අම්මලයි ගෙදර ඉන්න බැරිව ගියා. ඒ නිසා හඳුනන කෙනෙක්ගේ මාර්ගයෙන් වැල්හේන්ගොඩ පරණ ගෙයක් සොයා ගත්තා. බද්දට කුලියට හෙම නෙවෙයි. තැනක් හදගන්නකන් ඉන්න විතරයි. ඒත් අපි ටික කාලයයි එහේ හිටියේ. ඒ ගේ

අයිතිකාරයට ගේ හදගන්න ඕනෙයි කියලා ගේ ඉල්ලුවා. ඊට පස්සේ අපි වෙන කෙනෙකුගෙන් ඉඩමක් ඉල්ලා ගත්තා. තාවකාලික ගෙයක් පොල් අතු මඩුවක් ගහගෙන ඉන්න. ඒ ඉඩම අපිට ලැබුනා. තාවකාලිකව ඉන්න. අපි ඒකෙ පොල්අතු හොයලා මැටි ගහලා ගෙයක් හදගත්තා. ඒ දවස්වල මගේ මහත්තයා කොහේදෝ තැනක කම්කරු රැකියාවක් කලා. (අනියම්) ඒත් පඩිය ඉවරවෙන තුරු බොනවා. එහෙමකට දවසක් තමයි සල්ලි අරන් ගෙදර එන්නේ. ඒත් එන්නේ මහ රෑ දෙගොඩහරියේ. සල්ලි අරන් ඇවිත් මට දුන්නොත් තමයි අපිට කන්න පුළුවන්. නැත්නම් ඉතින් අපි බඩගින්නේ. වැඩියෙන් අපි දවස් ගෙවන්නේ බඩගින්නේ. බඩගින්න ඉවසන්න බැරිවුනාම කාගේ හරි අඳුනන තැනකට අපේ මහ ගෙදරට ගිහින් මොනවා හරි ඉල්ලගෙන ඇවිත් දරුවන්ටත් දීලා මම කනවා. මේක හැමදම කරන්න බැහැ. දහඅතේ කල්පනා කලා මම මොකක්ද කරන්නේ කියලා. මහත්තයාගේ අම්මා කරපු රස්සාව මතක් වුනා. ඒ දවස්වල මම අම්මට උදව් කලා. මට පුරුදු රස්සාවක් නෙව්. ඒ දවස්වල මම ඉසුරු සමිතියට බැඳිලා හිටියා. විපර්යකාරක සමිතිය ඒ දවස්වල අපේ ගමේ තිබුනේ නැහැ. ඒ සමිතියෙන් ණයක් අරගෙන මේසයකුයි ඉස්ත්‍රික්කයකුයි, ගත්තා. ඒ අම්මට උදව්වට හා හවුලට. ඒකත් තියන නිසා මට හිතුනා මේ රස්සාව මම පටන් ගන්න ඕන කියලා. ගෙදරම තමයි රෙදිවල වැඩ කලේ. මුලින්ම අඳුනන අයගේ රෙදි හේදුවා. සමහරුහරි කනගාටු වුනා. මම මේ රස්සාව කරනවට. නමුත් තවත් සමහරු අනුකම්පා කලා. උදව් කලා. මට හිනාවුන උදව්යත් මේ අතර හිටියා. නමුත් මම මේ දේ කරන්ට ලැබීම ගැන ඇත්තටම සතුටු වුනා. මුලදී අඳුනන අයගේ රෙදි හේදුවට ඒ අයගේ මාර්ගයෙන් දැනගත් බොහෝ දෙනා අපිට රෙදි ගෙනවිත් දෙන්න පටන් ගත්තා. නොදැනිම වෙනත් අයගේ රෙදි පිරිසිදු කලා. මේක අපේ පවුලේ බඩගිනි නිවන රස්සාවක් බවට පත්වුනා. ඒත් රෙජී නම් මේ කිසිම දෙයකින් නොසැලුන මිනිහෙක්. මට ඕන දෙයක් කරපුදෙන් කියලා එයාට පුරුදු විදියට එයා හැසිරුනා. එයා හම්බ කරන මුදල කිසිම බෙදීමක් නැතිව දැන් මුළුමනින්ම බීමට යොදවනවා. රෙජී නම් මහ පුදුම සැමියෙක්. තාත්තා කෙනෙක්. වැල්හේන්ගොඩ ගෙදර ඉන්න කොට මහත්තයා මාත් එක්ක නිතරම රංඩු වෙනවා. මෙහෙම තරහ වෙලා දවසක් මම පොලිසි ගියා. දුව විතරක් මම ගත්තා. පුතාල දෙන්න තාත්තට දුන්නා. පොලිසියෙ තීන්දුව. මට නම් ඒක දරාගන්න බැරි වුනා. මහත්තයා නැතත් කමක් නැහැ. ඒත් දරුවන්ට හැදෙන්න හොඳ තැනක් නෙවෙයි තාත්ත ළග. තාත්ත කරන්නේ ඔක්කොම වැරදි වැඩ. තාත්ත ළග දරුවො හැදුනොත් දරුවොත් හැදිල ඉවරයි. අනේ මගේ අහිංසක දරු පැටව් දෙන්නා මට කොහොම හරි දරුවො අරගන්න ඕනවුනා. මගේ මල්ලිට මම මේ ගැන කියලා දරුවො දෙන්නා මට අරන් දෙන්න කිව්වා. මල්ලි ගිහින් රෙජී එක්කත් කතා කරල සමාදන කරා. රෙජියි දරු දෙන්නයි ඔක්කොම ගෙදර ආවා. අකමැත්තෙන් වුනත් මම රෙජිව බාර ගත්තා. දරුවො නිසා. ඒත් පරණ පුරුද්ද නතර කලේ නැහැ. දරුවො ගැනි නෙවෙයි එයාට ඕන බොන්න විතරයි. ඒත් එයා රෙජී වැරදියි කියලා කිසිම වෙලාවකවත්

කියන්නේ නැහැ. එයා කියන්නේ එයා වැඩ කරන තැන මුදලාලිට අරක්කු ගේන හින්දලු එයා බොන්න පුරුදු වුනේ. බීලා ගෙදර ආවම මේ ගෑනි බනිනවා. රංඩු වෙනවා. රංඩු වෙලා පොලිසි යනවා. දැනට පහලොස් වතාවක් විතර ඔය විදියට පොලිසි ගිහින් තියෙනවා. මේ ගෑනිට කන්න හම්බ කරලා දෙන්න වැඩක් නැහැ. ඒකයි මම බොන්නේ. ඒක වරදක්ද? එහෙම කියන එයා දකින්නේ මගේ වැරදි විතරයි. ඇත්තටම මට දැන් ඕන පවුල් කන්න නෙවෙයි. දරුවොත් එක්ක වැටිලා ඉන්න ගෙයක් හදගන්නයි. අපි මේ ඉන්න තැනින් අපිට යන්න කියන එකක් නැහැ මම හිතන්නේ. එතැන ගෙයක් හදගන්න බාධාවක් වෙන එකක් නැහැ. මම හබරාදුව සහභාගිත්ව සංවර්ධන පදනමෙන් ණයකුත් අරගෙන තමයි මේ ව්‍යාපාරය කරගෙන යන්නේ. මටයි දරුවන්ටයි ජීවත් වෙන්න මේ රස්සාවෙන් පුළුවන්. ඉතිරි කරන්න නම් මදි. දැන් අරගෙන තියෙන ණය ගෙවල ඉවර වෙලා පදනමෙන් තවත් ණයක් අරගෙන ගේ හදගන්න මට අදහසක් තියෙනවා.

අපිට සමෘද්ධි සහනාධාරය තියෙනවා. ඒ තියෙන්නේ රෙජීගේ නමට. සමෘද්ධිය කාඩ් පතේ බඩු ටික අරගෙන ඇවිත් හන්දියෙ කඩේ මුදලාලිට විකුණලා සල්ලි අරගෙන බොනවා. ණයට බීපුවා ගෙවලා. මෙහෙම මිනිස්සුත් එක්ක පොලිසි නොගිහින් කොහොම දිවි ගෙවන්නද? ඒ විතරක් නෙවි සමෘද්ධියෙන් රු. 5000/- ක ණයකුත් ගත්තා. මං කරන ව්‍යාපාරයට කියලා බලන්න ආවොත් මගේ ව්‍යාපාරය පෙන්නන්නත් පුළුවන්නේ. ව්‍යාපාරයට තියා ඒ කරන මගේ ඇඟැටවත් ඒ සල්ලි දැක්කේ නැහැ. දරුවන්ට පැණි රස කෑමක් ගෙනත් දුන්නොත් මිසක නැත්නම් ගෙදර වියදමටත් ව්‍යාපාරයටත් ශතයක්වත් වියදම් කලේ නැහැ. බීලම ඉවර කලා. මේ මනුස්සයා මේ බොන හැටියට වැඩිකල් ජීවත් වෙන එකකුත් නැහැ කියලා මට හිතෙනවා. වතුර වෙනුවටත් රා, අරක්කු බත් වෙනුවට තේ වෙනුවට මේ හැම එකකටම බොන එක තමයි විසඳුම.

ඇත්තටම මම පහලොස් වතාවකට වැඩිය පොලිසි ගිහින් වෙන් වුනා. ඒත් හැම වෙලාවකම දරුවො නිසා ආයෙත් හොඳ වෙනවා. මෙයාගෙ බීම කවද හරි නතර කලොත් එදට අපි දිනුම්. නැත්නම් කවදවත් ගොඩ එන්න බැහැ අපිට.

එයා මොනවා කලත් මගේ හිතේ තියෙන්නේ ගෙයක් දෙරක් හදගන්න. සමිතියෙ උදව්වෙන් මට ඒක කරගන්න බැරිවෙන එකක් නැහැ.

"මගේ නම රම්‍යවතී. තිත්තගල්ලේ උපන්නේ. මගේ මහත්තයා ඉන්ද්‍රසිරි. එයා කබලානේ. මහත්තයා බඳින්න ඉස්සරත් කලේ මුහුදු යන එක. ඉන්ද්‍රසිරිට සහෝදර සහෝදරියන් හය දෙනෙක් හිටියා. කොග්ගල ඔයේ ඔරු රේස් එකක් තිබුනා. ඒ ඔරු රේස් එක බලන්න අපිත් ගියා. එහෙදි තමයි ඉන්ද්‍රසිරි මුලින්ම මට මුණ ගැහුනේ. මෙයින් පස්සේ ඉන්ද්‍රසිරි අපේ ගෙදරත් ආවා. අපේ අම්මා ඉන්ද්‍රසිරිට අකමැති වුනේ නැහැ. ඒත් නිතර යන එන කොට මගදි තොටදි හමුවෙන කොට අකමැති වුනා. මම බලාගන්න එක අම්මට කරදරයක් වුනා. ඒක නිසා අම්මා දවසක් ඉන්ද්‍රසිරිට කිව්වා මාව ගෙදර එක්ක යන්න ගෙනිහින් බැඳගන්න කියලා. අපේ ගෙදර හිටියේ අම්මයි මමයි විතරයි. තාත්තත් නැහැ. ඒ නිසා අම්මා බයයි. මට මොනවා හරි වේය කියලා. ඒකයි අම්මා ඉන්ද්‍රසිරිට මාව එක්ක යන්න කිව්වේ. ඉන්ද්‍රසිරි මාව එයාලයි මහ ගෙදර එක්ක ගියා. මහත්තයාගෙ පවුලේ සහෝදර සහෝදරියන් 06 දෙනෙක් හිටියා. අපි කාලයක් මහ ගෙදර පදිංචි වෙලා හිටියා. ඒත් අපිට ඕන වුනා අපිටම කියලා ගෙයක් හදගන්න. ඒත් මුදල් නැතිකම නිසා අපි හරි අපහසුවකට පත්වෙලායි හිටියේ. මේ කාලෙදි අපට ජනසවි සහනාධාරයලැබුනා. ජනසවි සහනාධාරය යටතේ ඉතුරු කරගත්ත මුදලින් අපි ඉඩම් කැබැල්ලක් ගත්තා. පුංචි ඉඩමක්. පර්චස් 4 1/2 පමණ. ඒකේ අතු අතුරල පොඩි මඩුවක් හද ගත්තා. මේ අතු මඩුවේ අපි කාලයක් ජීවත් වුනා. මහත්තයා මුහුදු යාම රස්සාවට කරත් මාස හයක් මුහුදු රස්සාව නැති වුනාම වෙනත් කුලී වැඩ කරනවා. ගෙවල් හදන තැන්වල අත්වැඩ දෙනවා. මේ වැඩ කරන කොට අඳුනගත්ත මහත්තයෙක් හිටියා. මේ මහත්තයා ඉන්ද්‍රසිරිට හරි හිතවත්. ඉන්ද්‍රසිරි ඉන්න ගේ බලන්නත් ආවා. අපි ඉන්න හැටි දැකල හරි දුක හිතිලා අපිට උදව් කරන්න කැමති වුනා. මහත්තයාගේ මාර්ගයෙන් ඒ මහත්තයා අඳුනන යුදු මහත්තයෙක් අපිට ගෙයි බිත්ති බැඳ ගන්නයි වහල හදන්නයි මුදල් දුන්නා. ඒ සල්ලි වලින් අපි ගෙයක් හදගත්තා. ඒත් ගෙට කුස්සියක් නැහැ. ගෙයි ජනෙල් දෙරවල් ගැහුවෙත් නැහැ. වැසිකිලික් හැදුවෙත් නැහැ. අපේ දරුවො වැසිකිලියට යන්නේ මහ ගෙදරට. පාසැල් යන දවසට ඒක හරි වදයක් වුනා. ඉන්ද්‍රසිරි ධීවර රස්සාව කරාට කියක් හරි ඉතුරු කරගන්නවා. මේ ගේ හැදුවට පස්සේ ගෙට මොනව හරි ගන්න ඔන කියලා මට හිතුනා. මම මහත්තයාට කිව්වා ටී.වී. එකක් ගනිමු කියලා. ඒකට මහත්තයාත් කැමති වුනා. අපේ ළමයි ටී.වී. බලන්න පිට තැන්වල යන එක නතර කරන්න ඕන නිසා. අපි ටී.වී. එකක් ගෙනාවා. මහත්තයා මුහුදු ගියාම දරුවො ඉස්කෝලේ ගියාම ගෙදර තනියම මම ඉන්නේ. මගේ පාලුව යවා ගන්න මම ටී.වී. බලනවා හැර වෙන කරන්න දෙයක් නැහැ. මහත්තයාගේ උත්සාහය නිසා කොහොමහරි දවසට කියක් හරි හොයා ගන්නවා. ඒ නිසා අපි කන්නෙ බොන්නේ අමාරුවෙන් හරි පිරිමහ ගත්තා. මේ අතරෙදි සිට්ටුවක් දැම්මා. ලොතු

දුව ගැන හිතලා. මේ නිසා ගේ දෙර අඩුපාඩු හදගන්නත් බැරි වුනා. දරුවන්ගේ පාසැල් ගමනටත් මුදල් ඕන. ඒවායේ අඩුපාඩුවක් තිබ්බේ නැහැ. අපේ දුව මේ අතරෙදී ලොකු ළමයෙක් වුනා. අපි දල තිබුණු සීට්ටුව ලොකු හයියක් වුනා. ඒක මදිවුන නිසා කඩෙන් ණයටත් බඩු ටිකක් ගත්තා. උත්සවය ඉවර වුනාට පස්සේ අපි ඒ ණය බේරල දැම්මා. ඉන්ද්‍රසිරි ධීවර රැකියාවට අමතරව ඉතිරි මාස 06 පොල් ලී අහින්න වගේ කුලී වැඩ වලටත් යනවා. එයා අරක්කුත් බොනවා. සිගරට්ටුත් බොනවා. ඒ වුනත් මටවත් දරුවන්ට වත් කිසිම කරදරයක් නැහැ. එයා බේබද්දෙක් විදියට හැසිරෙන්නත් නැහැ.

මගේ බලාපොරොත්තුවක් තියෙනවා සමිතියෙන් ණයක් අරගෙන ගෙයි ඉතිරි වැඩ ටික කරගන්න. සමිතිය අපේ පවුලෙ දියුණුවට උදව් කරනවා. අපි වගේ ගොඩක් අය එකතු වෙලා තමයි මේ සමිතිය පටන් ගත්තේ. දැන් බොහෝ දෙනෙක්ගේ අඩුපාඩු හදගෙන සමිතිය නිසා.

පවුල් ප්‍රකාශ අංක 21

"මම ප්‍රේමා ජයවර්ධන. ගම මානවිල. මගේ මහත්තයා පාල ඉන්නේ මිපේ. යෝජනාවක් මගින් අපි විවාහ වුනේ. 1980 අවුරුද්දේ පාලගේ රැකියාව බයිසිකල් අලුත්වැඩියා කිරීම. නමුත් විවාහ යෝජනාව කරන කොට නම් කිවේ පාලට තේ අක්කර 02 ක් තියෙනවා කියලා. අපේ අම්මලා රැවටුනා. මේ බොරු වලට. ඒ කැමැත්ත නිසා තමයි මට පාල බඳින්න වුනේ. මම ඇවිත් බලන කොට ඕනවට එපාවට හැදෙන තේ පැල 10 ක් විතර තිබුණා. අඩුම ගානේ වැසිකිලියක්වත් තිබුනේ නැහැ. පුංචි ගෙයක් තිබුනේ. පාලගේ අයියත්, බැඳපු නෝනත් එහේ පදිංචි වෙලා හිටියේ. අපේ තාත්තා මාව බලන්න ආපු වෙලාවක මම අඩ අඩ විස්තරය කිව්වා. අපේ තාත්තත් හරියට බොනවා. තාත්තා ආවම පාලගේ අයියත් එක්ක එකතු වෙලා හොඳටම බොනවා. එහෙම බීගෙන නන් දෙඩවනවා. ඔවුන්ගේ පොහොසත්කම බලවත්කම ලොකු නෑදැයෝ ඉන්න එක. මේව ගැන තමයි කථා කරන්නේ. මේවා අහල අපේ තාත්තා රැවටෙනවා. රැවටිලා හිතන්නේ මම බොරු කියනවා කියලා. තාත්තා ඒවා අහලා සතුටු වෙලා යනවා. මගේ දුක කියන්නවත් කෙනෙක් නැහැ. අපේ වටේට තියෙන්නේ බොරුව, වංචාව. මටනම් මේ එකක්වත් පේන්න බැහැ. මොනවා කරන්නද? බැඳගත්ත බෙරේ ගහන්නත් එපාය. අපේ මහත්තයා වින්කලේ වැඩ කරනවා. නමුත් අයියා බීගෙන ඇවිත් බොරු වෙරි අරගෙන මල්ලිගෙන් සල්ලි අරන් යනවා. පාලටත් ඕන මහ පවුල හා එහි අඩුපාඩු ගැන විතරයි. මේ වලෙන් ගොඩ ගන්න එයාට ඕන කමක් නැහැ. අපිට දරුවෙක් ලැබුනේ මේ කාලෙදී. එහෙම වෙලාවට වැසිකිලියක් ඕනමයි. ඒත් ඒ පහසුකම මට නැහැ. මට තියෙන ලොකුම අඩුපාඩුව වැසිකිලියක් නැති එක.

එක දවසක් රෑ මට වැසිකිලි යන්න උවමනා වුනා. එද වැසි දවසක්. මම තෙම් තෙම් වැසිකිලියට දුවලා ගියා. පොල් අතු සෙවිලි කරපු වල වැසිකිලියක් තිබුනේ. වැසිකිලි ගිහින් එළියට එනවිට මගේ ඇගේ සීතලට දැනුනා. වැස්සත් නිසා මම හිතුවා තෙමිලා කියලා. පස්සේ බලන විට මගේ ඇගේ සීතලට දැනුනේ ඇඟපුරාම පනුවෝ. මට ඉබේටම කෑගැහුනා. වරුසාවෙම ඇඟ හේදුවා. ඒ ඇතිවෙච්චි හිරිකිත මට තවමත් මතකයි. ඒ වෙලාවේ මට ඇතිවුනු දුක වේදනාව කියලා නිම කරන්න බැහැ. රැයක් නොනිද අඩ අඩා නිදිමරා ගෙන කල්පනා කරා. මොනවා කරන්නද කියලා. මම හිතා ගත්තා ඔක්කොම වැඩ තියෙද්දි කොහොම හරි වැසිකිලියක් හදගන්න ඕන කියලා. ඊට පහුවදම උදේම ගඩොල් කපන්න ගත්තා. ගඩොල් කපලා එකතු කරලා වැසිකිලියක් හදගත්තා. මට පුදුම ධෛර්යයක් ආවේ. ඒ උවමනාව සපුරා ගන්නතුරු මගේ උත්සාහය නතර වුනේ නැහැ. වැසිකිලිය හදල නිම කරලම තමයි මම සැහිමකට පත් වුනේ. ඒකෙ ලොකු දිනුමක්. මම මගේ දරුවො තුන් දෙනත් එක්ක ජීවත් වෙන්න නොගත්ත උත්සාහයක් නැහැ. අපේ මහත්තයා එතරම් උනන්දුවක් ඇති මනුස්සයෙක් නෙවි. හැමදෙයක්ම සොයා බලන්න ඕන මම. වින්කලේ අයිතිය අයියටත් තිබුනා. ඒත් වැඩියෙන් වැඩ කරන්නේ පාල. ලාභයේ වැඩි කොටසක් ගන්නේ අයියා. මේකෙන් අපේ පවුලේ දියුණුවක් ලබන්න කවදාවත් බැහැ. ඒ නිසා මම ගෙදර ගිහින් අපේ තාත්තාට මේ ගැන කිව්වා. තාත්තට කියලා වෙනම වින්කලයක් දමා ගන්නයි ඕනකම තිබුනේ. පසුව තාත්තා ඒකට කැමති වෙලා අපිට වින්කලයක් දලා දුන්නා. තාත්තා දල දුන්න වින්කලයේ පාල වැඩකලා. එයාගේ නම් හම්බ කරන්න කිසිම ඕනකමක් නැහැ. උදේට දවල් වෙනකම් නිද ගන්නවා. දවල්වෙලා තමයි වින්කලේට යන්නේ. සමහර දවසට දවල්ටත් කාලයි වැඩට යන්නේ. රෑ දෙගොඩ හරියක් වෙනකම් පාල ටී.වී. බලනවා. මම මේ දවස්වල ඉදියප්පන් හදල කඩවලට විකුණනවා. ඒකෙන් කියක් හරි හම්බ වෙනවා. දර ලිපේ තමයි ඉදියප්පන් තම්බන්නේ. දවල්ට ඉදිආප්ප තම්බන්න දර සොයන්න ඕන. දවල් දවසට සමහර දවසට ඒ සඳහා ගතවෙනවා. උදේ 3.00 ට විතර ආයිත් නැගිටින්න ඕන. නැගිටලා ඉදිආප්ප කඩවලට දන්නේ. හවස ඉඩක් තිබුනොත් ටිකක් නිද ගන්නවා. රෑ 12 වෙනතුරු පිටි තම්බලා බැදලා සකස් කරනවා. උදේට ඉදිආප්ප තම්බන්න දරුවොත් මට උදව් කරනවා. මහත්තයත් සමහර දවසට උදව් කරනවා. මේ ව්‍යාපාරෙන් ලැබෙන ආදයමෙන් අපි ගෙදර දෙරේ අඩුපාඩු පිරිමසාගන්නවා. දරුවන්ට උගන්නනවා. ණය ගෙවනවා. අපේ මරුණු ආච්චිගේ දනය දෙන්න සිද්ධ වුනා. අපිට සල්ලිත් නැහැ. ගෙදර මේ ගැන කථා කලාම මහත්තයා කිව්වා ඒ දිනේට පන්සලට දනයක් දෙමු ගෙදරට හාමුදුරුවරු වඩම්මන්නේ නැතිව. පන්සලට ගෙනිහින් දෙන්න කියලා. නමුත් මම මේකට කැමති වුනේ නැහැ. අපිත් ගමේ හැම එකකටම යනවා. යහළු මිත්‍රාදීන් ඉන්නවා. ඒ ගොල්ලන්ටත් කෑම වේලක් දෙන්න ඕනනේ. ඒ නිසා දනය ගෙදර දෙන්න ඕන කියලා මම හිතුවා. එහෙම හිතලා මහත්තයා කියපුදේ නොසලකා මම ගෙදර දනයක් දෙන්න සූදනම් කලා. ඒත් ඒ වියදම බලන කොට මට සල්ලි නැහැ. ඒ නිසා රු. 20000/- ණයට ගත්තා. අතමාරු ගන්න කෙනෙක් හිටියේ නැහැ. ඒ

නිසා ණය ගත්තේ පොලියටයි. එහෙම අරගෙන දනය හොඳට දුන්නා. ඒ නිසා අපි ණය වුනා. දැන් ණය ගෙවන්න දහදුක් විඳිනවා. මහත්තයා හැමතිස්සෙම මේක ගැන මතක් වෙනකොට දෙස් කියනවා. මම ඉදිආප්ප හදලා ගන්න මුදල් වලින් වැඩි කොටසක් ණය ගෙවනවා. මේ දනෙ නිසා අපි හරි අමාරුවක තමයි වැටුනේ. මේ දවස්වල තමයි මට ගාමන්ට් එකේ ඉදිආප්ප ඕඩරය ලැබුනේ. ඒකෙන් මුදල් එකවර ලැබෙන නිසා ගේ හදන්නත් පටන් ගත්තා. දරුවන්ගේ පාසැල් ගමනට ඒ අඩුපාඩු වලට ගොඩාක් වියදම් කරන්න ඕන. අපිට හම්බ කරන එකෙන් ඉතිරි කරන්න නම් බැහැ. දහසකුත් අඩුපාඩු කම් මැද්දේ අපි බොහොම අමාරුවෙන් ජීවත් වෙනවා.

පවුල් ප්‍රකාශ අංක 22

"මම ලිලියන්. මට අයියලා හතර දෙනයි. මට වැඩිමල් අක්කලා දෙන්නයි. අපේ තාත්තා බිස්නස් කරන කෙනෙක්. මම ඉස්කෝලේ ගියේ සාමාන්‍ය පෙළ දක්වා විතරයි. මම විභාගය ගත්තේ නැහැ. තාත්තා ගෙදර කඩයක් දැම්ම නිසා. තාත්තාට උදව්වට ගෙදර නැවතුනා. අපි ගෙදර හරි සතුටින් හිටියා. අඩුපාඩු තිබුනේ නැහැ. කාලයක් යනකොට අපේ තාත්තා බිස්නස් වලින් වැටුනත් අයියලා ටික කරගෙන ගියා. පස්සේ කාලෙක අපේ තාත්තා අසනිප වෙලා අන්ත්‍රා වුනා. ඊට පස්සේ මම ආදර සම්බන්ධයක පැටලුනත් කුලභේද ප්‍රශ්නය නිසා අපේ ගෙදරින් අකමැති වුනා. මම කොහොම හරි හරියයි කියලා හිතුවා. ඒක නිසා ගෙදර නොබැඳ ඉඳපු අක්කටත් වඩා ඉස්සරවෙලා මම දීගෙක දුන්නා. 1968.06.27 මම විවාහ වුනා.

මහත්තයලගේ අක්කලාගේ ගෙදර මම නවත්තලා මහත්තයා රක්ෂාවට ගියා. මහත්තයාගේ මුලු ගෙදරටම වියදම දරණ නිසා මට දෑවැද්දට දීපු මුදලුත් ටික ටික ඉවර වුනා. ඊට පස්සේ මම මහත්තයාට කිව්වා ගෙදර යමු කියලා. අපි ගෙදරට අවශ්‍ය භාණ්ඩත් අරගෙන අද මේ ඉන්න ගෙදරට ආවා. මේ ගෙදරදි ලොකු දුව මට හම්බ වුනා. ලොකු දුවට අවුරුදු 1 1/2 ක් වන විට මහත්තයාගේ ගෙදරට ආවා. මටයි දරුවටයි මහත්තයා ගෙදර නැති නිසා පවුලේ උදවිය වෙනස්කම් කලා. ඒ නිසා මට තනියම ඉනන බැරි බව මහත්තයා දැක්කා. එයා රක්ෂාවෙන් අස්වෙලා ගෙදර ආවා. ටික කලක් රැකියාව නොකර ඉඳලා මහත්තයා නැවතත් කොස්ලන්දේ ගියා. ගිහින් වෙළඳම් කරා. ආයෙත් මා දෙවැනි දුවව ලැබෙන්න ආවා. මහත්තයගේ බිස්නස් නතර වුනා. ආයෙත් ගෙදර ඇවිත් නතර වුනා. මහත්තයගේ ගෙදර ඇවිත් ඉන්න කොට කන්න බොන්න විදියක් නැති වුනා. මට දෑවැද්දට දීපු බඩු විකුණලා කෑවේ. බිව්වේ. නැවතත් මහත්තයා රේස් තුණ්ඩු ලියන්න ගත්තා. කුලියට. ඒකත් අඩපන වුනාම ගෙදර ඉඳගෙන වෙළඳම් කරන්න කියලා. මට අම්මලා දෑවැද්දට දීලා තිබුන අල්මාරිය විකුණලා සල්ලි දුන්නා මහත්තයාට. ඒත් ඒක පාලනය කර ගන්න නොතේරෙන නිසා ඒ බිස්නස් එකත්

ඉවර වුනාට පස්සේ මහත්තයා කරන රැකියාවක් අඩපනවුනා. දරුවෝ හිටිය නිසා බඩගින්නේ ඉන්න බැහැ. දරුවන්ටත් උගන්වන්න ඕන නිසා මම ලෙලි තලලා කොහු අරගෙන ලණු ඇඹරුවා. මගේ සහෝදරයෙක් මට උදව් කලා. ඊට පස්සේ ටික කාලයක් යනකොට මම විදේශික අයට ඇඳුම් මැහුවා. ඒකෙන් දරුවන්ට ඉගැන්නුවා. ඊට පස්සේ ප්‍රශ්න වලට උත්තර සොයන්න මම විදේශගත වුනා. එතකොට දුව උසස් පෙල කරා. මම නැති අතරේ එයා ආදර සම්බන්ධයක පැටලිලා. මම එයාට නතර කරන්න කිවුවා. ඒත් නතර කරේ නැහැ. ඊට පස්සේ ගාල්ලේ සර්වෝදයේ කම්පියුටර් පන්තියක ඉගැන්නුවා.

මම රට ඉන්න වෙලාවේ මගේ මහත්තයා දරුවෝ බලාගත්තා. හැබැයි මම හම්බ කරපු මුදල් වලින් සතයක්වත් ඉතිරි කරලා තිබුනේ නැහැ. මම රට ඉන්න දවස්වල මගේ බාල දුවත් පිරිමි ළමයෙක් එක්ක සම්බන්ධයක් පටලවාගෙන. මම ගෙදර එනකොට මගේ දුවලා දෙන්නම ආදර සම්බන්ධයක. මට දැන් හිතෙනවා දරුවෝ දලා රට ගිය නිසා තමයි එයාලට එහෙම වුනේ කියලා.

මම රට ඉඳලා 1989 නැවතත් ගෙදරට ආවා. මම එනකොට අපේ අම්මා නැතිවෙලා. මගේ දුවලා ආදර සම්බන්ධයක පැටලිලා. පොඩි දුවත් පිරිමි ළමයාට කැමැති නිසා පොඩිදුව ලොකුදුවට වැඩිය ඉක්මණට බන්දලා දුන්නා. ඒ කාලේ ලයිට් නැතිනිසා රට ඉඳලා මට බඩු ගේන්න බැරි වුනා. බඩු ගේන්න පුලුවන් වුනත් හම්බ කරපු මුදල් සේරම ලංකාවට එවපු නිසා. මගේ පුතා දැන් වඩුවැඩ රක්ෂාව කරනවා. වඩු මඩුවක වැඩ කරන්න ගියාම දැන් එයා බැඳලා ඉන්න නෝනා හමුවෙලා තියෙන්නේ. සම්බන්ධයක් තිබුනට මම දැනගෙන සිටියේ නැහැ. යාලුවෙලා මාසෙකට පස්සේ ලේලිත් එක්ක ගෙදර එනකොට තමයි මම දන්නේ.

මගේ පොඩි දුවත් දැන් ගෙදර ඉන්නේ. එයාට දුවෙකුත් ඉන්නවා. එයාගේ මහත්තයා මානසික ලෙඩෙක් වුනාට පස්සේ මම එයාත් දුවත් ගෙදරට ගෙනාවා. දුව ටික කලකට පස්සේ විදේශගත වුනා. එයා ආයෙත් වියදම් අපට එව්වා. මගේ පුතා පිට තැනක තමයි රැකියාව කලේ. මගේ හිතේ තිබුනා පුතාට තනියම මේ ව්‍යාපාරය කරගෙන යන්න පුලුවන් කියලා. එයාට උදව් කරන්න ඕන නිසා කියලා. මම ඉසුරු සමිතියට සම්බන්ධවෙලා රු. 20000/- ක ණයක් අරගෙන පුතාට බීරලු කපන්න මැෂින් එකක් අරගෙන දුන්නා. ඒ ණය පුතා ගෙව්වා. ඒ මැෂින් එකෙන් වැඩකරා. මෙහෙම ඉන්දෙද්දි හේලි එකෙන් අපට බුරුසු වලටම්ට් කපලා රට යවන්න ඇනවුමක් ලැබුනා. ඒක ඉක්මණට කරගෙන යන්න ඕන නිසා මම සමෘද්ධි බැංකුවෙන් රු. 22500/- ක හා මහජන බැංකුවෙන් 25000/- ක ණයක් ගත්තා. රුහුණු සංවර්ධන බැංකුවෙන් රු. 40000/- ක්ද ගත්තා. ඊට පස්සේ ව්‍යාපාරය අබලන් වුනා. එහෙම ගිහින් ව්‍යාපාරය ගොඩගත්තා. පුතාලගේ මාමාගෙන් රු. 100000/- ක් ණයට ගත්තා පොලියට. ඒත් ව්‍යාපාරය

පාඩුපිට තමයි ගෙනගියේ. ණය ගෙව්වත් ණයවලට අවශ්‍ය මුදල් හොයන්න විදියක් නැහැ. දැන් ව්‍යාපාරය හොඳටම අඩපනයි. දැන් ඉතින් එදිනෙද කරන රැකියාවෙන් ණය ගෙවනවා. දුව රට ඉඳලා ඇවිත් කුකුලන් ඇතිකරන එක කරා. එයා රට ගිහින් උපයපු මුදලින්.

එයාට ඒ ව්‍යාපාරය පටන් ගත්තා විතරයි. ලංකාවට විදේශිකයන්ගේ ගමන නැවතුන නිසා උතුරේ යුද්ධය නිසාත්. ගුවන් තොටුපොලට බෝම්බ ගහලා සිද්ධියෙන් පස්සේ. ඒත් එක්කම සංචාරක හෝටල් වලින් කුකුල් මස් ඉල්ලුම අඩු වුනා. කුකුල් මස් මිලදී නොගත්තත් කුකුලන් ඇති කිරීම අප කරා. කුකුලු කෑම මිලත් ඉහළ ගියා. ඒ ව්‍යාපාරයෙන් මුදල් ඉපයුවත් සමිති වලින් ගනිපු ණය ගෙව්වා. පුතාට වඩුවැඩ රැකියාව දැන් හරිම පාඩුයි. ඒක නිසා කුකුල්ලු පැටව් ගේන්න කෑම ගන්න මුදල් නැතිකම නිසා ඒ ව්‍යාපාරය වැටුනා. දැන් මට ඕන මේ ණය බරින් නිදහස් වෙන්න. මම දැන් ඉන්නේ මේ සමිතියෙන් හරි ණයක් අරගෙන මේ බර නිදහස් කරගන්න ඕන. දැන් අපි කඩෙන් කන්නෙත් පොතට. මුදල් අතේ ගැවසෙන්න නැති නිසා ණයට කනවා. ඒකත් අපිට හරි බයක්. මේ ණය බර නිසා බිල්වත් ගෙවන්න විදියක් නැහැ. මගේ ණය ටික ගෙවා ගන්න ලැබෙනවා නම් මට හරිම සහනයක්. සමිති කිහිපයකින් ණය අරගෙන තියෙන්නේ. එක් එක් සමිතියේ තියෙන පොලී අනුපාතය වෙනස්. පොලී මුදල් තමයි දරන්න බැරි. මම බලාපොරොත්තු වෙනවා මේ සමිතියෙන් හරි ණයක් අරගෙන මේ සියල්ල බේරගන්න.

පවුල් ප්‍රකාශ අංක 23

"මම ශිරානි. මගේ මහත්තයා කිත්සිරි වසන්ත. අපි වැල්ලද්දරගොඩ ගමේ දැනට පදිංචිව සිටියත් පුංචි කාලේ පදිංචි වෙලා හිටියේ වැල්හේන්ගොඩ හන්දියේ ප්‍රධාන පාර දෙපැත්තේ. පුංචි කාලේ ඉඳලා අපි දෙන්නා හොඳට දැනහැඳින ගෙන සිටියේ. පුංචිම කාලේ ඉඳලා අපි සෙල්ලම් කලෙත් එකට.

කිත්සිරි මට කිව්වේ කිත්සිරිගේ අම්මාගේ ප්‍රේම සම්බන්ධයකින් ලැබුන දරුවාලු කිත්සිරි. ඒත් එයාගේ අම්මා විවාහවෙලා ඉඳලා තියෙන්නේ ඇවැස්ස මස්සිනා සමඟ. කිත්සිරිගේ අම්මා විවාහ වෙන්න කලින් ඒ බව බාප්පට කිව්වලු. කිත්සිරි බාප්පගේ දරුවෙක් නොවන බව. ඒ බව දන්න නිසා බාප්පා කිත්සිරිට වෙනස්කම් කරලා. එයාට දෙවන ශ්‍රේණියට පමණයි පාසැල් යවලා තියෙන්නේ.

කිත්සිරිට සහෝදරයෝ හතර දෙනෙක් හිටියත් බාප්පා එයාව මෙහෙකාරකමට යවලා තිබුණා. තමන්ගේ වයසට වඩා වැඩ කරන්න වුන නිසා ගෙවල් තුනකටම මාරුවෙලත් ආයෙත් ගෙදර ඇවිත්. මේ දේවල් අපේ ගෙදර අය දැනගෙන හිටියේ නැහැ. කිත්සිරි වඩු මඩුවක් තිබුන මුදලාලි කෙනෙකුට දීලා පොතුවිලට ඇරලා වැඩ පුරුදු කරන්න. අපේ අම්මලා, තාත්තලා

පුංචි දවස්වල ඉඳලා කිත්සිරිට අනුකම්පා නොකරපු නිසා මටත් නොදැනිම මට කිත්සිරි ගැන ආදරයක් ඇති වුනා. මම 10 වෙනි ශ්‍රේණියේ ඉන්න දවස්වල අපේ ගෙදර අය අපේ සම්බන්ධය ගැන දැනගත්තම අපට ආශිර්වාද කලා. ටික කලයක් යනවිට කිත්සිරිට ගෙදරින් ප්‍රශ්න වැඩිවුනා. මාව පාසලෙන් අස් කරලා කිත්සිරිට විවාහ කරලා දුන්නා. අපි බැඳලා අපේ ගෙදරම පදිංචි වුනා. මම පාසලෙන් අස්කරනවාට ගුරුවරු කැමති වුනේ නැහැ. ඒ වුනත් කිත්සිරිගේ ගෙදරින් එයාට ප්‍රශ්න තිබුනු නිසා තමයි මමත් ඒකට කැමති වුනේ.

අපි අපේ දෙමාපියන් ළග පදිංචි වෙලා ඉන්න දවස්වල තමයි අපිට නිවුන් ළමයි දෙන්න ලැබුනේ. අපේ ගෙදර තිබුනේ මහ පාරට ළග. ඒ නිසයි අපේ ව්‍යාපාරය දියුණු වුනේ. දරුවෝ දෙන්නට මාස පහක් වුනා විතරයි මගේ වැඩිමල් සහෝදරයා අපිව ගෙදරින් පැන්නුවා. අපට යන්න තැනක් තිබුනේ නැති නිසා කිත්සිරිගේ බාප්පගේ ගෙදරට ගියා. ගිහින් ගෙයි පැත්තකට වෙන්න වඩු මඩුවක් හදගෙන අපි අපේ පාඩුවෙ ඉන්නකොට බාප්පා නැවතත් අපිව එළියට දැම්මා. අපි ආයෙත් අපේ මහ ගෙදර ගියා. එහෙම ඉන්න කොට තමයි මගේ මාමා හබරාදුවේ හැඩි වත්තේ ඉඩමක් අරගෙන ගෙයක් හදගන්න කියලා කිව්වේ. මාමා අපිව උනන්දු කල නිසාත්, මගේ සහෝදරයා කරන නොයෙක් අකටයුතුකම් නිසා අපි කතා කරගෙන අපේ තිබුණ රු. 100000/- ක මුදලක් අරගෙන ඉඩම මිලදී ගන්න ගියා. අපි ගන්න ගිය ඉඩමට ඉදිරියෙන් තිබුන ඉඩම දැකලා මාමා කිව්වා ගන්න හදන ඉඩම පුංචි නිසා ඉදිරියෙන් තියෙන ඉඩම ගන්න කියලා. අපිත් ඒකට එකග වෙලා අනාගතේට ඒක හොඳයි කියල හිතලා හිතවත් දෙන්නෙකුගෙන් 20% ගානේ රු. 40000/-, 15= ගානේ රු. 30000/- අරගෙන රු. 70000/- හදගෙන අපි ඉඩම ගත්තා. ණය මුදල දෙන වෙලාවෙදිනම් කිව්වේ ලැබෙන විදියකට ගෙවන්න කියලා. සල්ලි හදිසි නැහැ කියලා.

ටික කාලයකින් මගේ අම්මා සදකාලිකව වෙන්වෙලා ගියා. වෙනදට වඩා පවුලේ බර මට දරන්න වුනා. මම ගෙදර වියදම් කලේ කිත්සිරි හම්බ කරපු සල්ලි වලින්. මේ නිසා පොලියට ගත්ත සල්ලි වල පොලී වැඩිවුනා. ඒ වන විට මම දැනගෙන හිටියේ නැහැ කිත්සිරි රු. 70000/- ගත්තේ පොලියට කියලා. අපිට පොලියවත් දෙන්න බැරිවුන නිසා එක හිතවතෙක් සල්ලි ඉල්ලලා කරදර කරා. පස්සෙ ගෙදර ඔප්පුව තියලා තවත් කෙනෙකුට 8% පොලියට උගස් කරලා රු. 50000/- ක් ගත්තා. කිත්සිරි ඒ සල්ලි අරගෙන තිබුනේ පොරොන්දු සින්නක්කරයක් මත. ඉඩම ගනිපු මුදලට පොලි දරන්න අපිට බැරිවුනාම එයට එකම විසඳුම විදියට අපි දැක්කේ හබරාදුවෙන් ගත්ත ඉඩම් කොටස. ඒ මුදලටම විකුණන එක. කොහොම හරි රු. 50000/- පොලි මුදලක් කලින් ගත්ත රු. 40000/- කොටසුත් පොලිත් එක්ක ගෙව්වට පස්සේ කිත්සිරි රු. 6000/- විතරක් අරගෙන ගෙදර ආවා.

පස්සෙ මගෙ තාත්තත් නැති වුනා. තාත්තගේ අවසන් කටයුතු කරන්න රු. 10000/- ක් 20% පොලියට ගත්තා ඒ පොලී මුදලුත් අපට දෙන්න බැරි වුනා. මේ මොන ප්‍රශ්න ආවත් කිත්සිරි කරපු රස්සාව අමතක කලේ නැහැ. ඒක අමතක කරානම් අපිට කන්න නැති වෙනවා. පස්සේ අමාරුවෙන් ලී අරගෙන බඩු හැදුවට වැඩක් වුනේ නැහැ. ඒ හදපු බඩු පොලියට මුදල් ගත්ත අය අරගෙන ගියා. ඒ ප්‍රශ්න නිසා දරුවොත් එක්ක තුන්වේලටම රොටි පුච්චගෙන කාලා තමයි අපි හිටියේ.

පස්සෙ මගේ අම්මයි, තාත්තයි, මාමයි මලාට පස්සේ මහගෙයි අයිතිය දරුවෝ තුන් දෙනාට බෙදන පොරොන්දුව මත ගේ විකුණලා. මගේ කොටසට හිමි මුදලින් මේ දැන් අපි පදිංචි වෙලා ඉන්න පර්චස් 25 ක කොටසක් ගත්තෙ. ඒත් අපිට තවම අර පොලී බර නම් එහෙමමයි. කිත්සිරි හම්බකරන මුදලින් තාමත් රු. 25000/- ක මුදලට 20% පොලිය ගෙවනවා. මම සමෘද්ධි සමිතියෙන් රු. 5000/- ක් මුදලක් අරගෙන තවත් මාසේ මුදලින් කොටසකුත් ගෙව්වා. තවත් පොලී මුදලාලිට දෙන්න ඕන නිසා මම පුංචි ව්‍යාපාරයක් පටන් ගත්තා. උදේට ඇගලුම්හල්වල වැඩ කරන අයට ඉදිආප්ප හදලා දරුවන්ගේ පංති වියදම හරි එකතුකර ගන්නේ. වැඩියෙන් ඇනවුමක් එහෙම ආවම කිත්සිරිගේ මව උදව් කරනවා.

අපි දැන් එකම තීරණයකට එළඹුනා. ඒ තමයි මුලදී ගන්න ගිය ඉඩම අතේ තිබුන මුදලට ගත්ත නම් මේ තරම් පොලී ගෙවන්න වෙන්නෙ නෑ කියලා. දරන්න බැරි මුදලක් පොලියට ගත්ත නිසා කනබොන මුදලුත් පොලියට දීලා තමයි අපි මේ තරම් දුප්පත් වෙලා තියෙන්නේ.

පවුල් ප්‍රකාශ අංක 24

"මම ඉන්ද්‍රා සරෝජිනී. මම විවාහ වුනේ රෝඩ්නි සමග. රෝඩ්නි අපේ ගමේ කෙනෙක්. නිතර නිතර අපි මුණ ගැහුණා. නමුත් අපේ සම්බන්ධයට දෙපැත්තේම දෙමව්පියන් කැමති වුනේ නැත. අපි ගෙවල්වලට හොරෙන් යාළුවෙකුගෙ ගෙදර ගිහින් නතර වුණා. ඊට පස්සේ අපේ ගෙදර ආවා. අම්මලා අපට ගොඩක් බැන්නා. දෙස් කියල පස්සේ අපි විවාහ කරල දුන්නා. කසාද බැන්දත් අපි හිටියෙ අපේ දෙර. ටික කාලයක් අපේ ගෙදර හිටියා. මහත්තයා විතරක් එයාලයි මහගෙදර ගියා ආවා. නමුත් මම ගියේ නැහැ. ඒත් ඒ අයගේ අමනාපයක් තිබුණේ නැහැ. ඒ නිසා අපි මහත්තයාගේ මහගෙදර ගියා පදිංචියට. නමුත් ටික කලක් යන කොට එක එක ප්‍රශ්ණ නැන්දම්මට අපි කැවත් වැරදියි. බිව්වත් වැරදියි. හිනා වුනත් වැරදියි. නිද ගත්තත් වැරදියි. හරි අමාරු වුණා එහේ ඉන්න. ආයෙත් අපේ ගෙදර යන්නත් මට හිතුණේ නැහැ. අපිටම කියලා තැනක් තිබුණ නම් කියලා කිහිපවරක් හිතුණා. අන්තිමට කරන්න දෙයක් තිබුණේම නැහැ. අපේ ගමේ හිටියා ඉඩ කඩම් තියෙන මුදලාලිකෙනෙක්. එයා මුණ ගැහෙන්න

මම ගියා. අපි එයා හොඳට හඳුනනවා. අපේ අසරණකම නැතිබැරිකම ඔක්කොම කියලා අපිට ඉන්න අතුපැලක් හදගන්න ඉඩමක් දෙන්න කිව්වා. එම ඉඩමෙ පුංචි ගෙයක් හදගත්තා. ඒකේ පදිංචි වුණා. කොතරම් අගහිග තිබුණත් අපි සතුටින් හිටියා. ඒත් ඉතින් කවදාවත් මේ ඉඩම මේ ගේ අපිට නොලැබෙන බව නම් අපි දන්නවා. මෙහෙම ඉන්න අතරෙදි අපිට පුතෙකුත් ලැබුණා.

මහත්තයාගේ නංගි කෙනෙක් කඩයක් දාගෙන හිටියා. ඒ කඩේ හොඳට වෙළඳාම් කෙරුණා. ලාභ තිබුණා. මේ දවස්වල මගේ මහත්තයා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනියම් සේවකයෙක් විදියට උණ බම්බු ගේට්ටුවක වැඩ කළා. දවසින් වැඩි කාලයක් ගත කරන්නේ නිකම්. ඒ වගේම පඩිත් අඩුයි. මේ දවස්වල මහත්තයාගේ නංගිලාට කොළඹ යන්න සිද්ධ වුණා. හදිසියෙම. ඒ අයගෙ සිල්ලර කඩේ මගේ මහත්තයට කිව්වා බාර ගන්න. මහත්තයට ඉඩ කඩ තිබුණ නිසාත් ලැබෙන ආදායම අඩු නිසාත් මහත්තයා ඒකට කැමති වුණා. කැමති වෙලා අපි ඔක්කොම ඒ කඩ කාමරයේ පදිංචි වෙලා කඩයක් කරගෙන හිටියා. අපි හිටපු ගේ මහත්තයාගේ මල්ලිට දුන්නා බලාගන්න කියාලා. අපිට ඕන වේලාවට ආයිත් ඉල්ලගන්න. අපි කඩය කරගෙන එහිම ජීවත් වුණා. මේ අතරෙදි අපි නොහිතපු දෙයක් සිද්ධ වුණේ. මහත්තයාගේ නංගිගේ මහත්තයා හදිසි අනතුරකින් නැතිවුණා. එයාටත් කරන්න දෙයක් නැතිව ගියා. ඒ නිසා එයා කොළඹ පදිංචිය අත් හැරල ගමේ පදිංචියට ආවා. දරුවනුත් එක්ක. එයාට ජීවත් වෙන්න විදියක් නැති වෙලාවේ. අපි එයාලයි කඩය තවදුරටත් කරන එක හරි නැහැ නේද කියලා අපි හිතුවා. අපි කර කර හිටිය කඩය නංගිට දුන්නා. අපේ ගේ මල්ලිට දීලා තිබුණේ අපි ඒක ඉල්ලුවා. නමුත් ඒක මල්ලි අපිට ද දුන්නේ නැහැ. අපේ දරුවො දෙන්නත් දැන් හැම තැනම ඇවිදල ඇවිදල කඩ කාමරයක් අපි සොයා ගත්තා. බිම වැලි, වහල තාර ෂීට්, චූටි කෑල්ලක් විතරයි පවුලකට තියා දෙනනෙකුටත් ඉඩ මදි. දැන් ඉන්න තැනකුත් නැහැ. කරන්න රස්සාවකුත් නැහැ. මහත්තයා මුහුදු යන්නත් පටන් ගත්තා. ඒක කරේ කුලියට. ඒක අපිට ජීවත් වෙන්න මදි. ඒ නිසා මොකක් හරි කරන්න ඕන කියලා අපි නිතරම කථා කළා. ඒත් සල්ලි හම්බ කරන්න සල්ලි ඕනනේ. රාජා අයියා අපේ ගමේ සල්ලි පොළියට දෙන කෙනෙක්. අපි එයාගෙන් රු. 10,000/- ක් ඉල්ල ගත්තා. ඒකෙන් තැඹිලි විකුණන්න පටන් ගත්තා. ඒ ව්‍යාපාරයෙන් ඒ හැටි ආදායමක් ලැබුණේ නැහැ. ණය ගෙවා ගන්නත් බැරි වුණා. ඇත්තටම ඒ සල්ලිවලට මොණවා වුණාද කියලා අපිම දන්නෙත් නැහැ. ලොකු පුතාට පුංචි කාලේ ඉඳල පොතක කිය කිය හරි දැම්මා. ඒකෙ රු. 5000/- මේ වන විට තිබුණා. ඒක අරගෙන රු. 4500/- ක් පොළි ගෙව්වා. ඉතිරියක් කිල තිබුනේ එච්චරයි. අන්තිමට ඒකත් ගත්තා. මේ ගෙදරට ආවත් හරි අපි නැතිවුණත් හරි. හරිම මූසලයි. කරන කිසිම දෙයක් හරි යන්නෙත් නැහැ. මේ ගෙදර අපි හතර දෙනෙක් ඉන්නවා. මමයි දුවයි තියන එකම ඇඳේ බුදිය ගන්නවා. මහත්තයා මැස්සේ බුදිය ගන්නේ නැහැ. වැලි බිමේ පැදුරක් දමා ගෙන බුදිය ගන්නවා. පුතා කොනක

මැස්සක් හද ගෙන බුදිය ගන්නවා. දරුවො අඬනවා වෙලවකට මෙතන ඉන්න පුළුවන්ද කියලා. ලොකු පුතා සාමාන්‍ය පෙළ විභාගය ගත්තා. එයා සමත් වුණත් උසස් පෙළ කරන්න කිසිම උවමනාවක් කරේ නැහැ. අඩු පාඩු නිසා අපිත් උනන්දු කරේ නැහැ. හරියකට අඳින්නවත් අඩු පාඩු දෙන්නවත් අපිට හයියක් නැහැ. හම්බ කරන එකෙන් වේලක් ඇර වේලක් කනවා මිස වෙන යමක් කරන්න බැහැ. අපි හදගෙන හිටිය අතු පැලේ නම් වැසිකිළියකුත් හද ගත්තා අමාරුවෙන්. ඒ මොකක්වත් දැන් අපිට අයිති නැහැ. ඉඩමක් ගන්න සල්ලිත් නැහැ. ඉන්න තැනක් ඇත්තෙත් නැහැ. අපේ ගෙදර දැන් කිසිම සමගියක් නැහැ.

මම හැම තිස්සෙම මහත්තයට දෙස් කියනවා. අපේ ගේ මල්ලිට දීපු නිසානේ අපිට මෙහෙම වුණේ කියලා. අපිට කිසි කෙනෙක් උදව් කරන්නේ නැහැ. අපිට ඉන්න තැනක් නැහැ. ආදයමක් නැහැ. කවද හරි අපේ මේ ප්‍රශ්ණයට පිටි පස්සේ තියෙන මහ මුහුද විසඳුමක් වේද කියලත් මට හිතෙනවා.

පවුල් ප්‍රකාශ අංක 25

"මගේ නම නදීරා රංගනී. පදිංචි වෙලා ඉන්නේ පියදිගම නැගෙනහිර. අපේ තාත්තා බයිසිකල් වැඩපළක් දගෙන හිටියේ. ඒකෙන් ලැබුණේ හරි සුළු ආදයමක්. එයින් තමයි අපේ පවුලම ජිවත් වුණේ. මට මල්ලිලා දෙන්නෙක් සහ නංගී කෙනෙක් සිටියා. අපි ඔක්කොම පාසැල් යන වයසේ පසු වුණා. තාත්තගේ බයිසිකල් වැඩපළේ නිතර නිතර යන එන පුද්ගලයෙක් සිටියා. ඔහු ගමේ කෙනෙක් වුවත් රැකියාව කළේ ගමෙන් පිට පුද්ගලික වැඩපළක. නමුත් වැඩ හැරී ගෙදර ආ විගසත්, නිවාඩු දිනවලත් කාලය ගත කරන්නේ අපේ තාත්තගේ බයිසිකල් වැඩපළේ. බයිසිකල් වැඩපළ තිබුණේ ගේ ඉස්සරහ. තාත්තගේ හිතවත් කමට මොහු ගෙදරටත් යන්න එන්න ගත්තා. මෙයා ඉගෙන ගත් කෙනෙක් නිසා අපිට පාඩම් කියා දෙන්න කියලා තාත්තා එයාට පැවරුවා. මටත් නංගිටත් මල්ලිලා දෙන්නටත් ඔහු පාඩම් කියා දුන්නා. කාලයක් ගත වුණා. කාලයක් ගත වෙද්දී නොදැනුවත්වම අපි දෙන්නා අතර ලෙන්ගතුකමක් බැඳීමක් ඇති වුණා. දෙදෙනාට දෙදෙනා නොදැක ඉන්න බැරි තත්ත්වයක් ඇති වුණා. මේ අයුරින් අපි යාළු වුණා. අපේ මේ වෙනස දෙමව්පියන්ටත් දැනුනා. නමුත් ඉගෙන ගත් කෙනෙක් නිසාත්, රැකියාවක් කරන කෙනෙක් නිසාත්, දෙමව්පියන් අකමැත්තක් තිබුණේ නැහැ.

එයා අපේ ගමේමයි. ගෙවලුත් එක ලඟ. එයා ගෙදරට වඩා ඉන්නේ අපේ ගෙදර. මේ අපි අතර බෙහෝ දේවල් සිද්ධ වුණා. මොහු නිසා මට දරුවෙක් ලැබෙන්නත් හිටියා. මේ බව දැනගත් දෙමව්පියන් අපි විවාහ කරල දුන්නා. විවාහ වුනාට හිටියේ අපේ ගෙදරමයි. එයාගේ

දෙමව්පියන්ද මෙයට කැමති වුණා. ඒත් දරුවෙක් ලැබෙන්න හිටි නිසා. මම එයාලයි ගෙදර හිටියෙ නැහැ. මම බඳින විට වයස අවු. 21 යි. පාසැල් ගමනත් මගේ නතර වුණා. මේ සිද්ධිය නිසා. කසාද බැන්දේ අම්මා කෙනෙක් විදියට. මම ඔහු විශ්වාස කළනිසා ඔහු කියන හැම දෙයකටම එකග වුණා. දින සති මාස ගණන් ඉකුත් වුණා. මට දරුවා ලැබෙන විට ඔහු රාගල එළවළු වගා කරමිනුයි සිටියේ. ගමේ සිටියදී වගේ නෙවි දැන්. මසකට දෙතුන් වරක් පමණයි පැමිණියේ. දරුවටත් මටත් වියදමත් දෙනවා. ගෙදර ආවත් නතර වීමට එතරම් උවමනාවක් නැහැ. ඉක්මණින් ආපසු යන්නමයි අදහස. මේ අතරෙදි මට තව පුතෙක් ලැබුණා. මේ වන වටත් මහත්තයා රාගල තමයි හිටියේ. මාසයකට දෙකකට වරක් ගෙදර ඇවිත් යනවා. දරුවන්ටත් මටත් වියදම දෙනවා. පුත්තු දෙදෙනාට පසු මට නිවුන්නු දෙන්නෙක් ලැබුණා. දුවයි පුතයි. දැන් දරු 4 දෙනෙකුගේ මවක්. මහත්තයා දරුවන් ලැබුණාම ආවා. වියදමත් දෙනවා. ඒත් එයා දැන් දෙන මුදල අපි පස්දෙනෙකුට ජිවත් වෙන්න මදි. ලොකු ළමයි පාසැල් යවන්නත් ඕන. හරි අමාරුවෙන් තමයි මේ දවස්වල අපි ජිවත් වුණේ. අම්මල තාත්තල අපිට උදව් කරා. ඒ උදව් නිසා තමයි අපි කොහොම හරි බඩගින්නේ නොඉඳ ජිවත් වුණේ. මේ වන කොට මහත්තයාගේ ගෙදර එන ගමනත් ටික ටික අඩු වුණා. මාස දෙකකට තුනකට වරක් තමයි ගෙදර එන්නේ. ගෙදර දෙරේ අඩු පාඩු එමටයි. කරන්න දෙයක් නැහැ. අම්මලාගෙන් මේ උදව් හැමදම ඉල්ලන්නත් බැහැ. පසුව සොයා බැලුවා මොකක්ද මොහු කරන්නේ කියලා. මොහුට රාගල තවත් ගැහැණියෙක් සිටින බවත්, ඔහු වැඩ කරන තැන සොරකම් කරන බවත් දැනගන්නට ලැබුණා. මෙයාගේ වැරදි වැඩ ගැන ගොඩක් තොරතුරු ආරංචි වුණා. රාගල වැඩ කරපු තැනින් සොරකම් කරපු නිසා රැකියාවෙන් අස් කර බවත් පසුව ආරංචි වුණා. අවුරුද්දකින් පමණ ඔහු ගෙදර ආවේ නැහැ. ඒත් මේ ආරංචියෙන් පසු ගමේ ඇවිත් සිටින බවත් සැලවුණා. ගමේ සේදිරිස් ලියන මහත්තයා ලග රැකියාවක් කළා. ඊට පසු එතැනත් සොරකමක් කරලා අසුවුණා. ඒ නිසා රැකියාවෙන් අස් කළා. රැකියාව නැතිව කාලයක් සිටියා. මේ අතරෙදි මෙයාගේ වැරදි වැඩ ගැන නොයෙක් කථා ගමේ පැතිරුණා. මගේ නැති බැරි කම් අතරට මේවත් එකතු වුණා. දරුවො හතර දෙනෙක් ජිවත් කරවන්න මම දහදුක් වින්ද. මගේ දෙමව්පියන් නොහිටින්න අපි ඔක්කොම මැරිලා. මේ අතරට මේ මිනිහගේ මේ ජරා කථා අහල එයා ගැන අනුකම්පා කරන්නවත් පිළිගන්නවත් මට හයියක් ඕනකමක් තිබුණේ නැහැ. පුදුම තරහකින් මම සිටියේ. හැම ජරා වැඩක්ම කරලා ගෙදර ඇවිත් තව බොරුත් කියවනවා. ඉවසන්න බැරි තැන මම ගෙදරට එන එක නතර කළා. දරුවන් බලා ගන්න අම්මට දීලා මම කොග්ගල නිදහස් වෙළඳ කලාපේ රැකියාවකට ගියා. ඒකවත් නිදහසේ කරන්න මේ මිනිහා මට ඉඩ දුන්නේ නැහැ. මගතොට ඉඳගෙන තර්ජනය කරනවා. මම අමාරුවෙන් හම්බ කරගත් මුදලින් ගත් ඇඳුම් මගේ ඉදිරියේ දමා පිළිස්සුවා. මේ හැල හැප්පිලි මැද්දේ මාස දෙක තුනක් මම නිදහස් වෙළඳ කලාපයේ රැකියාව කළා. මේක මහ වදයක් වුණා. කරන්නේ මොනවද කියලා රෑ දවල් හිතන්න

වුණා. රැකියාව නොකර ඉන්නත් බැහැ. රැකියාවට යන්නත් බැහැ. මේ මිනිහගේ වැඩ නිසා. ගෙදර දෙරේ අඩුපාඩු දකින කොට පිස්සු හැදෙනවා. අම්මලාගේ උදව් නිසා මෙහෙම හරි ජීවත් වෙනවා. වෙන කරන්න දෙයක් නැති නිසා. රට යන්න මම තීරණය කළා. තාත්තගේ උදව් ඇතිව මම කුවේට් රටේ ගෘහ සේවිකාවක් හැටියට රස්සාවක් කළා. ඒ අතරෙදී මගේ දරුවො බලා ගත්තේ මගේ දෙමව්පියෝ. සහෝදර සහෝදරියෝ. මහත්තයානම් එයාගේ වැඩ පිළිවෙල අත්හැරලා නැහැ. වැරදි වැඩ තමයි එයාගේ ජීවිතය. මට දැන ගන්න ලැබුණේ එහෙමයි. අවුරුදු දෙකහමාරක් රට ඉඳලා ලංකාවට ආවා. මේ අතරතුරේදී මගේ සැමියා වස බීලා මැරුණා. මිනිය භාර ගන්න මට සිද්ධ වුණා. මිනිය භාරගෙන එයාගේ දෙමව්පියන්ට දීලා ඒ අය අවසන් කටයුතු කළා.

මම දැන් කුලියට ඇදුම් මහනවා. ඇඳුම් මැහීම පිළිබඳ සාමාන්‍ය දැනීමක් මට තිබුණේ. මගේ අම්මා කළෙත් ඇදුම් මැසීම. ඒ නිසා ඒ පිළිබඳ දැනුමක් මටත් තිබුණා. මම මැෂිමකුත් ගත්තා. තාත්තට අම්මට සලකන්නත් පුළුවන් වුණා. අපි ඉන්න මේ ගේ තාත්ත මට ලියල දුන්නා. ගෙදරට අවශ්‍ය උපකරණ ටිකකුත් ගත්තා. මම රට ගිහින් හම්බ කරපු සල්ලිවලින් කකා බිබී නිකම් හිටියේ නැහැ. කුලී ඇදුම් මහල සල්ලි හම්බ කළා. දරුවන්ගේ කටයුතු සඳහා ගෙදර දෙර වියදම් සඳහාත් ඒ ආදයම අරපිරිමැස්මෙන් වියදම් කරනවා. මගේ දරුවන් මට පුළුවන් තරම් හොඳින් හැදුවා. අඩු පාඩු නැතුවා නොවේ. ඒත් නැති බැරිකම හොඳින් දන්නවා. තාත්ත සැළකු හැටි දරුවො දන්නවා. එයාලට හොඳ සිරිත් මම උගන්නල තියෙනවා. හැමදම මමත් දරුවනුත් තෙරුවන් නමදිනවා. දරුවො රෑ නින්දට යන්නේ මගේ දෙපතුල ලග වැඳ වැටිලා. මගේ එකම බලාපොරොත්තුව මේ දරුවන්ට හොදට උගන්වල හොඳ මනුෂ්‍යයෝ කරන්නයි. මට ඒක කරන්න පුළුවන් වේවිය කියන ආත්ම විශ්වාසය මට තියෙනවා. මම දැන් කුලී ඇදුම් මැහිම තමයි රස්සාව. මම උදේ මැෂිම ලග ඉඳගන්නේ තෙරුවන් නැමදල දෙවියන් සිහි කරලා. මට මේ රම් ප්‍රශ්ණ ඇවිල්ලත් ඒවාට මුහුණ දීලා ඒවා විසඳගෙන අද මේ තත්ත්වයට එන්න පුළුවන් වුනෙත් මගේ ආත්ම විශ්වාසය නිසයි.

පුහුණු වැඩමුළු පහ තුළම ඉදිරිපත් වූ පවුලේ කථා පුවත්වල සාමානතාවයන් මෙන්ම අසමානතාවයන් ද දක්නට ලැබුණි. එහෙත් සමස්ථයක් වශයෙන් එම කථා ප්‍රවෘත්ති තුළ මෙන්ම ඒවා පදනම් කරගෙන ගොඩ නැගූ සාකච්ඡාවන් තුළින් පවුලේ වර්තමාන සංවර්ධන ක්‍රියාවලිය සඳහා බලපා ඇති බොහෝ හේතු සාධක හඳුනා ගැනීමටත් ඒවා විචාරශීලිව සාකච්ඡා මණ්ඩපය තුළදී දකින්නටත් ලැබීම පවුල තුළ නව සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කිරීමේ සමාරම්භක අවස්ථාවක් විය. කෙසේ වෙතත් මෙම ඉදිරිපත් කිරීම් ක්‍රියාවලිය තුළ පහත සඳහන් අංග ලක්ෂණ දක්නට ලැබුණි.

01. මුළු ජීවිත කාලය පිළිබඳ සලකා බැලූ විට සැමියා හා බිරිඳ එක්ව සහභාගි වූ පළමු වැඩමුළුව මෙය විය.

02. එමෙන්ම තමන්ගේ පවුල් ජීවිතයට පෞද්ගලික වූ මෙබඳු කරුණු ප්‍රසිද්ධියේ විමසුමකට කල්කළ පළමු අවස්ථාව ද මෙය විය.

03. ඇතැමෙක් තමන්ගේ පෞද්ගලික තොරතුරු ඉදිරිපත් කිරීමට ආරම්භයේදී මැලිකමක් දැක්වූහ. එහෙත් ඉදිරිපත් වූ අයගේ පෞද්ගලික කරුණු විග්‍රහ වීමේදී ඒවා ප්‍රකාශ කිරීමේ පෞද්ගලික වාසි සහගත බව දුටු නිසා සෙසු අයද මැලි කමක් නොදක්වා වැසී ගිය අතීතය විවරකොට ඉදිරිපත් කළහ.

04. බොහෝ අයගේ විවාහයත් සමග ගැටළුද ආරම්භ වේ. ඇතැම්විට එක් ගැටළුවක් විසඳී හමාර වූ වන විට තවත් ගැටළුවක් ආරම්භ වීම සුලභව දකින්නට ලැබුණි.

05. බොහෝ අය ද දරුවන්ගේ ඉඩම්, නිවාස, ඥාතීන්, දෙමාපියන්, සහෝදර සහෝදරියන් හා මුදල් පදනම් කරගත් ගැටළු සමුදයකට ඇතුලත්ව සිටියහ.

06. සමස්ථයක් වශයෙන් නිවස තුළදී අපටද දැකිය හැකිවූයේ අසහනයෙන් අඳුරෙන් පිරුණු පරිසරයකි.

07. විවාහයේ ආරම්භක පසුබිම හෝ ආරම්භය සතුට සොම්නස පදනම් කරගත්තක් විය. එහෙත් එය අනපේක්ෂිත දුක් දෙම්නස් සමුදයකට ක්‍රමයෙන් අවතීර්ණය විය.

08. මෙබදු කථාබහකට ලක්වීම පමණක් වුවද බොහෝ අයෙකුට මහත් අස්වැසිල්ලක් විය. දැඩි හැගුම්බර වූවන්ද දක්නට හැකිවිය.

09. දැන හඳුනා ගැනීමෙන් බොහෝ අය විවාපත්ව සිටියහ.

10. බහුතරයකගේ ඉඩම් අයිතිය නිරවුල්ව නොපැවතුනහ.

11. සමාජ අනුකරණය නිසා ඉක්මණින් දියුණුවීමට ගොස් වැඩි වේගයෙන් පහත වැටුණු අය ද විය.

12. මූලික ආදායම් මගකට පවුල වෙනුවෙන් නියුක්ත නොවූ ගෘහ මූලික පිරිමින්ද මේ අතර විය.

13. පවුල පිළිබඳ අවබෝධයකින් සැලකිල්ලකින් ඕනකමකින් කටයුතු නොකළ නාස්තිකාර කාන්තාවන් ද විය.

14. අසනිප විදේශ ගත වීම්, එදිනෙද පාරිභෝජනය, ණය බේරුම් කිරීම, පොළී ගෙවීම්, වැනි කටයුතු සඳහා ගිනි පොළියට ණය ගැනීම ද සුලභ ලක්‍ෂණයක් විය.

15. මත්පැන් පානය මෙන්ම සූදුව ද පවුලේ සංවර්ධන ක්‍රියාවලිය අඩපන කරන්නක් විය.

16. පවුල විසින් හඳුනාගත්, ආරම්භ කළ බොහෝ ව්‍යාපාර අතර මග බිඳ වැටීම ද එනිසා ආරක්‍ෂක අපහසුතාවයට පත්වීම ද සුලභ ලක්‍ෂණයක් විය.

17. කෙරුණු කථාබහ, විග්‍රහ කිරීම් විසඳුම් මගකට යොමු වීම සියළුම දෙනාට නවතම අත්දැකීමක් විය.

## බිරිඳ සැමියා පිළිබඳවත්, සැමියා බිරිඳ පිළිබඳවත් කරන ලද ප්‍රකාශනයන්.

විවාහයෙන් ඇරඹෙන පවුල් ජීවිතය පිලිබඳ මූලික තොරතුරු ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ විග්‍රහයන් නිමවීමෙන් පසු සකස කරන ලද ආකෘති පත5යක් මඟින් බිරිඳ සැමියා පිළිබඳවත්, සැමියා බිරිඳ පිළිබඳවත් කරන ලද ප්‍රකාශයන් පෞද්ගලිකව ලබාගන්නා ලදි. එකිනෙකාගේ යහපත් චර්යාවන් හා දුබලතාවයන් මෙම ප්‍රකාශයේ සඳහන් කෙරුණි. එහෙත් මෙම තොරතුරු පෞද්ගලික මට්ටමින් විමසුමට භාජනය නොකරන ලද අතර සමස්තයක් වශයෙන් පොදු ලේඛණයක සටහන් කොට විමසුමට භාජනය කරන ලදි. ඒවා පහත සඳහන් පරිදි කොටස් 4 කින් යුක්ත වේ.

(1) සැමියාගේ යහපත් චර්යාවන්
(2) සැමියාගේ දුබලතාවයන්
(3) බිරිඳගේ යහපත් චර්යාවන්
(4) බිරිඳගේ දුබලතාවයන්

(1) බිරිඳ විසින් ප්‍රකාශිත සැමියාගේ යහපත් චර්යාවන්

(1) මගේ දෙමාපියන්ට දරුවන්ට හරිම ආදරෙයි.
(2) වැරදි පෙන්නල දුන්නම අහගෙන ඉන්නව මිසක් රණ්ඩුවට එන්නේ නෑ.
(3) උදේන්ම නැගිටල ආහාර පිළියෙල කරන්න උදව් වෙනවා.
(4) මත්පැන් පානය කරන්නේ නෑ.
(5) කිසි දවසක රණ්ඩු වෙන්නේ නෑ.
(6) ගෙදර වැඩට උදව් වෙනවා.
(7) රස්සාවෙන් ලැබෙන සල්ලි ටික මට ගෙනත් දෙනවා.
(8) ළමයින්ගේ අධ්‍යාපනය ගැන සොයා බලනවා.
(9) අමාරුවෙන් වුනත් ළමයින්ටත් මටත් බඩගින්නෙ ඉන්න දෙන්නෙ නෑ.
(10) ගෙයක් හදාගන්න උනන්දුයි.
(11) ගෙදරට වතුර ටික ගෙනත් දෙනවා.
(12) නිවාඩු දිනවල ගෙදර වැඩ වැඩියෙන් කරනවා.
(13) අරපිරිමැස්ම හොඳයි.
(14) ගෙවත්ත වගා කරනවා.
(15) නෑදෑයන්ට හරිම ලෙන්ගතුයි.

(16) දරුවනුත් මමත් ආදරයෙන් රැකබලා ගන්නවා.

(17) ගෙදර වියදම් ගැන මා එක්ක කථා කරනවා.

(18) රැකියාව ඉතා උනන්දුවෙන් කරනවා.

(19) කේන්තියාම අඩුයි.

(20) ගමේ හැමදෙනා සමඟම හොඳින් ඉන්නවා

(21) වැඩ ඇරිලා ආවාම දරුවන් බලාගන්නවා දරුවන් සෝදනවා.

(22) අනවශ්‍ය වියදම් කරන්නේ නැ ඉතිරි කිරීමට ඕනෑකමක් තියෙනවා.

(23) ගෙදර බඩු ටික ගෙන එන්නේ එයා. ඒ ගේන්නෙත් මං එක්ක කථා කරලා

(24) ආදායම මදි හින්දා තවත් සුළු ආදායම් මාර්ග පටන් ගන්නවා.

(25) දියුණු වෙන්න හරිම උත්සාහ වන්තයි.

(26) අවංකයි නීතිගරුකයි.

(27) කඩයප්පන් හදන්න උදව් කරනවා.

(28) පවුලේ ප්‍රශ්නයක් ඇතිවුනාම දෙන්න එක්ක කථා කරනවා.

(29) හරිම කරුණාවන්තව ගෙදර අයටත් පිට අයටත් කථා කරනවා.

(30) ගේදොර පිරිසිදුව තබාගන්න උදව්වෙනවා.

(31) දිනපතා බුදුන් වඳිනවා

(32) මට අසනීප වුනාම හැම වැඩක්ම කරනවා.

(33) වැඩ ඇරුණාම වෙන කොහෙවත් නොගිහින් ගෙදර එනවා.

(34) ඥාතීන්ට උදව් කරනවා.

(35) ඕන තීරණයක් ගන්නේ මාත් එක්ක කථා කරලයි.

(36) ඇඳුම් ඕන වේලාවට අහල ගෙනත් දෙනවා.

(37) අපිත් එක්ක හරියට යාළුවෙක් වගෙයි වැඩ කරන්නේ

(38) වැඩි අධ්‍යාපනයක් නොලැබුවාට ඕනෑම අයෙකුට ගුරුහරුකම් දෙනවා.

(39) වැරදි වැඩට බයයි

(40) දරුවන් සමාජයට හොඳට බාරදෙන්න ඕන කියලා නිතර කියනවා.

(41) දෙපැත්තෙම අම්මල තාත්තලට එකවගේ සලකන්නයි උපදෙස් දෙන්නෙ.

(42) නිතර කියන්නේ දරුවන්ට අපි ආදර්ශමත් වෙන්න ඕන කියලා

බිරිඳ විසින් ප්‍රකාශිත සැමියාගේ දුබලතාවන්.

(1) රැකියාවක් හොයාගන්නවත් කරන්නවත් උනන්දුවක් නෑ.
(2) ළමයින්ගේ අධ්‍යාපනය ගැන ඒතරම් උනන්දුවක් නෑ.
(3) මත්පැන් වලට සිගරට් වලට ලොකු වියදමක් දරනවා.
(5) ආදායම් ප්‍රමාණවත් නැති නිසා රැකියාවට අමතරව යමක් හොයාගන්න කිසිම උනන්දුවක් නැහැ.
(6) ලැබෙන ආදායම කීයද කියල කියන්නෙ නෑ. කිවොත් බීපු ගාන අහුවෙනවා.
(7) මං එක්ක කිසිම දෙයක් හොඳින් කථාකරන්නේ නෑ.
(8) ඉඩමේ ගෙවත්තේ වැඩට කිසිම උනන්දුවක් නෑ.
(9) ඕනවට වඩා දරුවන් හුරතල් කරනවා.
(10) අනාගතය ගැන හිතන්නේ නෑ.
(11) මට හොරෙන් පොලියට සල්ලි ගන්නවා.
(12) නිතරම යාලුවන්ගෙ කීමටයි, ගෙදර වැඩ ගැන හිතන්නෙ නෑ.
(13) එයාට නොකියා පොඩි වැඩක්වත් කරන්න බෑ. එහෙම වුනොත් ගෝරි
(14) හැමවෙලාවෙම ලෙල්ලට තදවෙලා.
(15) නිතරම දරුවන්ටත් මටත් බැන වදිනවා.
(16) නිතරම ඉන්නෙ බුම්මාගෙන ඒ නිසා ගෙදර සතුටක් නෑ.
(17) කිසිම පිරිසිදු කමක් නැහැ
(18) ඉතිරි කරන්න ඕනකමක් නෑ.
(19) සමහර වැඩ හිතුමනාපෙට
(20) ලැබෙන දේ හරියට වියදම් කරන්නෙ නෑ.
(21) පවුලේ දියුණුව ගැන කථාකරන්න කැමති නෑ - නිතරම අදින්නේ පස්සට ඕව කරන්න පුළුවන් වැඩද කියලා අහනවා.
(22) වාචාල දොඩවමින් කඩපිලේ ඉන්නමයි වැඩි කැමැත්ත
(23) කථාකරල දිනන්නත් බෑ එයත් කියන්නෙ මං එක්ක ජයගන්න බෑ කියලා.
(24) ගෙයක් දොරක් හදාගන්න උනන්දුවක් නෑ.
(25) ගෙදරට බඩු ගේන කොට කථා කරලා ගේන්න තියෙනවානම් හොඳයි නමුත් හිතෙන දේවල ගේනවා.
(26) නිතරම නෑදෑයින්ගෙන් ඉල්ලාගෙන ජීවත්වෙන්නයි කල්පනාව
(27) දේපල නිරවුල් නෑ ඒක මහ වදයක් ඒ ගැන යමක් කරන්නේ නෑ.

(28) නිතරම ඉන්නේ අපේ ගෙදර නොවෙයි එයාගේ නංගිලගෙ ගෙදර

(29) ගේදොර වැඩ වලදී කිසිම සැලකිල්ලක් නෑ.

(30) සමාජෙට කැමැත්තක් නෑ මං තමා හැමදේටම

(31) නිතරම තනිවෙලා කල්පනා කර කර ඉන්නයි කැමැත්ත.

(32) දෙමව්පියන්ට සලකන්නේ නෑ.

(33) හරිම හිතුවක්කාරයි

(34) ගෙදර ඉන්න කිවාම හැමවෙලාවෙම බුදිය ගන්නවා.

(35) පපුවේ තෙත්ගතියක් නෑ.

(36) ඕන දෙයක් කථා කරන්න ගත්තම වරිතෙ ඇදල ගන්නවා මාත් ඒකට පටලැවෙනවා.

(37) අපේ අම්මගෙන් තාත්තාගෙන් මොකුත් නොලැබුණ එකක් නිතර කියනවා

(38) සමරහඳාට උයාගත්ත එක කන්න ලැබෙන්නෙත් නෑ.

## සැමියා විසින් කෙලින් ප්‍රකාශිත බිරිඳගේ යහපත් චර්යාවන්

(01) ඇය රැකියාවට ගොස් ආපසු පැමිණ ගෙදර වැඩත් ඉවර කරනවා.

(02) සියළුම දෙනා එක්ක (ගෙදරින් පිටත) සමඟියෙන් ඉන්න උත්සාහ ගන්නවා.

(03) දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ගැන සොයා බලනවා.

(04) අමතර ආදායම් උපයන්න යොමු වෙනවා.

(05) ණය බේරල නිදහස් වෙන්න දැඩි උවමනාවක් තියෙනවා.

(06) ඉතුරු කරන්නත් හරිම දක්ෂයි සකසුරුවම හොඳයි.

(07) ගෙදර සහ හැම දෙයක්ම පිරිසිදුවම තබයි.

(08) ගේ හදාගන්න මටත් වඩා උනන්දුයි.

(09) වැසිකිළියක් හදාගන්න උනන්දුවුනේ ඇයයි.

(10) අවට අය සමඟ මට වඩා හිතවත් උදව් පදව් කරනවා.

(11) නිතරම පවුලේ දියුණුව ගැන කථා කරනවා

(12) කඩිසරයි දක්ෂයි. කම්මැලි නෑ.

(13) කොරටුවේ වැඩ කරනවා

(14) සිට්ටු මඟින් ගෙදරට ගෘහභාණ්ඩ ගන්නවා.

(15) නැති බැරි වුනාට කලකිරෙන්නෙ නෑ

(16) ගෙදර එළවලු කඩෙන් නොගෙන තරමට වවාගෙන කන්නයි උත්සාහය

(17) ගෙදර අයට එකට වාඩිවෙලා කෑම කන්න දෙන්න හරිම කැමතියි.

(18) සියළුමදෙනා සමඟ සවසට ගෙදර බුදුන් වඳිනවා

(19) තේ හදාගන්න බඩු ටික ටික එකතු කරනවා.

(20) ගෙදර කුණුවලක් භාවිතා කරනවා

(21) ප්‍රශ්න තිබුණත් නිතරම හිනාවෙලයි ඉන්නේ

(22) රණ්ඩුසරුවල් නැත

(23) ගුණ යහපත්කම තියෙනවා

(24) අනුන්ගෙ ඇද කුද හොයන්න යන්නේ නෑ

(25) හැම වැඩක්ම හරි පිළිවෙලයි

(26) මගේ වැඩ වලට උදව් වෙනවා

(27) පවුලේ අයට හොඳ නරක හරි වැරදි පෙන්නා දෙනවා

(28) යුතුකම් ඉටු කිරීමට හරිම කැමතියි

(29) ගමේ පොදු වැඩටත් උදව් කරනවා

(30) අනුන්ගේ දුකේදි පිහිට වෙනවා

(31) දරුවන්ට් දොර වැඩ පුරුදු කරනවා

(32) විවේකයත් වැඩට යොදවනවා

(33) තියෙන හැටියට දෙන්නයි හරිම ඕනකම

(34) අනුන්ගෙ දුකේදි ඉක්මනට උණුවෙනවා

(36) වැඩිහිටියන්ට නෑදෑයන්ට සලකනවා

(37) දරුවන් හොඳට හදන්න හරිම උත්සාහයි

සැමියා විසින් ප්‍රකාශිත බිරිඳගේ දුබලතාවන්

(1) මගේ දෙමව්පියන්ට ලෙන්ගු කමක් සැලකිල්ලක් නැහැ.

(2) කුඩා වැරැද්දකින් වුනත් රණ්ඩුවක් පටන් ගන්නවා.

(3) ණයට ගත්ත රූපවාහිනිය බලන එක තමයි ලොකුම වැඩේ

(4) වියදමට සල්ලි මදි වුනාම මාත් එක්ක රණ්ඩු වෙනවා

(5) ළමයින්ට නිතරම සැරවැර කරනවා.

(6) සමිති ගණනාවක ඉන්න නිසා ගෙදර වැඩ ගැන ළමයි ගැන සැලකිල්ල මදි

(7) මගේ රැකියාවට උදව් කරන්නෙ නෑ. කවුරුත් යැපෙන්නෙ ඒකෙන්

(8) කොච්චර සල්ලි හොයලා දුන්නත් මගේ වැරදි හොයන්නමයි උත්සාහ කරන්නේ

(9) දරුවන්ට ඔරොත්තු නොදෙන විදියට වැඩ පවරනවා
(10) ඉක්මනින් කේන්ති ගන්නවා
(11) නිතරම කවුරුහරි එක්ක මොනවහරි දොඩ දොඩ ඉන්න තමයි කැමැත්ත
(12) අපිටත් ඉස්සෙල්ලා ඇය නින්දට යනවා
(13) නිතරම මහ ගෙදරට දුවන්නයි කල්පනාව ඒ නිසා අපේ ගෙදර නිතරම වහලා
(14) ළමයින්ගේ ඉගෙන ගන්න වැඩ සොයන්නෙ නෑ.
(15) එකම වැඩකවත් පිළිවෙලක් නෑ
(16) පිරිසිදුකම ඇත්තේම නෑ
(17) මුදල් කොච්චර ගෙනාවත් ඉක්මනින් ඉවර කරන්න දක්ෂයි
(18) මටත් හොරා පොලියට ණය ගන්නවා
(19) බැරි වුනත් අනුන් කරනදේ කරන්නමයි කල්පනාව
(20) කුඩා වැරැද්දටත් මා එක්ක රණ්ඩු වෙනවා
(21) නෑ හිතමිතුරන්ට ලෙන්ගතු කමක් නෑ කෙනෙකුට ගෙදරට එන්න කියන්නේ නෑ.
(22) තමන්ගේ වැරැද්ද කිසිදාක පිළිගන්නේ නෑ.
(23) කිසිම වැඩක් උවමනාවෙන් කරන්නේ නෑ
(24) කට සැරයි
(25) ගෙදරදොර වැඩ පිළිවෙලක් නෑ.
(26) එයාගෙ අය ගැනමයි නහින්නෙ
(27) රටගිහින් ගෙනාපු සල්ලි ටික ගැන හැමදාම දොඩවනවා
(28) මගේ අරක්කු බීමයි බීඩි බීමයි මහලොකුවට කථාකරනවා
(29) සමහර වැඩ කරන්නන් වාලේ කරනවා.
(30) ගස්කොලන් වලට ගෙවත්තට කැමති නෑ
(31) ගෙදර වැඩ ගැන නිතරම ඇ'ල්ල
(32) ව්‍යාපාර කඩා වැටුණෙ ඇගෙ ඉක්මන්කම නිසා
(33) සෝබන වැඩ ගොඩයි
(34) කට්ටිය ඉදිරියේ මාව උපහාසයට ලක්කරනවා

බිරිඳ සැමියා පිළිබඳවත් සැමියා බිරිඳ පිළිබඳවත් ලියන ලද ඉහත සඳහන් ප්‍රකාශයන් විමසුමට භාජනය කරන ලද්දේ පොදු කරුණු වශයෙනි. එනිසා ඒවායේ ඇතුලාන්තය මෙන්ම ගැඹුරද දකින්නට හැකිවිය. ඒ සඳහා සියළුම දෙනාගේ උපරිම දායකත්වයද සම්පත්දායකයන්ට ලබා ගැනීමට හැකිවිය. වඩා යහපත් බිරිඳ කෙබඳු කෙනෙක්ද වඩා යහපත් සැමියා කෙබඳු කෙනෙක්ද යන්න පොදු නිගමනයන් තුළින් හඳුනාගැනීමට ලැබීම ඉතා ශක්තිමත් අවස්ථාවක් ලෙස සටහන් කෙරුණි. බොහෝවිට කරන ලද ප්‍රකාශයන් තුළ පැවතිය යුතු නොපැවතියුතු (Positive and Nagative) තත්ත්වයන් මොනවාද යන්න සටහන්ව පැවතුනි. එනිසා එකම අවස්ථාව දෙපසකින් තහවුරු කර ගැනීමටද ඉඩකඩ ලැබුණි. වඩා යහපත් බිරිඳ / සැමියා වශයෙන් පැවැතීමට අප සියළුම දෙනාට හැකිද? යන්න සම්පත්දායකයන් මතු කරන ලද එක් අවස්ථාවකි එහිදී ඉදිරිපත්වූ ප්‍රකට අදහසක් වූයේ එම ගුණාංගයන්ද මෙහි සිටිනා අය තුලින් හඳුනාගත් නිසා එය කලහැක්කක් යන්න තහවුරු වී ඇති වගයි.

කිසිම පුද්ගලයෙකු තුළ සම්පූර්ණ නිවැරදි වූ තත්ත්වයක් හෝ සම්පූර්ණ වැරදි වලින් පිරුණු බවක් නොමැතිවීම යථාර්ථය බව සියළුමදෙනාගේ එකඟතාවය විය. ඒනිසා වැරදි ක්‍රමයෙන් නිවැරදි කර ගැනීමත් පවත්නා වඩා යහපත් දේ තවත් පෝෂණය කර ගනිමින් ආරක්‍ෂා කරගතයුතු බවත්, සමූහය තුළ සාකච්ජා කෙරුණි.

පෞද්ගලිකව සඳහන් නොකෙරුණත් තමන් තුළ පවතින දෑ, විග්‍රහය තුළ දරා ගැනීමට රහස්‍යබවින් යුතුව හැකියාවක් ලැබී තිබුණි. ඒ නිසා නිවැරදි වීමේ ඉඩකඩ ඉතා සූක්‍ෂම අන්දමින් පැවතුනි. මෙබඳු විමසීමක් මෙන්ම විග්‍රහයක් කිසිදාක සිදුනොවූ බවත්, සිදුවූයේ නම් බොහෝ දෙනෙකුගේ පවුල් මීටත් වඩා යහපත් තත්ත්වයකට පත්වන වගත් පුහුණුලාභීන් වෙතින් ප්‍රකාශ කෙරුණි.

අලුත් මාදිලියක නිරත වෙමින් තමන් තුළින් තමන්ට ඉගෙනීමට ලැබීමත් උගතයුතු අවස්ථාවන්, රැකගතයුතු අවස්ථාවන් මෙම පිරිස තුලින්ම හඳුනාගැනීමට ලැබීම බෙහෙවින් අගය කළයුත්තක් බව සඳහන් කෙරුණි.

## ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය පිළිබඳ ක්‍රියාදාමයකදී අවධානය යොමු වියයුතු කරුණු

විවාහයෙන් ඇරඹෙන පවුල් ජීවිතයේ යටගියාව විමසුමට ලක්කිරීමත් එමෙන්ම සැමියා හා බිරිඳ එකිනෙකාගේ යහපත් චර්යාවන් මෙන්ම දුබලතාවයන් හඳුනාගැනීමත් නිසා ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩසටහනක් සඳහා උචිත පසුබිම් නිර්මාණයක් සිදුවූ අතර, ක්‍රියාවලියකට අවතීර්ණය වීමේ මූලික කරුණු සාකච්ඡා කිරීම එම කාර්ය වඩාත් අර්ථවත් කරන්නක් විය. බුද්ධි කලම්භනයක් මඟින් පුහුණුලාභින්ගේද අදහස් ලබා ගනිමින් ඒ සඳහා වන කරුණු ගොනුගත කරන ලදී.

1. ගෘහයේ කටයුතු පිළිබඳ වගකීම් පැවතුම් සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම්.
2. පවුලේ ආදායම් - වියදම් හා ණය තත්ත්වයන් විමසිල්ලට භාජනය කිරීම හා යෝග්‍ය ක්‍රමෝපායන් යෙදීම.
3. ගෙවත්ත අලංකාරව පිරිසිදුව තබාගැනීම හා ප්‍රයෝජනවත්ව යොදා ගැනීම.
4. ආහාර සම්පාදනය හා පවුලේ පෝෂණය
5. මුළුතැන්ගෙය හා එහි කටයුතු
6. නිවාස ඇතුලත හා පිටත ක්‍රමවත්ව හා අලංකාරව තබාගැනීම.
7. පවුලේ සෞඛ්‍ය කටයුතු
8. පවුලේ අධ්‍යාපන කටයුතු.
9. යහපත් පුරුදු සිරිත් විරිත් හා ආගමික පරිසරය

## පළමු පුහුණු වැඩමුළුව අවසානයේ ගනු ලැබූ පොදු තීරණ

විවාහයෙන් ඇරඹෙන පවුල් ජීවිතය පිළිබඳ කථාපුවත් ඉදිරිපත් කිරීමත් ඒ පිළිබඳ විග්‍රහයත් සැමියා හා බිරිඳ වශයෙන් එකිනෙකාගේ යහපත් චර්යාවන් හා දුබලතාවන් ප්‍රකාශය තුළින් වඩාත් යහපත් බිරිඳ හා සැමියා කවුරුන්දැයි තේරුම් ගැනීමත් ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලියක අඩංගු වියයුතු කරුණු මොනවාදැයි සාකච්ඡා කිරීමෙන් පසු පුහුණුලාභින් දැඩි මානසික පිබිදීමකින් හා සැහැල්ලු බවකින් පසුවනු දක්නට ලැබුණි.

මෙම පසුබිම යටතේ පුහුණුව කෙසේ නිමකළයුතුද යන්න පුහුණුලාභීන් වෙතින්ම විමසා සිටි බැවින් අවසන් වශයෙන් පහත සඳහන් පොදු නිගමනයන්ට එළඹුනි.

1. හැකි ඉක්මනින් නිවසේ සියළු කටයුතු පිළිබඳ සැමියාත් බිරිඳත් වැඩිහිටි දරුවනුත් එක්ව කථාබහ කළයුතුය.

2. සියළුම කරුණු සැලකිල්ලට ගෙන නිවසේ කටයුතු පිළිබඳ වගකීම වැඩිහිටියන් අතර බෙදාගත යුතුය.

3. විශේෂයෙන් පවුලේ මාසික ආදායම - වියදම ලිවීමත් ඒ තුළින් මතුවන තත්ත්වයන් හඳුනාගැනීමත් ඒ අනුව ඉපයීම හා වියදම පිළිබඳ ඉදිරි කටයුතු සකස් කරගතයුතුය.

4. ඇතැම් කටයුතු සඳහා සුවිශේෂ වූ මුදලක් අවශ්‍ය නොවේ. එහෙත් බොහෝ කටයුතු සඳහා මුදල් අවශ්‍යවන බැවින් ඉපයීම් කාර්ය/කාර්යයන් ගැන වැඩි අවධානයක් යොමු කළයුතුය.

5. බාහිර සම්පත් හා මුදල් නොමැතිව කළහැකි වැඩ කොටස් වහාම ආරම්භ කළයුතුය.

6. තනිව කළ නොහැකි කටයුතු හඳුනාගෙන ඒ සඳහා සෙසු අසල්වැසියන් ගේ සහාය ලබාගත යුතුය.

7. එමෙන්ම වැඩිමනත් කටයුතු සඳහා ක්ෂේත්‍ර නිලධාරිනියගේ, ග්‍රාමීය සංවිධානයේ, සංවර්ධන පදනමේ, සහාය ලබාගත යුතුය.

8. අළුතින් ආදායම් ඉපයීමට වඩා නාස්තිවන ගිලිහියන කොටස් රඳවා ගැනීම පිළිබඳ කාර්යය ඉක්මනින් දියත් කළයුතුය.

9. පුහුණු වැඩමුළුව සඳහා සහභාගි නොවූ දූප්පතුන්ද මෙම ක්‍රමයට ඉක්මනින් ඇතුලත් කරගතයුතුය. (Social Capital)

10. තෙමසකට පසු මෙහි ප්‍රගතිය මැනබලා වැඩි දියුණුව සඳහා අවශ්‍ය දෑ කළයුතුය.

## පරිච්ඡේදය

## ...ට පසු පැවැත්වූ ප්‍රගති සමාලෝචන වැඩමුළුව

...පළමු පුහුණු වැඩමුළුවෙන් තෙමසකට පසු මෙම ප්‍රගති සමාලෝචන වැඩමුළුව පවත්වන ... පුහුණු වැඩමුළුවේදි හඳුනාගන්නා ලද අවස්ථාවක් මෙන්ම ගනු ලැබූ තිරණ කෙතරම් ...ත්මක වී ඇද්ද යන්න මෙහිදි විමසුමට භාජනය කෙරුණි.

...ච්චිතව ලබා ඇති ප්‍රගතිය ක්‍රියාකාරම් වලින් දැක්වීමට පෙර මෙම ගෘහ කළමනාකරණ ... සංවර්ධන ක්‍රියාවලියේ පුහුණුලාභින්ටම දකින්නට ලැබුණු විශේෂත්වයන් කවරේද ...මුව විමසුමට භාජනය කරන ලදි. එහිදි ඉතා වැදගත් කරුණු කිපයක් හෙළිදරව් ...ට හැකි විය. ඒවා දිර්ඝ වශයෙන් සාකච්ජා විම මෙම ක්‍රියාදාමය වඩාත් ශක්තිමත් ...ර්ථවත් කිරීමටත් හේතු විය.

... ක්‍රමයකට පවුලේ කටයුතු පිළිබඳ සොයා බැලිම අලුත්ම අදහසක් එය ක්‍රියාවට ...ස් තරමක කුහුලකින් යුතුව නමුත් හිතුවටත් වඩා ප්‍රතිඵල ලබන්න පුළුවන් වුනා.

...ර සිතා සිටියේ මේවා කළහැකි දේවල්ද යනුවෙන් නමුත් එයට අවතිර්ණ වූ පසු ...ත් කළහැකි දේවල් යන්නයි.

...විධානයක් හරහා ප්‍රථම වරට සිදුවූ සිද්ධියක් ලෙස මෙය දකින්න පුළුවන්. ඕනැම ...විධානයක මූලික කාර්යභාරය වියයුත්තේ මෙයයි කියලා දැන් හිතෙනවා. එවිට ප්‍රජා ...වල දැකිය හැකි බොහෝ ගැටළු විසඳියාවි.

- ඇතැම් පවුල්වල පවත්නා ආදායම අඩුකම ඇතුළු බොහොමයක් ගැටළු නිසා වදකාරයෙක් හා වදකාරියක් වශයෙන් සැමියා හා බිරිඳ ජීවත්වුනා. නමුත් මෙම ක්‍රමය තුලින් සමාජ සම්මතයෙන් හා නීතියෙන් එක්වූ සැමියාටත් බිරිඳටත් සහකරු හා සහකාරිය වශයෙන් ජීවත්වීමේ අවස්ථාව උදාවෙනවා.

- "වෙලාව මදි" වැඩ ගොඩක් තියෙනවා කරන්න" හැමදාම තිබුණ ප්‍රශ්නයක් නමුත් නිවි සැනසිල්ලේ අළුත් ක්‍රමය යටතේ කල්පනා කලාම කථාබහ කර තීන්දු ගත්තානම් වැඩ බෙදාගත්තාම කාලය අවශ්‍ය පරිදි වැඩ වලට ගලපා ගන්න පුළුවන් ඒවා කරන්න අමුතු වියදමක් ගියේ නෑ.

- සමහර ප්‍රශ්න තියෙනවා ඒවාට දැම්ම අතගහන්න බෑ ඒවා බරපතලයි. මුලදී පුංචි දේවල් වලින් පටන් ගන්න ඕන කියන එක ගතවූ තෙමස තුළ දකින්න පුළුවන් වුනා. ඊට පස්සේ ලොකු ගැටළුවලට අතගහන්න හයිය ලැබෙනවා විතරක් නොවෙයි පසු බිමත් සකස් වෙනවා.

- විශේෂයෙන් සැමියාගේ වැරදි හදන්න දඬුවම් දෙනවට වඩා වෙන වැඩපිළිවෙලක් නිර්මාණය කරලා ඒකට හිත යොමු කලාම ඉබේම වැරදි හරියනවා ඒ වෙනස්වීම සැද දඬුවම් සැද ක්‍රමයට වඩා සාර්ථක බව පේනවා.

- අපි හැමදෙයක්ම වගේ කළේ දරු පවුල සඳහා නමුත් කිසිදවසක දරු පවුල ගැන කල්පනා කරල හිතලා නැතුවා වගේ "මේ ප්‍රශ්න ගැටළු තියෙද්දි හදිස්සියේ අපි මළොත් කුමක් වෙයිද ? හිතාගන්න බෑ ඒ නිසා කියන්න තියෙන්නෙ කල්ගතවුනත් දරුපවුල ගැන දැනුයි හිතන්න පටන් ගත්තේ කියලා.

- ඇත්තටම සමස්තයක් විදියට ගත්තම බිරිඳතමයි මුළු ගෙදර වෙනුවෙන්ම දහදුක් වින්දෙ - දැන් හොඳටෝම ඇති ඈ ඒ වින්ද දුක් කන්දරාව දැන් දුක් විඳින්න ඕන නැහැ. අපි සියළුමදෙනා අතර වගකීම් යුතුකම් බෙදිල යන නිසා අපි සියළුමදෙනා පවුල් ගැන හිතන නිසා ඇගේ බර දැන් තරමක් සැහැල්ලු වෙනවා. ඈ වෙනදාට වඩා සතුටින් ඉදිවි කියලා මේ තුන්මාසය තුළ හිතන්න පුළුවන් වුනා. ඇය සතුටින් ඉන්නවා කියන්නේ මුළු පවුලම සතුටින්

❖ විවාහවුනේ ශාරීරික අවශ්‍යතාවයන්ටම නෙවෙයි. ඒවා පදනම් කරගත්ත මූලික සමාජ කාර්යයක් අපට පැවරුමක් විදියට ලැබිල තියෙනවා. අපි දරුවො හොඳට හදන්න ඕන එහෙම හදල සමාජයට බාර දෙන්න ඕන. නැත්නම් අපි වගකීම් ඉටු කරපු ගනයට වැටෙන්නෙ නෑ. මේ අලුත් ක්‍රමයෙන් එය ඉටුවෙනවා.

❖ දරුවා පාසැල් ගිහිල්ල හරියට ඉගෙන නොගත්තාම එක්කො මොනව හරි පුංචි රස්සාවක් හොයාගන්නවා නැත්නම් ගෙදරට වෙලා ඉන්නවා. සමහරවිට නරක ආශ්‍රයටත් වැටෙනවා. මේ ගැන අපි ඉස්සර හිතුවෙ නෑ. එයාගෙ වගකීමෙන් අපට නිදහස් වෙන්න බෑ. සමාජෙට බාර දෙනකන්. ඒ දරුවා අපේ වගකීමක්. මේ ක්‍රමය යටතේ අපට හිතන්න වෙනවා. මොකක්ද වෙන්න ඕන කියලා. අපි ගතවූ තෙමස තුළ එතැනටත් ඇවිල්ල ඉන්නවා.

❖ ගෙදර කටයුතු ගැන වැඩිහිටි උදවිය එකට එකතුවෙලා සාකච්ජා කරන එක හැමපැත්තෙන්ම වැදගත් මුදල් හොයන්න, බඩුගේන්න, ගෙවල් හදන්න, ළමයින්ගේ වැඩ, ගමන් බිමන් මේ සියල්ලම කථා බහ කරල කරන්න ඕන දේවල් කියලා පසුගිය තුන්මාසය තුළ සනාථ වුනා. ඒවායේ ඵල ප්‍රයෝජනත් හොඳින් ලැබෙනවා ගැටුම් අර්බුද හුඟක්ම අඩුයි.

❖ පුංචි නොතේරුම් කමක රැඳිලා ඉන්නවා මිසක් හැම පවුලක්ම සතුටින් හොඳින් ඉන්න කැමතියි. දියුණු වෙන්න සැප විඳින්න කැමතිය. ඒ නිසා ගමේ අනෙක් උදවියත් මේකට හවුල් කරවා ගන්න අපි කටයුතු කරනවා. ඒක අපි කළයුත්තකි.

❖ එක් එක් පවුලට තියෙන ප්‍රශ්න වලට වෙනස්කම් තියෙනවා. නමුත් බොහොමයක් ප්‍රශ්නවල හේතුසාධක සමානයි. ඒ නිසා සාමූහිකව උත්තර හිතාගන්න පුළුවන්.

❖ මේ ක්‍රමය ඉතා ඉක්මනින් ප්‍රජාව අතර පැතිර යායුත්තක් එහෙම කියන්නේ ඉක්මනින් ගරා වැටෙමින් තිබෙන ගම / සමාජය රැකගන්න හොඳ ක්‍රමයක් මේක කියලා හිතෙනවා

අනතුරුව එක් එක් පවුල පුද්ගලිකව තම පවුලේ ක්‍රියාකාරකම් වලින් ලබා ඇති ප්‍රගතිය විමසුමට ලක් කරන ලදී. බොහොමයක් පවුල්වල ප්‍රගති ක්‍රියාකාරකම් සමානව දකින්නට ලැබුණි. එබැවින්, ඒවා සියල්ල එක්රැස් කොට පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ කරන ලදී.

## ප්‍රගති සමාලෝචන වැඩමුළුව - ප්‍රගතිය ලැබූ පවුල්

වගු අංක 42

| ක්‍රියාකාරකම් විස්තරය | | ප්‍රගතිය අත්පත් කරගත් පවුල් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *1 | *2 | *3 | *4 | *5 | එකතුව |
| 1 | ආදායම් වියදම් ලිවීම | 18 | 19 | 17 | 16 | 19 | 89 |
| 2 | ආදායම් වියදම් තුලනය කර බැලීම | 18 | 19 | 17 | 16 | 19 | 89 |
| 3 | ගිලිහියන ආදායම් රඳවා ගැනීම | 8 | 7 | 5 | 8 | 10 | 38 |
| 4 | අමතර ආදායම් මාර්ග ආරම්භ කිරීම | 2 | 3 | 4 | 4 | 5 | 18 |
| 5 | ගෙවතුවගාව ආරම්භ කිරීම | 16 | 12 | 13 | 15 | 16 | 72 |
| 6 | ගෙවත්ත පිරිසිදු කිරීම | 14 | 13 | 12 | 14 | 14 | 67 |
| 7 | මත්පැන්/දුම්වැටි/රේස් අඩු කිරීම | 4 | 3 | 2 | 3 | 3 | 15 |
| 8 | දෙපස දෙමාපිය ඥාති සැලකීම | 2 | 2 | 4 | 1 | 1 | 10 |
| 9 | ගෙදර කටයුතු සාකච්ඡා කිරීම | 11 | 13 | 12 | 15 | 16 | 67 |
| 10 | වැඩ බෙදා ගැනීම | 11 | 13 | 12 | 15 | 16 | 67 |
| 11 | ළමුන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ අවධානය | 7 | 5 | 3 | 3 | 6 | 24 |
| 12 | වැසිකිළිය පිරිසිදු කිරීම | 4 | 7 | 4 | 5 | 6 | 26 |
| 13 | සාකච්ඡාකර බඩුගෙන ඒම (සතියකට) | 10 | 8 | 8 | 11 | 11 | 48 |
| 14 | සාමුහික පාරිභෝගික ද්‍රව්‍ය ගෙන ඒම | 15 | 15 | 12 | 10 | 8 | 60 |
| 15 | මුළුතැන්ගෙය පිරිසිදු කිරීම | 4 | 4 | 5 | 6 | 8 | 27 |
| 16 | මුළුතැන්ගෙය ක්‍රමවත් කිරීම | 4 | 4 | 5 | 6 | 8 | 27 |
| 17 | උණුවතුර පානයට තැබීම | 4 | 4 | 5 | 6 | 8 | 27 |
| 18 | වැසිකිළියාමෙන් පසු සබන්දමා අත සේදීම | 5 | 7 | 5 | 6 | 4 | 27 |
| 19 | බුදුන් වැඳීම විධිමත් කර ගැනීම | 4 | 4 | 3 | 5 | 2 | 18 |
| 20 | රාත්‍රි ඇඳුම්, නිවාස ඇඳුම් නිසිපරිදි භාවිතා කිරීම | 3 | - | - | 2 | 3 | 8 |
| 21 | සැමියා ගෙදර වැඩට සහායවීම. | 4 | 7 | 8 | 5 | 5 | 24 |
| 22 | පොලියට මුදල් ගැනීම නතර කිරීම | 4 | 3 | 2 | 1 | 4 | 14 |
| 23 | පොලිතින් වෙනම බැහැර කිරීම | 5 | 8 | 7 | 6 | 10 | 36 |
| 24 | කාබනික පොහොර වලක් සැකසීම | 5 | 8 | 7 | 9 | 11 | 40 |
| 25 | ගෙවත්තේ අනවශ්‍යගස් ඉවත්කර ඉඩම සැකසීම | 1 | 1 | 4 | 3 | 2 | 11 |
| 26 | සුළු ව්‍යාපාර ආදායම් වියදම් ලිවීම | 5 | 2 | 3 | 2 | 1 | 13 |
| 27 | සමිතිය පිළිබඳ වෙනදාට වඩා උනන්දුවීම | 8 | 7 | 5 | 5 | 4 | 29 |

1 ගොවියාපතන
2 වැල්අද්දරගොඩ
3 වැල්හේන්ගොඩ
4 පියදිගම නැගෙනහිර
5 මීපෙ

මෙම වගුවේ සඳහන් වන ක්‍රියාකාරකම් 27 සඳහා එක් එක් ගම්මානයේ පවුල් 20 ත් දායකවී ඇති පවුල් සංඛ්‍යාව ප්‍රකාශ වේ. ගතවූ තෙමස තුළ දායකවූ පවුල් සංඛ්‍යාව පමණක් මෙහි සඳහන් වේ. එයින් කියවෙන්නේ මීට අමතරව අදාල ක්‍රියාකාරකම් වල නියැලි තවත් පවුල් එම ගම්මානවල සිටිනාවගයි තෙමසක කාලපරිච්ජේදය පිළිබඳ සලකා බලනවිට ආරම්භයක් වශයෙන් මෙය සතුටුදායක වේ. එමෙන්ම තාමත් ක්‍රියාකාරකම් වලට නිසි පරිදි නැඹුරු නොවූ පවුල්ද මේ අතර වේ. කෙසේ වෙතත් මෙබඳු ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුලින් කිසියම් ආයතනයක් සංවිධානයක් හෝ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කරලීමට මෙම ක්‍රියාදාමය යොදාගත හැකිය යන්න සනාථ වේ.

විවිධ මට්ටම් වලින් ඉටු කිරීමට සමත්වූ ක්‍රියාකාරකම් සියල්ලම දැනටමත් විශේෂයෙන් දිළිඳු කාන්තාව පත්ව සිටිනා දුක් වේදනාවන්ගෙන් නිදහස් කරවා ගැනීම සඳහා සෘජුවම යොදවන ප්‍රායෝගික කරුණු වේ.

මේ අයුරින් ක්‍රියාකාරකම් ඇතිනොවූයේ නම් එම තත්ත්වයන් සෘජුවම හා ඒමතින් උදාවන අනෙකුත් ගැටළු කාන්තාව දැඩි ලෙස පීඩාවට පත්කරනු ලබයි.

## පස්වන පරිච්ජේදය

## සහාය ආයතන ගැලපුම හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම පසුබිම

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ විපර්යකාරක වැඩසටහන, ග්‍රාමසංවර්ධනය පිළිබඳ කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහනකි. ශ්‍රී ලංකාවේ සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ පළමු අත්දැකීම මෙය වන නිසා මෙරට සංවර්ධන ක්ෂේත්‍රයට සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය ගලපාලූ ප්‍රථම වැඩසටහන වශයෙන්ද, මෙය හඳුන්වනු ලැබේ.

හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම බිහිවූයේ 1993 වසරේදිය. ඉහත සඳහන් කළ විපර්යකාරක වැඩසටහනේ මැදිහත් කරුවන් පිරිසකගේ දායකත්වයෙන් හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ (වර්තමානයේ හබරාදූව - ඉමදූව) අඩු ආදායම්ලාභි කොහු නිෂ්පාදකයින්, සුළු ගොවීන් ඇඳුම් මැසීමේ නිරතවූවන් සුළු කම්කරුවන් වැනි පහළ තලයේ ප්‍රජාව ඔවුන්ට බලපාන සමාජ ආර්ථික ගැටළු පිළිබඳ අවදිකරවා (අවබෝධමත් කරවා) ඒ තුලින් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වීමටත් එමඟින් තමන් මුහුණපා සිටින ගැටළු වලට විසඳුම් සපයා ගැනීමටත් මූලික වශයෙන් ඉඩකඩ සලසා ඇත. මෙහිදී විශේෂයෙන් බාහිර ආධාරමත යැපෙන ස්වභාවයෙන් අත්මිදී තමන් සතු ශක්තීන් (සම්පත්) තේරුම්ගෙන ඒ තුලින් ආරම්භක සංවර්ධන ක්‍රියාකාරකම් දියත් කර ඇත. විශේෂයෙන් ණය පාරිභෝජන, අලෙවි, නිෂ්පාදන යන අංශ වලින් තමන්ට අහිමිවූ සම්පත් කන්දරාව රඳවා ගැනීමට මෙම පිරිස් සමත්වීම දිළිඳුබව

අවම කරලීම සඳහා වන නව යථාර්ථවාදී සංවර්ධන ක්‍රියාදාමයක ආරම්භයක් වී ඇත. මෙම නව සංවර්ධන ක්‍රියාදාමය අත්දැකීම් රැසක් ලබාදීමටත් තමන් පත්ව ඇති අනෙකුත් සමාජ ආර්ථික ගැටළු වලින් නිදහස් වීම සඳහා නව මාවතක් හිමිකරදී ඇත. සුළුවෙන් ආරම්භවූ මෙම නව සංවර්ධන ක්‍රියාදාමය ව්‍යාප්තවීම තුළ කුඩා කණ්ඩායම් වශයෙන් පමණක් පැවති ආයතනික ස්වරූපය ප්‍රමාණවත් නොවීම මෙම පිරිස මුහුණපෑ එක් ගැටළුවකි. එබැවින් ගම්මාන පදනම් කර ගනිමින් කුඩා කණ්ඩායම් කිපයකින් සැදූම්ලත් ග්‍රාමීය සංවිධාන ගොඩනඟාගෙන ඇත.

පසුකාලීනව මධ්‍ය සංවිධානය වශයෙන් මෙම ග්‍රාමීය සංවිධානවල එකතුවෙන් ප්‍රාදේශිය සංවිධානය බිහිවී ඇත. එය හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම ලෙස හඳුන්වනු ලැබේ.

මෙම සංවිධානය ක්‍රියාකාරී බවින්ම නිත්‍ය ජනතා සංවිධානයකි. බාහිරයන් ලෙස මඟපෙන්වන්නන් රැඳී සිටින අතර පහලම කුඩා කණ්ඩායමෙන් සංවිධාන ගතවූ පිරිස් වලින් කුසලතාවයන් ඇති උදවිය මෙම සංවිධානයේ පරිපාලන හා කළමනාකරණ කටයුතුවල නිරතව සිටී. සමාජසේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම 24 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් හා සාමාජික පවුල් 2850 කින් යුක්තව ක්‍රියාත්මක වේ. ඔවුන්ගේ ශක්තිය මත ආයතනය පවත්වාගෙන යාමට හැකි වීම මෙහි පවත්නා විශේෂත්වය වේ.

## සංවිධානයේ දැක්ම

" දිළිඳුබවින් තොර බලමුළු ගැන්වුණු ප්‍රජාවක් " යන්න මෙම සංවිධානයේ දැක්ම ලෙස ඔවුන් හඳුනාගෙන සටි.

## සංවිධානයේ මෙහෙවර

"අඩු ආදායම්ලාභීන්ගේ ස්වශක්තිය හා සහභාගිත්වය තුලින් පවත්නා අයහපත් තත්ත්වයේ වෙනසක් ඇතිකර ලීම සඳහා ජනතා ක්‍රියාවලියක් නිර්මාණය කිරීම" ආයතනයේ මෙහෙවර වශයෙන් සඳහන්ව ඇත.

## සංවිධානයේ සමස්ත අරමුණ

" අඩු ආදායම්ලාභී සාමාජික පවුල්වල ජිවන මට්ටම ඉහළ නැංවීම " මෙම සංවිධානයේ සමස්ත අරමුණ ලෙස හඳුනාගෙන ඇත.

## සංවිධානයේ නිශ්චිත අරමුණ

මෙම සංවිධානය මගින් හඳුනාගෙන සිටින නිශ්චිත අරමුණු පහත වෙයි.

- ❖ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කිරීම.

- ❖ සෑම සාමාජික පවුලකම ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

- ❖ ආදායම් වර්ධනය සඳහා අවශ්‍ය තාක්‍ෂණික, ව්‍යවසායකත්ව, කළමනාකරණ, සමාජ සජීවිකරණ පුහුණු වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.

- ❖ ආදායම් වර්ධනය සඳහාත් නිවාස, වැසිකිළි, පානීය ළිං ඉදිකිරීම සඳහා මූල්‍ය පහසුකම් සැලසීම.

- ❖ පවුලේ සෞඛ්‍ය තත්ත්වය හා පරිසර සෞඛ්‍ය ඵලදායි අන්දමින් පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.

- ❖ අමුද්‍රව්‍ය ලබාගැනීම අලෙවිය පාරිභෝජන ද්‍රව්‍ය ලබාගැනීම සඳහා සාමූහික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.


- ❖ සාමාජික පවුල්වල ආර්ථික හෝ වෙනත් හේතුමත අධ්‍යාපනය නොලබන ළමුන් ඊට යොමු කරවීම.

- ❖ එකිනෙක සාමාජික පවුල් අතර අන්‍යෝන්‍ය සුබසාධනය සාමූහිකත්වය ආරක්‍ෂා වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ❖ සාමාජික පවුලක් කුමන අන්දමේ හෝ හේතුසාධක මත කිසියම් විපතකට, ව්‍යවසනයකට ගොදුරුවූ විට එම පවුල ඉන් මුදවා ගැනීමට යෝග්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.


- ❖ ඉහත අරමුණු ඉටුකර ගැනීමට සංවර්ධන පදනමේ සම්පත් වලට අමතරව බාහිර සම්පත් යොදා ගැනීම.

- ❖ ඉහත අරමුණු ඉටුකර ගැනීමටත් එම අත්දැකීම් බාහිර ප්‍රජාව සමඟ හුවමාරු කර ගැනීමටත් අවශ්‍ය වන අධ්‍යාපනික පර්යේෂණ හා මාධ්‍ය වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම.



පාලක මණ්ඩලය
ග්‍රාමීය සංවිධාන නියෝජිතයන්
195
ග්‍රාමීය සංවිධාන
සාමාජික (පවුල් නියෝජිත)
ප්‍රතිලාභීන් (පවුලේ සාමාජික)

## ආයතන ව්‍යුහය


පාලක මණ්ඩලය
මෙහෙයුම් උපදේශක
සංවර්ධන නිළධාරිනි
ක්ෂේත්‍ර නිලධාරිනි
ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 15
කාර්යාලිය කාර්ය මණ්ඩලය 07

## ක්‍රියාත්මක මූලික වැඩසටහන්

1. සාමූහික ඉතුරුම් හා ණය ව්‍යාපෘතිය
2. ඒකාබද්ධ කෘෂිකර්ම ව්‍යාපෘතිය
3. කොහු ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය
4. සෞඛ්‍ය සනීපාරක්ෂක හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය
5. සමාජ සුභසාධන ආරක්ෂණ ව්‍යාපෘතිය
6. කාන්තා සංවර්ධන හා පවුල් කළමනාකරණ ව්‍යාපෘතිය

## සාමූහික ඉතුරුම් හා ණය ව්‍යාපෘතිය

- සියළුම සාමාජිකයන් ග්‍රාමීයා සංවිධාන හා සංවර්ධන පදනම තුලින් මෙම ඉතුරුම් ක්‍රියාවලියට දායක වී ඇත.
- සාමාජික ඉතුරුම් ප්‍රමාණය රුපියල් 4386482.00
- ග්‍රාමීය සංවිධාන ඉතුරුම් රුපියල් 788483.00
- ඉතුරුම් ක්‍රියාවලියේ සම්පූර්ණ පොලී ප්‍රමාණය රුපියල් 5044910.00
- සාමාජික ඉතුරුම් හා බාහිර ආධාරද ණය ක්‍රියාවලිය සඳහා යොදාගැනේ.
- රුපියල් 3000 සිට රුපියල් 50000 දක්වා ණය මුදල් සැපයේ.
- ව්‍යවසායකයන් සඳහා වැඩි ණය සැපයේ.
- නිකුත් කර ඇති ණය සංඛ්‍යාව 3354 කි.
- මෙහි මූල්‍ය වටිනාකම මිලියන 27 කට ආසන්න වේ. (රුපියල් 26282651.00)
- මාසික පොලී ප්‍රතිශතය 3% (හීනවන අනුපාතය)
- ණය වාරිකා ආපසු ගෙවීමේදී කිසියම් සාමාජිකයෙකුට අපහසුතාවයක් ඇති වූ විට ග්‍රාමීය සංවිධානය වාරික ගෙවීමේ වගකීම බාර ගනී.
- ණය වාරික ආපසු අයවීම 99.49% ක් පමණ වේ.
- සැබෑ අවශ්‍යතාවය මත ණය සැපයේ.

- ණය ලබාදීම, වාරික රැස්කිරීම පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් ගොඩනගා ඇත.

- වරින්වර ණය පිළිබඳ කොන්දේසි පහලම සිටින සාමාජික දායකත්වයෙන් සංශෝධනය කෙරේ.

- මාසිකව ණය ක්‍රියාවලිය සමාලෝචනය කෙරේ.

- මාසිකව නිකුත් කරන ණය ප්‍රමාණය 100 - 125 ත් අතර වේ. මූල්‍ය වටිනාකම ලක්ෂණ 11-12 අතර වේ..

- ණය ක්‍රියාවලියේ මාසික ඉපයීම රුපියල් 200000/= කි.

- නිකුත් කරන ණය වලින් 2/3 ක් සෘජු ආදායම් වර්ධනය සඳහා වේ.

- සාමාජිකයන් අත රැඳි ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් 7246787/= කි.

## ඒකාබද්ධ කෘෂිකර්ම ව්‍යාපෘතිය

- ගෙවත්ත සංවර්ධනය කර ගැනීම සඳහා මූලිකත්වය

- කැනඩා සංවර්ධන අරමුදල, දකුණු පළාත් ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන ව්‍යාපෘතිය, සිලෙප් ව්‍යාපෘතිය මේ සඳහා මූල්‍ය හා තාක්ෂණික පහසුකම් සලසයි.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය මත සංවිධානය තුළ සම්පත්දායක පිරිසක් බිහිකරගෙන ඇත.

## කොහු ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය

- සාමාජික පවුල් 640 ක් කොහු නිෂ්පාදන කටයුතුවල නියැලි අයයි.
- කොහු ලබා ගැනීම මූලික ගැටළුව නිසා කොහුවලවල් සංවර්ධනය කිරීම සිදුවේ.
- ප්‍රදේශය තුලින් සහ බැහැරින් අවශ්‍ය කොහු ලබා ගැනේ.
- ග්‍රාමීය සංවිධාන මට්ටමින් අලෙවි සිදුවේ.
- නව තාක්ෂණයෙන් යුතු ලණු අඹරන යන්ත්‍ර සැපයේ.
- දකුණු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍ය ආධාර හා තාක්ෂණික ආධාර සපයා ඇත.

## සෞඛ්‍ය සනිපාරක්ෂක හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය

- මූලික වශයෙන් ව්‍යාපෘතිය තුලින් සනිපාරක්ෂක වැසිකිළි, පානිය ළිං ඉදිකිරීමට මූල්‍ය පහසුකම් සැපයේ.
  (පානිය ළිං 44, සනිපාරක්ෂක වැසිකිළි 354)
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා එක්ව සාමාජිකයන් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපදෙස් මත ඉඩම් සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක වේ.
- කැනඩා සංවර්ධන අරමුදල මූල්‍යාධාර සපයයි.

## සමජ සුභසාධන ආරක්ෂණ ක්‍රමය

- 1997 ආරම්භ වී ඇත.
- සෑම සාමාජිකයෙකුම මාසික රුපියල් 20 ක මුදලක් ඒ සඳහාවන ගිණුමේ තැන්පත් කෙරේ. (මුළු අරමුදල රුපියල් 1299319.00 කි)
- සාමාන්‍ය රක්ෂණයක ප්‍රතිලාභ සියල්ල ඇතුළත්වන අතර සාමාජිකයා රෝගාතුරව රෝහල් ගතවූ විට දිනකට රුපියල් 100 ක් වනසේ දින 10 ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභ ගෙවීමක් සිදුවේ.
- සාමාජික ඉතුරුම් වලට 50% ක ප්‍රසාද දීමනාවක් එකතු කෙරේ.
- සාමාජික අභාවයන් අටකට (08) රුපියල් 37970 ක් ගෙවා ඇත.
- රෝහල් ගතවීම් 182 කට රුපියල් 148200 ක් ගෙවා ඇත.
- මුළු අරමුදල චක්‍රිය ණය ක්‍රියාවලිය තුළ පවතී.

## ාන්තා සංවර්ධන හා පවුල් කළමනාකරණ ව්‍යාපෘතිය

- ආදායම් වර්ධනය හා ඊට අදාල කටයුතු වලින් පමණක් දිළිඳුකම අඩුකළ නොහැකි බව අත්දැකීමෙන් පසක් කරගෙන ඇති නිසා මෙම ව්‍යාපෘතිය ආරම්භ විය.
- විශේෂයෙන් දිළිඳුකම තුල කාන්තාව දැඩි පීඩාවකට පත්වී සිටීම මෙහිදී තේරුම් ගෙන ඇත.
- පවුල තුල ආදායම් වර්ධනයක් සමඟ නව කළමනාකරණ ක්‍රියාදාමයක් නිර්මාණය වියයුතු බව මින් තහවුරු කෙරේ.
- පුහුණු වැඩසටහන් මාලාවක් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## සංවිධානයේ මූල්‍ය හා අනෙකුත් වත්කම්

### මූල්‍ය

- සාමාජික ඉතුරුම් 4386482.00
- ග්‍රාමීය සංවිධාන ඉතුරුම් 788463.00
- මේ දක්වා ලද පොලිය 5044910.00
- සමාජ ආරක්ෂණ අරමුදල 1299319.00

### අනෙකුත් වත්කම්

- ඉඩම මිලදී ගැනිම 174273.00
- ගොඩනැගිල්ල ඉදිකිරීම 1036148.00
- කාර්යාලීය උපකරණ 76757.00

### දේශීය / විදේශීය ණය ආධාර

| ආධාරක ආයතනය | ව්‍යාපෘතිය ස්වභාවය | මූල්‍යාධාර රුපියල් |
|---|---|---|
| කැනඩා සංවර්ධන අරමුදල | ආදායම් වර්ධන<br>කෘෂි<br>සනිපාරක්ෂක | 530500.00 |
| ප්‍රජාශක්ති මහා සංගමය | චක්‍රීය ණය<br>පුහුණු | 110685.00 |
| සිලෙප් ආයතනය | සත්ව පාලන | 32500.00 |
| සහභාගිත්ව සංවර්ධන පදනම | කළමනාකරණ පුහුණු | 30000.00 |
| දකුණු පළාත් ග්‍රාම.සං.ව්‍යාපෘතිය | කොහු නිෂ්පාදන<br>කෘෂි | 439700.00 |
| නෙදර්ලන්ත ඒකෝ සංවිධානය | චක්‍රීය ණය<br>පුහුණු, ආයතනික | 3612037.00 |
| එකොලැප් ණය අරමුදල | ආදායම් වර්ධන | 665000.00 |

## මෙහෙයුම් ඇගයුම් වැඩපිළිවෙල

- ❖ ක්ෂේත්‍ර සහායක / සංවර්ධන නිලධාරීන් සහභාගි වන ග්‍රාමීය සංවිධාන රැස්වීම්.
- ❖ ක්ෂේත්‍ර සහායක මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම්.
- ❖ ග්‍රාමීය සංවිධාන නියෝජිත මාසික රැස්වීම්.
- ❖ මාසික ප්‍රගති වාර්තා.
  (ක්ෂේත්‍ර සහායක / ග්‍රාමීය සංවිධාන)

## සංවර්ධන පදනම හා එක්ව කටයුතු කරන ආයතන

- ❖ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
- ❖ දකුණු පළාත් ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන ව්‍යාපෘතිය.
- ❖ දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
- ❖ දකුණු පළාත් පශු සම්පත් සංවර්ධන වැඩසටහන
- ❖ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
- ❖ හබරාදූව ප්‍රාදේශීය සභාව
- ❖ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව.
- ❖ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව
- ❖ ගාල්ල දිසා ලේකම් කාර්යාලය.
- ❖ ප්‍රජාශක්ති මහා සංගමය / ගාල්ල දිස්ත්‍රික් සංසදය
- ❖ කැනඩා සංවර්ධන අරමුදල

❖ නෙදර්ලන්ත ඊකෝ සංවිධානය

❖ එකොලැප් ණය අරමුදල

❖ රාජ්‍ය නොවන සංවිධාන ජාතික ක්‍රියාකාරී පෙරමුණ / දිස්ත්‍රික් සංසදය, ගාල්ල.

❖ ආරක්ෂිත කුප්පි ලාම්පු ව්‍යාපෘතිය - කොළඹ

## මුහුණදුන් ගැටළු

❖ 1997 වසරේ රාජ්‍ය සබඳතාව එකවරම නොලැබීයාම.

❖ මෙබඳු කාර්යයක ව්‍යාපෘති කටයුතුවල නිරත කරවීමට සුදුසු අය සොයා ගැනීමට අපහසු වීම.

❖ වැරදි කරන ලද සේවකයන් ඉවත් කිරීමෙන් පසු මතුවන අසීරුතාවයන්.

❖ ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගෙන් සහයෝගය නොලැබීම, දක්වන උනන්දුව අඩුවීම හා අවහිර කිරීම්.

❖ ආයතනික පහසුකම් ප්‍රමාණවත් නොවීම.

❖ වෙනත් වැඩසටහන් වල බලපෑම්.

## අනාගත අපේක්ෂා.

❖ බල ප්‍රදේශයේ සියලුම දුප්පත් පවුල් දායක කරවා ගැනීම.

❖ ලබා ඇති සාර්ථක අත්දැකීම් බාහිරයන් සමඟ බෙදා ගැනීම.

❖ පුහුණු ආයතනයක් ආරම්භ කිරීම.

❖ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වියනොහැකි අය සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

❖ කාලීන සමාජ ගැටළු සඳහා විසඳුම් සැපයෙන වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

සංවර්ධන වැඩසටහනක් වශයෙන් විද්‍යාමාන වටිනාකම්.

- සාමාජික ශක්තියෙන් ගොඩනැඟුණු ආයතනික පහසුකම්.
- සාමාජික කාන්තාවන් සංවර්ධන පදනමේ පරිපාලන, කළමනාකරණ වගකීම් දැරීම.
- ප්‍රජා සංවිධානයක් ලෙස දිනාගෙන ඇති විශ්වාසය.
- ස්වාධීන නඩත්තු වැඩපිළිවෙලක්. තිබීම.
- ප්‍රජාව විසින් නිර්මාණය කරන ලද සංවිධාන රටාව.
- නව ණය සංස්කෘතියක් බිහිකර තිබීම.
- සංවර්ධන අත්දැකීම් සමුදායක්. ගොඩනභාගෙන තිබීම හා හුවමාරු කර ගැනීම.

මේ අයුරින් දක්වාලිය හැකි හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම 2002 වසර වනවිට පුරා නව වසරක් මුළුල්ලේ දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක නිරතව ඇත.


ස්වශක්තිය හා සහභාගිත්වය වැනි මූලික සංකල්ප මැනැවින් සනාථ කරලීමට සමත් ජනතා ක්‍රියාවලියක්ද නිර්මාණය වී ඇත. එමෙන්ම එම සංවිධානයේ තිරසාර පැවැත්මද තහවුරුව පවතී. මෙබඳු දැවැන්ත මෙහෙවරක නිරතවූවද මෙම පුහුණු වැඩමුළුවේ දායකත්වය තුළ අප ලද අත්දැකීම වූයේ පවුලේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ තවදුරටත් සකස් වියයුතු අවස්ථා සැඟවී පවත්නා වගය. ඒ සඳහා බිරිඳ මෙන්ම සැමියාද පවුලේ සෙසු අයද තම වගකීම් හා යුතුකම් හඳුනාගත යුතුය. ඒවා ඉටුකරන්නන් බවට පත්විය යුතුය. පවුලේ සංවර්ධන ක්‍රියාවලියද සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වියයුතුය.

එබැවින් මෙබඳු " ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන " වැඩපිළිවෙලක් තුළ ඔවුන්ගේ සාමාජික පවුල් පෙරටත් වඩා ශක්තිමත් පුළුල් සංවර්ධන ක්‍රියාවලියක හවුල්කරුවන් බවට පත්වන වග මේවනවිටත් සනාථ කර ගෙන සිටී.

මෙම නියමු ක්‍රියාදාමය සඳහා සංවර්ධන පදනම හා එක්ව දැනට කටයුතු කරන ග්‍රාමීය සංවිධාන පහක සාමාජික පවුල් සියයක් යොදා ගන්නා ලදී. එම පවුල් සියයේ ක්‍රියාකාරීත්වය මත නියමු වැඩසටහනක් වශයෙන් සංවර්ධන ක්ෂේත්‍රයට ගලපා ලියහැකි අත්දැකීම් සමුදායක් සනාථ කර ගැනීමට හැකියාව ලැබී ඇත. විශේෂයෙන් මෙය කාන්තා සංවිධානයක් නිසා කාන්තාව පමණක් දරා සිටී. දැවැන්ත වගකීම් සමූහය හා ක්‍රියාකාරකම් සමස්ථ පවුල වෙත තුනී වී යෑම කාන්තා සංවිධාන සඳහා නව මං පෙතක් එළිපෙහෙළි කර ඇත.

නියමු ක්‍රියාදාමය තුළින් ආරම්භ කරන ලද ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන වැඩපිළිවෙල අදාල ක්ෂේත්‍ර සහායිකාවගේද සහායෙන් තවදුරටත් පෝෂණය වෙමින් ශක්තිමත් වෙමින් ඉදිරියට ඇදෙමින් පවති. ඔවුන් ලබන අත්දැකීම් සමුදාය මෙන්ම ඒ තුළින් ළඟාකරගන්නා ඉමහත් ප්‍රබෝධය මෙම ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරවීමටත් ශක්තිමත් කරවීමටත් යොදවනු ඇත.

සහාය ආයතනයක් වශයෙන් හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම පවතින නිසා නැවත වසරකට පසුව මෙම පවුල් සියයේ " ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩපිළිවෙල විමසුමට භාජනය කළහැකිය. දැනට මුල් තෙමස තුළ ප්‍රකට කරන ලද ලක්ෂණයන් මත වසරක් තුළදී වඩා යහපත් ගෘහ කළමනාකරණ ක්‍රියාවලියක් හරහා ශක්තිමත් පවුල් සංවර්ධනයක් කරා යොමුවූ පවුල් සියයක් දක්නට හැකිවීම මෙම ක්‍රියාදාමයේ සාර්ථකත්වය ප්‍රකට කර ඇත. කෙසේ වෙතත් අප අපේක්ෂා නොකරන පරිදි පවුලට පෞද්ගලික වූ සංවර්ධන ක්‍රියාවලියක හිමිකරුවන් බවට මෙම පවුල් සියය පත්වනු ඇතැයි විශ්වාස කළහැක. එය ඉතා ආකර්ශනීය, සාධාරණ හා සාමය සතුට ආරක්ෂාව රැඳවූ තෘප්තිමත් පවුලක් වනු ඇත.



හබරාදුව - ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමනිලධාරී වසම් හා අදාල වේ.

## හබරාදුව - ඉමදූව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම්
## (සිතියම් හා අදාල වේ)

| | | |
|---|---|---|
| 1. බොනවිස්ටාව (137 C) | 35. අකුළුගහ ( 154) | 69. නාකන්ද ( 259 ) |
| 2. යද්දෙහිමුල්ල (137 B) | 36. පැලවත්ත (154 ) | 70. දිගරැද්ද (159 ) |
| 3. උණවටුන බටහිර (137) | 37. පොල්පේන (154 ) | 71. කොරහැඩිගොඩ ( 159 ) |
| 4. මහරඹ (136 ) | 38. ගොඩවත්ත ( 149 ) | 72. අහංගම්ගොඩ ( 159 ) |
| 5. උණවටුන මධ්‍යම (137 A ) | 39. හරුමල්ගොඩ නැ : (149 ) | 73. කලපුව ( 159 ) |
| 6. දලවැල්ල (132 ) | 40. කොග්ගල 1 ( 144 ) | 74. පියදිගම නැ: (160) |
| 7. තල්පෙ දකුණ (132) | 41. කොග්ගල 11 (144 ) | 75. දොම්මන්ගොඩ ( 160 ) |
| 8. හීනටිගල දකුණ (148) | 42. කොග්ගල ( 174) | 76. කලතොගොඩ ( 160 ) |
| 9. වැල්ලෙතොට (148 ) | 43. කෝඹල ( 174) | 77. අහංගම නැ: (156) |
| 10. තල්පෙ නැගෙනහිර(148 ) | 44. මායාකඩුව ( 174 ) | 78. ගොවියාපාන (156 ) |
| 11. කහවැන්නගම (148 ) | 45. ඉහළ කෝඹල (174 ) | 79. තලාතුඩුව (156 ) |
| 12. හල්ලොලුවගොඩ (143 ) | 46. පිටුවලපේන (174 ) | 80. අහංගම මධ්‍යම ( 157) |
| 13. හඳුගොඩ (143 ) | 47. හවුපෙ ( 175) | 81. පරගොඩ (173) |
| 14. දොඩම්පෙ (143) | 48. මාවැල්ල (175 ) | 82. දීගොඩ (173 ) |
| 15. මොරම්පිටිගොඩ (144 ) | 49. හවපෙ උතුර ( 175 ) | 83. දීගොඩ නැ: (173 ) |
| 16. පිටිඳූව (142) | 50. ගොඩඋඩමන්ඩිය ( 175 ) | 84. වතවන ( 173 ) |
| 17. අක්කරගොඩ (142 ) | 51. ඉහළ මාවැල්ල ( 175 ) | 85. ඉමදූව (172) |
| 18. මීපේ (151 ) | 52. කහඳ (167) | 86. ඉමදූව අතිරේකය (172 ) |
| 19. ඌරගස්ගොඩ (144 ) | 53. කහඳ 1 (167 ) | 87. දික්කුඹුර (165) |
| 20. බෝගහමුළුගොඩ (151 ) | 54. තිත්ගල්ල නැ: (166) | 88. ඉඳුරන්නාවිල (165 ) |
| 21. හප්පාවන (151) | 55. තිත්තගල්ල බටහිර(166 ) | 89. පණුගල්ගොඩ (165 ) |
| 22. අන්නාසිවතුගොඩ (151 ) | 56. අටානිකිත (166 ) | 90. මලල්ගොඩපිටිය (171) |
| 23. හරුමල්ගොඩ බටහිර(149) | 57. පැලැස්ස (166 ) | 91. කෝදගොඩ නැ: (171 ) |
| 24. ලණුමෝදර (151 ) | 58. අම්පාවිල ( 166 ) | 92. කෝදගොඩ දකුණ (169) |
| 25. ලියනගොඩ (144) | 59. කතළුව නැ: (164 ) | 93. අන්දූගොඩ (170) |
| 26. වැලිකොන්ද (153 ) | 60. මීගහගෙඩ ( 164 ) | 94. ආල්ලගොඩ (170 ) |
| 27. හරුමල්ගොඩ මධ්‍යම(149 ) | 61. කතළුව මධ්‍යම (164 ) | 95. හොරදූගොඩ (168) |
| 28. කටුකුරුන්ද (144) | 62.. දූ'හැල (164 ) | 96. අලවතුතිස්ගොඩ (164 ) |
| 29. කඹරගල ( 153 ) | 63. වැල්පේන්ගොඩ (164 ) | 97. කලුගල්ගොඩ (171 ) |
| 30. දූ'වන ( 153 ) | 64. කහවතුගොඩ ( 164 ) | 98. හෙට්ටිගොඩ (169 ) |
| 31. දොරපෙ (153) | 65. මැලියගොඩ ( 164 ) | 99. හටංගල (154 ) |
| 32. රංගොඩ (153 ) | 56. පියදිගම බටහිර ( 161) | 100. අටදාහෙවතුගොඩ (162) |
| 33. බැඳිපිට ( 154 ) | 57. කරන්දූගොඩ (161 ) | 101. උණවටුන නැගෙනහිර(136) |
| 34. පුස්සල්කඩ ( 174 ) | 63. වඩුගේගොඩ ( 161 ) | 102. කතළුව(බ)(162) |

## සයවන පරිච්ඡේදය

## පර්යේෂකගේ නිගමන හා යෝජනා

01. පුද්ගලයා සමාජ ගතවන මූලික සංවිධානාත්මක ඒකකය පවුල වේ. ගෘහය තුළ පවුලේ සංවර්ධන ක්‍රියාවලිය නිර්මාණය වේ. සමස්ත සමාජයේ බහුතරයක් නිෂ්පාදනයන් හා සේවාවන් මෙම පවුල් ඒකකයේ වෙසෙන්නන්ගේ පැවැත්ම සඳහා යොදා ගැනේ. ඒ සෑම නිෂ්පාදන කාර්යයක් සඳහාමත් සේවා කාර්යයක් සඳහාමත් කළමනාකරණ ක්‍රියාවලියක් පවති. එහෙත් ඒ සියල්ල පරිහරණය කරන පවුලේ කළමනාකරණ ක්‍රියාවලියක් පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් නොපවති. මෙම අධ්‍යයනයෙන් හෙළිවූයේ සංකීර්ණ සමාජ පැවැත්ම තුළ මෙබඳු ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩපිළිවෙලක් අත්‍යාවශ්‍ය බවය. එබැවින් යෝග්‍ය ක්‍රමෝපායන් තුළ එබඳු ක්‍රියාවලිය්ක යෝජනා කෙරේ.

02. සමාජ පැවැත්ම පිළිබඳ කෙරෙන විග්‍රහයේදී පද්ධති න්‍යාය ඉතා වැදගත් වේ. පවුල, ආර්ථිකය, අධ්‍යාපනය, දේශපාලනය, ආගම, නීතිය හා සිරිත් විරිත් වශයෙන් සැලකෙන මෙම පද්ධතිවල එකක් මත එකක් යැපීමත් (Inter Dependences) එකිනෙක පද්ධති අතර පවත්නා සබඳතාවන් (Inte Reletionships ) න්‍යායාත්මක සංසිද්ධියකි. ඒබැවින් කුමන හේතු සාධක මත හෝ පවුල නිසිපරිදි නොපතිනවා යනු සමස්ත සමාජයම නිසි පරිදි නොපවතිනවා යන්නයි. වෙනත් ආකාරයකින් කිවහොත් සමාජයේ සෙසු පද්ධති අකාර්යක්ෂම, දුර්වල වශයෙන් ප්‍රකට වන්නේනම් එහි බලපෑම " පවුල් " ඒකකය තුළද පවති. එබැවින් එළඹිය හැකි තවත් නිගමනයක් වන්නේ පවුල නිසි පරිදි පවතිනවා යනු සමස්ත සමාජයම වඩාත් යහපත් පරිදි පවතිනවා යන්නයි. එනිසා ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය යන්න සමස්ත සමාජයටම පිළිසකර කිරීමකි.

03. දුප්පතුන් සඳහා ක්‍රියාත්මක වන බහුතරයක් සංවර්ධන වැඩසටහන් නිර්මාණය වන්නේ එම සංවර්ධන ගැටළු ඇතිවීම සඳහා බලපා ඇති හේතු සාධක හඳුනාගෙන නොවේ. හේතු සාධක වලට වඩා මතුපිට දක්නා ස්වභාවය (ඵලය) මුල්කරගෙන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සංවර්ධන ක්ෂෙත්‍රයේ සුලභ ලක්ෂණයකි. මේ තත්ත්වය යටතේ සංවර්ධන වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීයාම ස්වභාවික සිද්ධියක් බවටද පත්ව ඇත. එනිසා ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය තුළ පවුලේ යථා ස්වභාවය නිරාවරණය වන නිසා සංවර්ධන ගැටළු වලට බලපා ඇති හේතුසාධක ද නිරායාසයෙන් ඉස්මතු වේ. ඒනිසා පෙරට වඩා සංවර්ධන වැඩසටහන තර්කානුකූල රාමුවක් තුළ නිශ්චිත ප්‍රතිඵල සඳහා ගොඩනැඟිය හැකිබව මෙම අධ්‍යයනය තුළින් තහවුරු වී ඇත.

04. සංවර්ධනයට ඉලක්කවන, විශේෂයෙන් දුප්පතුන් අඩ සියවසක කාලයත් තුළ සහනාධාර මානසිකයෙන් ඔද්දල්වී සිටීම ප්‍රකට කරුණකි. වර්තමානයේ පවුලේ සංවර්ධනය සඳහා

පවත්නා ප්‍රබල සම්බාධක අතුරින් මූලිකත්වය ලබන්නක් ලෙස දින ආධාර මානසිකය හැඳින්වියයුතුව ඇත. ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය තුළ මූලික වශයෙන් සැමියාටත් - බිරිඳටත් අප ආමන්ත්‍රණය කල නිසා ඔවුන් අප හා විවට වූ නිසා ඔවුන් සතු සම්පත් හා ශක්තීන් හඳුනාගැනීමටත් ඒවා පවුල් සංවර්ධන ක්‍රියාවලියේ මූලික අවස්ථාව ලෙස ගලපා ගැනීමටත් සමත් වූහ. ඔවුන්ගේ තෙමස් ප්‍රගතිය තුල එය පැහැදිලිව සටහන් විය. මෙබඳු වඩාත් ශක්තිමත් පදනමක්, නිර්මාණය වීමත්, හැඟීමකින් ඕනෑකමකින් තම පවුල සංවර්ධනය කර ගැනීම සඳහා උනන්දුවීමත් හැඳින්විය යුත්තේ තම පවුලේ සංවර්ධනය පිළිබඳ වගකීම තමන් විසින්ම බාරගත් බවයි. ඒනිසා එළඹිය හැකි වඩාත් ශක්තිමත් නිගමනයක් වන්නේ ප්‍රජාව සතු සම්පත් මූලාරම්භය කර ගැනීමටත් ඔවුන්ගේ සංවර්ධන වගකීම ඔවුන්ට දැරීමටත් ඉඩකඩ සැලසීම වඩාත් යෝග්‍ය බවයි. මෙම නව ක්‍රියාදාමය තුළ එය සිදුවේ.

05. කාන්තාව පිළිබඳ ඇගේ අයිතීන් පිළිබඳ ඇය හිංසාවට පත්වන ගෘහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නොයෙකුත් දේ අප අසා ඇත්තෙමු. ප්‍රතික්‍රියාකාරකම් වශයෙන් විවිධ පුද්ගලයන් දැනුමැතියන් විවිධ යෝජනාද ප්‍රකාශ කර ඇත. ඇතැම් යෝජනා හා ක්‍රියාකාරකම් කාන්තාව පත්ව සිටින මෙම කණගාටුදායක තත්ත්වය තවදුරටත් වැඩි දියුණු කරන වගද දක්නට ලැබේ. නැති ගැටළු මතුකරන අවස්ථාද වේ. ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය තුල සැමියාටත් බිරිඳටත් විවෘත සංවාදයකට සමූහයක් තුළ විවිධ ක්‍රමෝපායන් ඔස්සේ ඉඩකඩ ලැබී ඇත. විවේචනාත්මකව පවුලේ සංවර්ධන ක්‍රියාවලිය විග්‍රහකර ගැනීමට ඉඩකඩ ලැබී ඇත. ඒවා සියල්ල සැලකිල්ලට ගෙන සැමියාටත්, බිරිඳටත් පවුල තුළ ඉටුකළයුතු වගකීම් යුතුකම් කාර්යභාරයන් නැවත හඳුනා ගැනේ. ගෘහය තුළද සංයමයෙන් යුතුව ඒවා සාකච්ජා කෙරේ සුදුසු තීරණ ගැනේ. ගෘහණිය දැරූ බර කිහිපදෙනෙකු අතර බෙදා ගැනේ. මේ තත්ත්වය යටතේ කාන්තාවගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා යෝග්‍යතම උපාය මාර්ගය ලෙස ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය යෝජනා කෙරේ.

06. ප්‍රජා සංවර්ධනය, ග්‍රාමසංවර්ධනය සමාජ සංවර්ධනය, ප්‍රජාව බලමුළුගැන්වීම ආදි විවිධ විෂය ධාරාවන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් සඳහා, ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය අනිවාර්ය මූලාරම්භයක් වියයුත්තේ මෙම සියළු කාර්යයන් පුද්ගලයා හරහා සමාජ පැවැත්ම වඩාත් යහපත් කරනු සඳහා උත්සාහ දරණ බැවිනි. ගෘහය තුළ හා පවුල තුළ ස්ථාපිත කරනු ලබන මෙම මානව හා භෞතික ක්‍රියාවලියෙන් තොරව ඉහත සඳහන් විෂය ධාරාවන්ට තමන්ගේ සංවර්ධන ක්‍රියාවලියේ හරය භාවිතා කළ නොහැක. ඒනිසා මෙම ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය ප්‍රජා සංවර්ධනය, ග්‍රාමසංවර්ධනය, සමාජ සංවර්ධනය හා ප්‍රජාව බලමුළු ගැන්වීම ආදි විෂය ධාරාවන්ගේ මූලාරම්භය සමරූපී කරන්නක් ලෙස දැක්විය හැක.

07. මූලික වශයෙන් පුහුණු වැඩමුළුවක් කේන්ද්‍ර කරගෙන සැමියා හා බිරිඳ පමණක් නොව තමන්ට සහාය වන පිරිසක්ද ඉදිරියේ විවාහයෙන් ඇරඹෙන තම පවුලට පෞද්ගලික වූ, පවුලේත් වැඩිහිටියන් දෙපලට පෞද්ගලික වූ තොරතුරු කියාපෑම සිදු වුවක්ද යන්න පිළිබඳ කෙනෙකුට සැකයක් ඇතිවීම ස්වභාවිකය. නමුත් මෙහි පවතින මූලික ඉතා වැදගත්වූ අවස්ථාව වන්නේ මේ සඳහා දායක වන සම්පත්ධාරීන් ප්‍රජාව සමඟ කටයුතු කිරීමේ දිගුකාලීන පරිචයක් ලද අත්දැකීම් ලැබූ දිළිඳු ප්‍රජාවගේ චර්යාවන් තේරුම් ගැනීම් හැකි අයවීමයි. ඒ තුළ පියවරෙන් පියවර මෙබඳු ක්‍රියාදාමයකට සැමියා හා බිරිඳ අවනත කරවා ගැනීමේ හැකියාව ඔවුන් සතුව පවතී. ඔවුන් විවිධ තාක්ෂණික උපක්‍රමද යොදා ගනී. එබැවින් මේ තුළින් හෙළිදරව්වූයේ ප්‍රජාවට ළංවූවිට සම්පවූ විට ඔවුන් තුළ හිරකරගෙන සිටිනා මෙතෙක් කිසිවෙකුටත් ප්‍රකාශ නොකළ ප්‍රකාශ කරන්නට තරම් කිසිවෙකුත් සිටිනා සිද්ධීන් අවස්ථා හෙළිදරව්කොට ඉමහත් අස්වැසිල්ලක් ඔවුන් ලබනා වගය. එමෙන්ම එය හුදු ආශ්වාදය සඳහා පමණක් අවස්ථාවට සීමාවූවක් නොව ගෘහය පිළිබඳ පවුල පිළිබඳ දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක ආරම්භයක් වීමද ඔවුන්ගේ හෙළිදරව්ව සඳහා හේතුවී ඇත.

08. පවුල් ඒකකයේ ගෘහමූලිකත්වය සම්මතයෙනුත්, නිත්‍යානුකූලවත් පිරිමියාට හිමිව ඇත. එහෙත් අඩු ආදායම්ලාභී බොහෝ පවුල්වල " මෙම ගෘහමූලික " භාවය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවේ. හුදෙක් එය නාම මාත්‍රිකව පවතී. එපමණක් නොව අසහනය, නොසතුට, දුක, වේදනාව, බැරිකම්, අමාරුකම් පවුල ගිලගන්නා විට මෙම " මූලිකාය " නිහඬව ඉන් මෑත්වී ඇතැම් තැනක සහනය සඳහා මත්පැන්වල පිහිට පතනා අයුරුද ප්‍රකට වේ. මේ සියල්ල තුළ බිරිඳ හුදකලා වී පවුල පිළිබඳ වගකීම් සියල්ල දරාගෙන පවුල් පවත්වාගෙන යාමට උත්සාහ දරණු ලබයි. මෙම තත්ත්වය මැනැවින් සනාථ කරන්නක් ලෙස ග්‍රාමීය ප්‍රජා සංවිධානවල වැඩි කාන්තා දායකත්වය දක්වාලිය හැකිය. ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය තුළ අපගේ අත්දැකීම වූයේ පුරුෂයාට මෙම මඟහැරීම සඳහා කිසිදු අවකාශයක් නොලැබෙන අතර බිරිඳ හා එක්ව සමදායකත්වයක් පවුලේ සංවර්ධන ක්‍රියාවලියට ලබාදීමට සිදුවීමයි. එබැවින් ස්ත්‍රී පුරුෂ වර්ගීකරණයේ බෙදුම්වාදී බව මකාදමා එය " සම " තත්ත්වයකට පත්කරලීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රායෝගික ක්‍රමය මෙම ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාදාමයයි.

09. මෙම ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය කිසියම් ආකාරයක සැලසුම්ගත වැඩපිළිවෙළකි. එහෙත් එය පවුලට ආයාසකර, ඉතා දුෂ්කරව ළඟාකර ගතයුතු ක්‍රියාදාමයක් නොවේ. විශාරදයන් සතුව පවත්නා " සංවර්ධන සැලසුම් " ආකෘති මෙහි භාවිතා නොවේ. ඔවුන් උනන්දු කරවන්නේ යොමු කරවන්නේ එදිනෙදා " ගෘහ " ක්‍රියාවලිය පවුලේ එදිනෙදා කටයුතු වඩාත් අර්ථවත්ව, අවබෝධයෙන් පවුලේ සියළුමදෙනා හා එක්ව සාකච්ඡා කොට සම්මුතියෙන් ක්‍රියාත්මක කිරීමයි. එය ඔවුන්ගේ පවුල් ජීවිතයයි. ඒ තුළ සතුට ආශ්වාදය, තෘප්තිය සියල්ල රැඳී පවතී. එනිසා විශාදරයන් සතු සැලසුම් ක්‍රියාවලිය මෙම ක්‍රියාදාමය හා නොගැලපෙන වග මෙම අත්දැකීම් තුළින්

සනාථ කරගෙන සිටිමු. එහෙත් ඔවුන් සතු ලේඛණගත නොකළ මෙම සැලසුම්ගත ස්වභාවය හදාරන්නට, දරා ගන්නට, දකින්නට අවශ්‍ය කුසලතාවය සාම්ප්‍රදායික සංවර්ධන වැඩකරුවන් තුළ පැවතිය යුතුය. නොඑසේනම් මෙම ක්‍රියාදාමය භාවිතා කළනොහැක.

10. ඕනෑම ප්‍රජාමූල සංවිධානයක අවසාන පරමාර්ථය වන්නේ වඩාත් ප්‍රබුද්ධ, ආර්ථික සවිමත් බවක් හා ඒ මතින් හිමිකර ගන්නා සමාජ බලගැන්වීම තුල රැඳුණු ප්‍රජාවක් ගොඩනැංවීමය. සංවිධානය තුළ පවත්නා සියළුම ක්‍රියාකාරකම් මේ සඳහා පාදක වේ. එබැවින් කිසිදු ප්‍රජා සංවිධානයකට පවුල කේන්ද්‍රකරගත් මෙම ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාදාමය භාවිතා නොකර අපේක්ෂිත ඉලක්කයට යා නොහැකි බව අපගේ අත්දැකීම තුළ පසක් කරගෙන සිටිමු. පවුල තුල ගොඩනැගෙන සංවර්ධන ක්‍රියාවලියට ලැබියයුතු දායකත්වය ලැබෙන නිසා ප්‍රජාමූල සංවිධානයේ තිරසාර පැවැත්මද එමඟින් තහවුරු වේ.

11. දිළිඳුබව අවම කරලීමේ සංවර්ධන වැඩසටහන් වලදී නොසළකාහරින, එසේත් නැත්නම් අවධානය යොමු නොවන අවස්ථා ගණනාවක් මෙම අධ්‍යයන ක්‍රියාවලියේදී හඳුනාගන්න ලදී. නිවාස අයිතිය, ඉඩම් අයිතිය ඉන් එක් වැදගත් අවස්ථාවකි. නිරවුල් නීත්‍යානුකූල අයිතිවක් පවුලේ මූලිකයන්ට නොමැතිවිට ඇතිවන උදාසීන මානසික ස්වභාවය පවුලේ සංවර්ධන ක්‍රියාවලිය අඩාල කරන එක් සාධකයකි. එනිසා දිළිඳුබව අවම කරන පවුල් සංවර්ධන වැඩපිළිවෙලකදී විසඳුම් සෙවියයුතු හා සෙවියහැකි අවස්ථාවක් ලෙස ඉඩම්/නිවාස අයිතිය සඳහන් කෙරේ.

12. දිළිඳුබව තහවුරු වෙමින් දිගුකලක් පැවතීම සඳහා ශ්‍රම බලකායේ ස්වභාවයද බලපාන වන මෙම අධ්‍යයනයෙන් පසක් කරගන්නා ලදී. මෙම අධ්‍යයනයට ලක්වූ පවුල් සියයේ ශ්‍රම හමුදාව 237 කි. ඉන් මූලික හෝ අතුරු ආදායම් මාර්ගවල නිරත පිරිස 166 කි. 71 දෙනෙකු කිසිදු සේවා හෝ නිෂ්පාදන කාර්යයකට අයත් නොවී සිටිති. එබැවින් දිළිඳුබව අවම කරලීමේ වැඩසටහන් වලදී ගම හෝ පවුල ඒකකයක් වශයෙන් සලකනවිට ශ්‍රම බලකායේ මෙම ස්වභාවය සැලකිල්ලට ගතයුතු බවද යෝජනා කෙරේ.

13. දිළිඳු පවුල්වල මූල්‍ය ක්‍රියාවලිය පිළිබඳ න්‍යාය පත්‍රය අති පෞද්ගලික වූ රහසඇවූ ක්‍රියාදාමයකි. එහි පවත්නා යථා ස්වභාවය හඳුනානොගෙන, නොදැන ඔවුන් හා එක්ව ඉතුරුම් හා ණය ක්‍රියාවලියකට කිසියම් සංවර්ධන ආයතනයක් උත්සාහ දරුන්නේ නම් එය එතරම් සාර්ථක ක්‍රියාදාමයක් නොවන වග මෙම ගවේෂණ ක්‍රියාදාමයෙන් හෙළිදරව් කෙරුණි. එබැවින් මූල්‍ය අවශ්‍යතා පිළිබඳ තීරණ ගතයුත්තේ පවුලේ මූල්‍ය ක්‍රියාවලිය මැනැවින් හඳුනාගත් පසුවය.

බොහෝවිට විවාහයත් සමඟම ඇරඹෙන පවුලේ ආර්ථික අපහසුතා වලින් ගොඩඒම සඳහා උත්සාහ දැරීම සාමාන්‍ය සිද්ධියකි. කුසගින්න ඇතුළු මූලික අවශ්‍යතා පුද්ගලයා පොළඹවනු ලබන්නේ " කුමක් හෝ කිරීමටයි" කියක් හෝ හොයා ගැනීමටයි. ඒවායේ යහගුණ පිළිබඳ අවධානයක් නොපවතී. තිරසරබව, ඵලදායිබව සිතන්නට ඒ තුළ අවකාශයක් නොපවතී. එනිසා මෙම මූල්‍ය ගනුදෙනු රටාව එහි පසුබිම, ආයෝජන ක්‍රියාවලිය පවුල තවදුරටත් ආර්ථික අපහසුතා වලට ඇද දමන වග මෙම ගවේෂණය තුළින් හෙළිදරව් විය. එනිසා එම අසීරුතාවයෙන් මූලික වශයෙන් මුදවා නොගෙන ඔවුන් සඳහා සංවර්ධන ක්‍රියාදාමයක් ඇරඹීම යෝග්‍ය නොවේ. එබැවින් ඒ පිළිබඳ මූලික ලෙස අවධානය යොමු කිරීමට සංවර්ධන වැඩකරුවන්ට මින් යෝජනා කෙරේ.

මූලික අවශ්‍යතා සපුරා ගැනීම පිළිබඳ පවුල මතු කෙරෙන දුක්ඛදායක ස්වභාවය පදනම් කරගෙන ඊට පිළියම් සෙවීම සඳහා හඳුනාගතයුතු උපාය මාර්ග ගොණුවට මැදපෙරදිග ගොස් බැලමෙහෙවරකම් කිරීමේ නව චින්තනයද සමාජ විසින්ම දිළිඳු ප්‍රජාවට හිමිකරදී ඇත. දිළිඳු ප්‍රජාව පිළිබඳ මෙය සුවිශේෂ අවස්ථාවක් ලෙස පවතී. ගවේෂණ ක්‍රියාවලියේ පවුල් සියයෙන් 14 ක් (14% ක්) මෙම මැදපෙරදිග ඉපයීම් ක්‍රියාදාමයට ඇතුලත්ව ඇත. මෙම පවුල් 14 තවදුරටත් ප්‍රපාතයට ඇද දැමීමට මෙම මැදපෙරදිග ගමන හේතුවී ඇත. විශේෂයෙන් ගිනි පොලියට යටත්වූ ණයබර, තමන් සතු සුළු දේපල අහිමිවීම්, සැමියා/බිරිඳ/දරුවන්/ඥාතීන් අතර පැවති යහපත් සබඳතා සියල්ල විනාශවී විකෘතින් බිහිවීම මෙම ගමන නිසා ලද අනපේක්ෂිත අහිතකර ප්‍රතිඵලයන් වේ. එබැවින් මේ පිළිබඳ සංවර්ධන වැඩකරුවන්ගේ නිර්මාණශීලි දැකීමක් සහිත නව වැඩපිළිවෙලක් අවශ්‍ය බව මින් යෝජනා කෙරේ.

<u>ගෘහ කළමනාකරණ සහ පවුල් සංවර්ධන වැඩසටහන</u>

<u>**පවුල් තොරතුරු විමර්ශන ආකෘති පත්‍රය පිරවීම සඳහා උපදෙස්.**</u>

- ලබාදී ඇති ගෘහ කළමනාකරණ පුහුණුවද පදනම් කරන මිත්‍රශීලි බව තහවුරු කර ගතයුතුය.

- කිසිසේත් ප්‍රශ්න වශයෙන් විමසා පිළිතුරු සැපයීම නොකළ යුතුය. මෙය සමීක්ෂණයක් නොව විමර්ෂණයක් බව තදින්ම අවධානරණය කරගත යුතු වේ.

- ඔවුන් දෙපලට අදහස් ප්‍රකාශ කිරීමට, කථා කිරීමට බෙහෙවින් ඉඩකඩ සලසා දී ඇහුම්කන් දෙන්නෙකු ලෙස වැඩිමනත් රැඳී සිට අවශ්‍ය දිසාවන්ට ඔවුන් යොමු කරවා ගතයුතුය.

- වැඩි කාලයක් ගෘහ මූලිකයන් දෙපල සමග සොරෙන සාකච්ජාවක් තුලින් ආකෘති පත්‍රය පිරවීම සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගත යුතුය. ඔවුන් වෙතින් නිරායාසයෙන් ඒවා මතු වන්නට ඉඩහැරිය යුතුය.

- ලබාගන්නා සියළුම තොරතුරු සත්‍යම ඒවා වීම පිළිබඳ වගකීම තමන් දැරිය යුතුය. ඊට උචිත පරිදි අදාල පවුල සමඟ සබඳතා පවත්වා ගතයුතුය. සංවාදශීලි වියයුතුය.

- අවශ්‍ය තැන්හිදි සුදුසු උපක්‍රම යොදා තමන් පරීක්ෂාකාරී වියයුතුය.

- ගොඩනඟන සාකච්ජාව, අදහස් හුවමාරුව, ප්‍රශ්නාවලිය පිරවීම සඳහා පමණක්ම වූවක් නොවිය යුතු අතර, ඔවුන් මුහුණ පා සිටින ප්‍රශ්න / ගැටළු සඳහා සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කරන පසුබිමක් වශයෙන් පවත්වා ගෙන යායුතුය.

- සෑම පවුලක් පිළිබඳවම විවාහයෙන් ඇරඹෙන දුක් දොම්නස් වලින් පිරුණු අනුවේදනීය කථා පුවතක් පවතී. එය අනිවාර්යයෙන්ම වෙනම ලියවිල්ලක් ලෙස පිටු කීපයකින් ලියා ආකෘති පත්‍රයට ඇමිණිය යුතුය.

- ආකෘති පත්‍රය පුරවා ගැනීම හා ජීවන කථාව ලේඛණ ගත කිරීම තුළ කිසිදාක නොවූ විරු අන්දමින් පවුල පිළිබඳ සිතන, කල්පනා කරන දෙපලක් බවට ගෘහ මූලිකයන් දෙපළ පත් වියයුතුය. ඒ තුළ පවුල් සංවර්ධන හා කළමනාකරණ ක්‍රියාදාමයක් නිර්මාණය වියයුතුය.

ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩසටහන
පවුල් තොරතුරු විමර්ශන ආකෘතිය පත්‍රය.

01. මූලික තොරතුරු :

01:01 දිස්ත්‍රික්කය : ..............................

01:02 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..............................

01:03 ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා අංකය : ..............................

01:04 ගම්මානයේ නම : ..............................

01:05 ගෘහයේ අංකය : ..............................

01:06 නිවසේ ලිපිනය : ..............................
..............................

02. පවුලේ සාමාජිකයන් පිළිබඳ මූලික තොරතුරු :
(ගෘහ මූලිකයාගේ නම මුලින් සඳහන් කරන්න)

| අ/අ | නම | වයස | ස්ත්‍රී පුරුෂ භාවය | සඤාතිත්වය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| 10 | | | | |

03. නිවස පිළිබඳ තොරතුරු :

03:01 නිවසේ අයිතිය
සැමියා සතු වූවකි

බිරිඳ සතු වූවකි

දෙමාපියන් සතු වූවකි

හිතවතෙකු /ඥාතියෙකු තාවකාලික පදිංචියට ලබා දුන්නකි.

කුලී /බදු ගෙවන නිවසකි (මාසික කුලිය ............................)

හවුල් අයිතිය ඇති නිවසකි.

03:02 නිවසේ දිග පළල : ..........................................................................................

03:03 නිවසේ කාමර ගණන : ..........................................................................................

03:04 නිවසේ ඉදි කිරීම් කටයුතු නිම වී ඇත්ද? ..............................................

03:05 මේ වනවිට ලබාගෙන ඇති මුළු නිවාස ණය ප්‍රමාණය ..........................

03:06 එම ණය මුදලින් ගෙවීමට ඇති ප්‍රමාණය : ..............................................

03:07 නිවසේ බිත්ති - තාවකාලික ද්‍රව්‍ය/මැටි/ලෑලි/ගඩොල්/ගල්.

03:08 වහලය -පොල් අතු/තාර ෂීට්/ තහඩු/ උළු/ඇස්බැස්ටෝස්

03:09 ගෙබිම - මැටි /ගොම මැටි / සිමෙන්ති / පිඟන් ගඩොල්

03:10 නිවසට විදුලිය ලබාගෙන ඇති / නැත

04. මුළුතැන් ගෙයි පිළිබඳ තොරතුරු

04:01 මුළුතැන් ගෙයක් ඇත්ද? ..........................................................................................

04:02 තාවකාලික වූවක්ද ? ස්ථිර වූවක්ද ? .........................................................................

04:03 හොඳින් බඳින ලද ලිපක් ඇත්ද? ...........................................................................

04:04 දුම් කවුළු හා දුම්මැස්සක් තිබේද? .........................................................................

04:05 දර මැස්සක් තිබේද? ..........................................................................................

04:06 දිය (වලං) මැස්සක් තිබේද? ..................................................................................

04:07 වලං සෝදන ස්ථානය වතුර බැස යන පරිදි සකසා ඇත්ද?

..........................................................................................................................

04:08 මුළුතැන්ගෙය හා වටපිටාව පිරිසිදුව පවතීද ? ..................................................

04:09 උණුකර නිවාගත් ජලය කුස්සියේ තබා ඇත්ද ? ...............................................

04:10 දැත් පිරිසිදු කිරීමට සේදීමට සබන් කැල්ලක් හා වතුර තබා ඇත්ද?

..........................................................................................................................

05. සනීපාරක්ෂක පහසුකම් හා සෞඛ්‍ය තත්ත්වය

05:01 වැසිකිළියේ ස්වභාවය :

ජල මුද්‍රිත වැසිකිළියකි

තාවකාලික වැසිකිළියකි

වැසිකිළියක් නැත.

වල වැසිකිළියකි

අබලන් වූ වැසිකිළියකි

05:02 වැසිකිළියේ පවිත්‍රතාවය.

- වැසිකිළිය පිරිසිදු කරන්නේ දිනපතා/සතිපතා/මාස්පතා
- විශේෂ පිරිසිදු කිරීමක් නැත.
- වැසිකිළි යාමෙන් පසු අත් සේදීමට සබන් හා වතුර තබා ඇත.
- වැසිකිළියට ජලය භාවිතා කිරීමට වෙන්කළ භාජනයක් ඇත / නැත
- කුඩා ළමුන්ගේ මළ වැසිකිළියට බැහැර කෙරේ / නොකෙරේ.
- කුඩා ළමුන් සඳහා වෙනම වැසිකිළියක් ඇත / නැත

05:03 පානයට හා නිවසේ කටයුතු සඳහා ජලය ලබා ගන්නේ

- නිවසේ පෞද්ගලික ළිඳෙන් නල මඟින්
- ආරක්‍ෂිත තමන්ගේම ළිඳෙන්
- අනාරක්‍ෂිත තමන්ගේ ළිඳෙන්
- ආරක්‍ෂිත පොදු ළිඳෙන්
- අනාරක්‍ෂිත පොදු ළිඳෙන්
- පොදු නල මාර්ග වලින්
- ඇල/දොළ/ගංගා/හෝ වෙනත් ක්‍රම මඟින්.

05:04 නිවසේ සිටින සාමාජික සංඛ්‍යාවෙන් උණුකර නිවාගත් ජලය පානය කරන සංඛ්‍යාව : ..........................................................................

5:05 ඉඩමෙහි කුණු දැමීම සඳහා කුණු වලක් ඇත / නැත.

5:06 පොලිතින් / ප්ලාස්ටික් ඉවත දැමීමට වැඩපිළිවෙලක් යොදා ඇත/නැත

5:07 කුඩා ළමුන් හා සාමාජිකයන් ඉතා පිරිසිදුවට/අපිරිසිදුවට/ සිටී.

5:08 නිවස/ගෙවත්ත/මිදුල වටපිටාව ඉතා පිරිසිදුව පවතී.
පිරිසිදුව පවතී / අපිරිසිදුව පවතී.

5:09 නිදන්ගත රෝග හා ආබාධිතයන්.

| | පුද්ගලයාගේ නම | නිදන්ගත රෝගය | ආබාධිතය | ගතව ඇති කාලය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

5:10 පසුගිය වසර තුළ සාමාජිකයන්ට නිතර වැළඳුණු රෝග

| | සාමාජිකයාගේ නම | රෝගය | වැළඳුණු අවස්ථා ගණන |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |

5:11 ආහාර සම්පාදනය හා පෝෂණය
(ගතවූ තෙදින තුළ උදේ, දවල්, රාත්‍රි ආහාරය සඳහා පිළිවෙල කරගත් දේ සඳහන් කරන්න)

| | උදේ | දවල් | රාත්‍රි |
|---|---|---|---|
| ඊයේ | | | |
| පෙරේදා | | | |
| පළමුදා | | | |

5:12 ත්‍රිපෝෂ ලබාගන්නේද ?

1. කා සඳහාද ? ..........

11. ලැබෙන ප්‍රමාණය : ..........

111. ආහාරයට ගන්නා අන්දම : ..........

06. පවුලේ මාසික ආදායම් - වියදම් තත්ත්වයන් පිළිබඳ තොරතුරු



06:01

| අ/අ | ඉපයීම් කාර්යයේ නියැලි අයගේ නම | ප්‍රධාන ආදායම් මාර්ගය | | වෙනත් /අතුරු ආදායම් මාර්ග | | සමෘද්ධි | මහජන ආධාර | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | රැකියාව හෝ ආදායම් මාර්ගය | මාසික ඉපයීම | රැකියාව හෝ ආදායම් මාර්ගය | මාසික ඉපයීම | | | |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |
| 6 | | | | | | | | |
| එකතුව | | | | | | | | |

06 : 02 පවුලේ මාසික වියදම

| වියදම් දරණ කාරණය | වියදම් වූ මුදල |
|---|---|
| ආහාරපාන | |
| බෙහෙත් | |
| ඇඳුම් | |
| අධ්‍යාපන කටයුතු | |
| ගෙවල් කුලී | |
| නිවාස හා වෙනත් ඉදිකිරීම් | |
| ආගමික කටයුතු සඳහා | |
| වන්දනා ගමන් / විනෝද ගමන් | |
| විදුලිය | |
| දර | |
| ගෑස් | |
| භූමිතෙල් | |
| ජලය සඳහා | |
| බුලත් විට / සිගරට් / මත්පැන් | |
| සමිති සමාගම් සඳහා | |
| ණය ගෙවීමට | |
| එකතුව | |

06 : 03 මාසික ආදායම් වියදම් පිළිබඳ ක්‍රමවත් සටහන් තබාගෙන ඇත්ද?

.................................................................................................................

07. ඉඩම / ගෙවත්ත පිළිබඳ තොරතුරු

07:01 දැනට වෙසෙන නිවස පිහිටි ඉඩම් ප්‍රමාණය ..................................................

07:02 එයි අයිතිය, සැමියාට / බිරිඳට / දෙමව්පියන්ට / බැහැර අයෙකුට/රජයට

07:03 කුඹුරු හෝ වෙනත් බැහැර ඉඩම් ඇත්නම් එහි ප්‍රමාණය

.................................................................................................................

07:04 ඉඩමේ වගා කටයුතු

- ❖ අක්‍රමත්ව පවතී.
- ❖ ක්‍රමවත්ව වගාකර ඇත.
- ❖ කොහෙත්ම වගාකර නැත.

07:05 ඉඩමෙන් මාසිකව ලැබෙන ආදායම ..........................................................................

## 08. පවුලේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳ තොරතුරු

08:01

| අ/අ | නම | වයස | ස්ත්‍රී/පුරුෂ භාවය | ඉගෙනුම ලබන වසර | ඉගෙනුම අවසන් කළ වසර හෝ අධ්‍යාපන සුදුසුකම් | අධ්‍යාපනය අඩාල වූයේ නම් ඊට හේතු | ලිවීමට හැකියාව ඇත/නැත | කියවීමට හැකියාව ඇත/නැත |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |
| 6 | | | | | | | | |
| 7 | | | | | | | | |
| 8 | | | | | | | | |

02 ළමුන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ඔවුන් හා එක්ව සොයා බැලීම.

දිනපතා/සතිපතා/මසකට වරක් සිදුවේ

එබඳු විශේෂ සොයා බැලීමක් සිදු නොවේ.

03 දහම් පාසැල් යන ළමුන් සංඛ්‍යාව ..............................................................

04 ආගමික සිරිත් විරිත් සඳහා නිවස තුළ ක්‍රමවත්ව පිරිසිදුව තෙරුවන් නැමදීමට තැනක් පවතිද : ..............................................................................

එය සැලකිල්ලෙන් ඉටු කරන්නක්ද ? ..............................................................................

කළයුතු නිසා කරන්නක්ද ? ..............................................................................

පවුලේ ණය පිළිබඳ තත්ත්වය

| අ/අ | ණයලබාගත් දිනය | ණය ලැබූ කාරණය | මාසික පොලිය | මේවනවිට ගෙවා ඇති මුදල | ගෙවීමට ඇති මුදල | ණය ලැබූ ස්ථානය හෝ පුද්ගලයා |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

10. පවුලේ ඉතුරුම් තත්ත්වයන්

| අ/අ | නම | ස්ත්‍රී/පුරුෂ | බැංකුව/සමිතිය ආයතනය | ඉතුරුම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

11. පවුලේ සාමාජිකයන්ගේ ස්වේච්ඡා සංවිධාන දායකත්වය

| සාමාජිකයාගේ නම | සමිතිය | තනතුර |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

උපැදි අංක 2/13

දැනට පාරිභෝගික ද්‍රව්‍ය ලබාගන්නා අන්දම :

1 නිවාස අසළ වෙළඳ සැලෙන්

සමුපකාරයෙන් - සතොසෙන්

ළඟම නගරයෙන්

2 දිනපතා

සතිපතා

මාසිකව

3 සැමියා සමඟ වැඩිහිටි දරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු පාරිභෝගික ද්‍රව්‍ය ලැයිස්තුව සකස්කර ලබා ගැනේ.

එසේ නොමැතිව, අවශ්‍යතාවය අනුව වරින්වර ලබා ගැනේ.

පාරිභෝජනය සඳහා ගෙවත්තෙන් ඉඩමෙන් ලැබෙන අනුග්‍රහය

| ද්‍රව්‍යය | වටිනාකම (මාසිකව) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| තුව | |

13 නිවසේ පහත සඳහන් මූලික ගෘහ භාණ්ඩ උපකරණ ඇත.

| ගෘහභාණ්ඩ / උපකරණ | දළ වටිනාකම | අයිතිකරුගේ නම |
|---|---|---|
| රන් භාණ්ඩ | | |
| පා පැදිය / යතුරු පැදිය | | |
| ටෙලිවිෂනය | | |
| රේඩියෝව | | |
| අල්මාරි | | |
| සාමාන්‍ය පුටු | | |
| මේස | | |
| ඇඳන් | | |
| සෙටි | | |

සැමියා හා බිරිඳ දෛනිකව ඉටුකරනු ලබන කාර්යයන් උපැදි අංක 2/15

(අලුයම 5 සිට රාත්‍රි 10 දක්වා)

| වේලාව | සැමියා | බිරිඳ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

15. මෙම පවුල් පිළිබඳ සඳහන් කල සුවිශේෂ වූ කරුණු ඇත්නම්.

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| 9 | |
| 10 | |

ක්ෂේත්‍ර සහායකගේ නම : ..............................................................................................

අත්සන : ..............................................................................................

දිනය : ..............................................................

ත කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩසටහන

ද විසින් පිරවිය යුතු ආකෘතිය පත්‍රය

කරුණාකර ඔබේ සැමියාගේ වඩාත් යහපත් ගුණාංග පහක් ලියන්න.

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

කරුණාකර ඔබේ සැමියාගේ වැරදි / අඩුපාඩු පහක් ලියන්න

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

උපැදි අංක 4

<u>ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන වැඩසටහන</u>

<u>සැමියා විසින් පිරිවිය යුතු ආකෘති පත්‍රය.</u>

01. කරුණාකර ඔබේ බිරිඳගේ යහපත් ගුණාංග පහක් ලියන්න.

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

02. කරුණාකර ඔබේ බිරිඳගේ වැරදි / අඩුපාඩු පහක් ලියන්න.

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

මිල : රු. 375.00

ISBN 955-8225-04-5